
සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2557ක් වූ වෙසක් මස (ව්‍යවහාරික වර්ෂ 2013 මැයි)

19 වෙනි කලාපය

## අරුත් සැඟව ගිය
## ආමිස සහ ප්‍රතිපත්ති පූජාව
## නිවැරදි දහම් ඇසින්...




සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

# හොඳ නොහොඳ...







පව් හරි දහම් යැයි සම් දිටු අය     නොගති
සිවු අරි දහම් දුටු විට නොම යයි     දුගති
දෙව් බඹ මිනිස් ලොව පමණක් ඇති     සුගති
සව් සත වෙතට සුව දෙන දම් කඳ     නගති

විල මඩ වුවත් පිපෙනා නෙළුමෙහි     සුවඳ
එල වෙයි දසත හමනා සුළඟින්     නිබඳ
කල කිම වුවත් මහතුන්ගේ ගුණ     නොමඳ
සැල වෙයි එක ලෙසට ලොව තිබුණද     නොහොඳ

පවතින හොඳ නොහොඳ දෙක ලොව හැම     දාම
නවතින දෙයක් නොව පවතින කල     සැම
ලොව දන පහසුවෙන් නොහොඳට යොමු     වීම
නොව අරුමයක් සිරිතකි හැම කල     දීම

අරහත් ගුණ වැඩූ උතුමන් හැරුණු     විට
විරසක් නොමැති කිසිවෙක් ලොව නොමැත     සිට
තරහක් ගෙන අනුන් ගැන සිතූ විටදී     ගැට
සැරයක් නොව දහස් වර පැටලෙනව     පොට

නොහොඳ සියක් අතරේ ඇති එක්     හොඳක
බොහොඳ වටිනකම් තියෙනා බව     නොදැක
වහද සියක් නොහොඳින් හොඳ ලෙස     ගඳක
පැහැද දෙයක් ගත නොහැකිය හොඳ     බිඳක

බොර දිය නොකලතා පෑ දිය ගෙන     බීම
දුර නැණ ඇති අයට ඇත හැම තැන     දීම
නරකද හොඳද යන දෙක වෙන් කර     ලීම
දොර ඇර තබයි ලබනට මතු     සැනසීම

පබැඳුම - නිහිඳු චන්දන සිරිවර්ධන

# බොදුනුවන්ට පහළ වන සද්ධා, සීල, සෘත, ත්‍යාග, ප්‍රඥා නිධානය

(පසුගිය කලාපයෙන් - බොදුනුවන්ට පහළ වන සද්ධා නිධානය)



බුදුන්, දහම්, සඟුන් කෙරෙහි සද්ධාවෙන් තිසරණයේ පිහිටි උපාසකයාගේ හෝ උපාසිකාවගේ සීලය ''යතෝ බෝ මහානාම උපාසකෝ'' පාණාතිපාතා පටිවිරතෝහෝති, අදින්නාදානා පටිවිරතෝහෝති... සුරාමේරය මජ්ජපමාදට්ඨානා පටිවිරතෝ හෝති, එත්තාවතා බෝ මහානාම උපාසකෝ සීලවා හෝති...'' ආදී වශයෙන්, අං. නි. (5) 120 පිටුවේ එන <u>මහානාම සූත්‍රයේ</u> සඳහන් වෙනවා. ඒ වගේම අං.නි. (4) 266 පිටුවේ එන <u>විත්ථක ධන සූත්‍රයේ</u> කතමඤ්ච භික්ඛවේ සීල ධනං.... ආදී පෙළ දහමේත් සීල ධනය විස්තර කරල තියෙන්නේ පාණාතිපාතා පටිවිරතෝ හෝති.... ආදී වශයෙන්. ඒ වගේම අං.නි. (5) <u>ජීවක සූත්‍රය</u>, අං.නි. (3) <u>ගිහි සූත්‍රය</u>, අං.නි. (5) <u>ව්‍යග්සපජ්ජ සූත්‍රය</u> ආදී බොහෝ සූත්‍රවලත් සෝතාපන්න ආර්ය ශ්‍රාවකයාගේ සීලය, පාණාතිපාතා පටිවිරතෝ හෝති.....'' ආදී වශයෙන් දේශනා කරල තියෙනවා. නමුත් අද ආර්ය ශ්‍රාවකයාගේ සීලය කියල අපට දැනගන්න තියෙන්නෙ ''පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි .... '' ආදී පංච ශික්ෂා පදයි.

වේරමණී කියන පදයේ තේරුමත්, පටිවිරතෝහෝති කියන පදයේ තේරුමත් එක සමාන නම්, බුදුපියාණන් වහන්සේ දෙආකාරයකට දේශනා කරන්නෙ නෑ. ඇයි? බුද්ධ දේශනාව සර්වාකාරයෙන් පරිපූර්ණයි. ශික්ෂා පදයක් සමාදන් වීමෙන් කියන්නෙ, ඒ ශික්ෂා පදයෙන් කියවෙන දේට අනුව හික්මිලා ඉන්නව කියල අධිෂ්ඨාන කරගෙන කිසියම් නිශ්චිත කාලයක් හික්මිලා ඉන්න එකටයි. නමුත් වේරමණී .... ආදී වශයෙන් කියන සිල් පදයේ තේරුම, සතුන් මැරීමෙන් වැලකී සිටීම කියල පටු අදහසක් තමයි අද දැනගන්න තියෙන්නෙ. නමුත් සතුන් මැරීමේ හෝ මැරවීමේ හෝ සෘජු චේතනාවක් නොතිබුණත්, වෙනත් යම් ක්‍රියාවක් හෝ වචනයක් හෝ හේතුවෙන් සතුන් මැරෙන බව දන්නව නම් මේ සිල් පදය රකින තැනැත්තා ඒ ක්‍රියාව නොකළ යුතුයි, ඒ වචනය නොකිය යුතුයි. මේ සිල් පදයේ තේරුම නවාංග <u>උපෝසථ සූත්‍රයේ</u> දක්වල තියෙන්නෙ, ''ජීවිතාන්තය දක්වා ඒ අරිහතුන් වහන්සේ පර පණ නැසීමෙන් වෙන්ව, පර පණ නැසීම අතහැර, බහා තැබූ දඬු මුගුරු ඇතිව, බහා තැබූ දැල් උගුල් ආයුධ ඇතිව, පාපයට බිය ඇතිව ලජ්ජා ඇතිව, දයාවට පැමිණ, සියලු ලෝ සතුන් කෙරෙහි හිතානුකම්පාවෙන් වාසය කරන්නේය.....'' කියලයි. සාමාන්‍ය ගිහි ශ්‍රාවකයෙකුට ''ජීවිතය ගියත් සතෙක් මරන්නෙ, හිංසා කරන්නෙ නෑ....'' කියන ශුද්ධ ජීවිතයක් ගත කරන්න බෑ. බැරි දෙයක් කරන්න බුදුපියාණන් වහන්සේ දේශනා කරන්නෙත් නෑ.

වී ටිකක් වපුරන්න ගියත් ආයුධ පාවිච්චි කරන්න වෙනවා. සත්තු මැරෙන්නත් පුළුවන්. නමුත් පටිවිරතෝ හෝති කියන්නෙ සත්තු මරන්න හිංසා කරන්න කැමැත්තක් නෑ කියන එකයි. ''පටි'' කියන්නෙ බැඳෙනවා, රති කියන්නෙ කැමතියි කියන එකයි. විරති කියන්නෙ කැමති නෑ කියන එක. ඒ අනුව පටි විරතෝහෝති කියන්නෙ, (අකුසල්) කරන්න කැමැත්තෙන් බැඳෙන්නෙ නෑ කියන එකයි. මරන්න කැමති නැති වුනාට මැරෙන්න පුළුවන්. මේ කාරණා දෙකේ වෙනසක් තියෙනවා. ඒ නිසා **සෝතාපන්න ආර්ය ශ්‍රාවකයාගේ සීලය, ජීවිතය ගියත් සතෙක් මරන්නෙ නෑ කියන තරම් ගැඹුරු එකක් නෙවෙයි. අපි ජීවත් වෙන මේ සමාජය තුළ කරන කියන හැමදේම කරන්නෙ කියන්නෙ කැමැත්තෙන්ම නෙවෙයි. සමහර දේවල් කරන්නෙ නොකර බැරි කමට.** උදාහරණයක් ගත්තොත් රැකියාවකට යන කාන්තාවක් උදේ 4 ට 5 ට විතර නැගිටින්න ඕන. කෑම බීම සකස් කරල, මුල් බැඳල, නැත්නම් කෑම පෙට්ටිවල දමල ළමයින්ට, ස්වාමියාට, තමන්ට ගෙනියන්න පුළුවන් විදියට පිළියෙල කරන්න ඕන. නමුත් ඇය කැමති නැත්ද ටිකක් දවල් වෙනතුරු නිදාගන්න? කැමති වුනාට කැමැත්තට අනුව කටයුතු කළොත් රැකියාවත් නෑ. මාසෙ අන්තිමට වැටුපකුත් නෑ. ඉතින් අකමැති වුනත් උදේ පාන්දර නැගිටිනවා.

මෙන්න මේ වගේ, ගේ දොර පිරිසිදු කරන්න ඕන නිසා පිස දමනවා, මකුළු දැල් කඩනවා. එතැනදී බිත්ති මකුණන් වගේ සත්තු පොඩිවෙලා මැරෙන්න පුළුවන්. නමුත් සත්තු මැරීම කැමැත්තෙන් කරන්නෙ නෑ. හැබැයි මැරෙනවට කරන්න දෙයක් නෑ. අන්න ඒ විදියට කැමැත්තෙන් පස් පව් කරන්නෙ නෑ කියන එකයි සෝතාපන්න ආර්ය ශ්‍රාවකයාගේ සීලය හැටියට බුදුන් වහන්සේ දේශනා කරල තියෙන්නෙ. ☞

සතුන් මැරීම ආදිය දුෂ්චරිතයක්, නොකළ යුත්තක් කියල නුවණින් වටහා ගත්තු කෙනෙකුටයි මේ සීලය පිහිටන්නෙ. මේක සමාදන් වෙන එකක් නෙවෙයි. කවුරුවත් කියපු නිසා හෝ පොතක පතක තිබුණ නිසා හෝ ගත්තු තීරණයක් නෙවෙයි. හෘද සාක්ෂියට එකඟව සතුන් මැරීම වැරදි ක්‍රියාවක් කියල පිළිගත්ත නිසයි. පෙර ආත්මයක් තිබුණද, මතු ආත්මයක් තියෙනවද කියන මේ කිසිම කාරණයක් මෙතනදී වැදගත් නෑ. ඒව තිබුණත් නැතත් පස් පව් කියන්නෙ දුෂ්චරිත, නොකටයුතු පාප ක්‍රියා කියල දැනගෙන, ඒ නිසා ඒව කරන්නෙ නෑ.

මෙන්න මේ විදියට සද්ධාවෙන් තිසරණයේ පිහිටා කටයුතු කරන සෝතාපන්න ආර්ය ශ්‍රාවකයාට, ''පාණාතිපාතා පටිවිරතෝ-හෝති .... ආදී වශයෙන් දක්වූ සංවරත්වයේ පිහිටීම හේතුවෙන් පහාන සීලං, වේරමණී සීලං, චේතනා සීලං, සංවර සීලං, අවිතික්කම සීලං කියන අඛිද්‍ර, අසබල, අකල්මාස (කිළිටි නොවූ) පංච සීලයක් පිහිටනවා. **මේ කයත් අසාර නම්, ගෝචර වෙන රූපාදී අරමුණුත් අසාර නම් කැමති හැටියට පවත්වාගෙන ආස්වාද විඳින්න බැරි ලෝකයෙන්, අන්‍ය ලෝක සත්වයාට හිංසා පීඩා කරල මොන ආස්වාදයක් ලබන්නද? අන්සතු දේවල් පැහැර ගෙන, කාම මිත්‍යාචාර කරල, බොරුවෙන් අනුන් මුලා කරල තමන්ට මොන යහපතක් කරගන්නද?** මෙහෙම හිතල ලෝකය අනිච්ච, දුක්ඛ, අනත්ත බව වටහාගෙන සතර අපාගත වීමට හේතු වන්නා වූ පාපයන් කිරීමේ කැමැත්ත පහවුනා නම් පහවුනාමයි. නැවතත් ඒවා කරන්න කැමැත්තක් එන්නෙ නෑ. මේ පහවීම පහාන සීලයයි. ඉහත කී සතර අපාගත වීමට හේතු වන පාප ධර්මයන් රමණය නොකිරීම වේරමණී සීලයයි. වේරමණී සීලය ගැන මේ ටිකත් දැනගන්න ඕන. ජීවිතය පවත්වාගෙන යන්න උවමනා දේ රැස් නොකරනවා නෙවෙයි. ඒවා රැස්කරන්නෙ ජීවිතය පවත්වාගෙන යන්න උවමනා නිසා මිසක්, මට මේ දේ තියෙනවා කියල උද්දාමයෙන් ආස්වාද විඳින්න නෙවෙයි. පෙර කරන ලද කුසල් ඇත්නම් බොහෝ සම්පත් ලැබෙන්න පුළුවන්. නමුත් ඒවා ගැන උද්දාමයක් නෑ. තියෙන නිසා පරිහරණය කරනවා.

ඒ වගේම සතර අපාගත වීමට හේතු වන්නා වූ පස් පව් කරන්න චේතනා පහළ වෙන්නෙ නෑ. මේ චේතනා සීලයයි. එබඳු දුෂ්චරිත කටයුතු සඳහා කය, වචනය ක්‍රියාත්මක කරන්නෙ නෑ. මේ සංවර සීලයයි. ලෝකය අනිච්ච, දුක්ඛ, අනත්ත බවත්, ආස්වාද මායාකාරී බවත්, ඒවායේ ආදීනවයත් යථා භූතයෙන් දැකල ගත්තු තීරණයක් නිසා මේ සීලය කවදාවත් කැඩෙන්නෙ, බිඳෙන්නෙ, සිදුරු වෙන්නෙ නෑ. මේ අවිතික්කම සීලයයි. මේ පංච සීලය හේතුවෙන් ඒ තැනැත්තා භය පහකින්, වෛර පහකින් මිදීමක් ලබනව කියල ධර්මයේ සඳහන් වෙනවා. සතුන් මරන්න කැමති නැත්නම්, ඔහු සියලු සතුන්ට අභය දානය දෙන කෙනෙක්. අ් + භය = අභය, භය නැති බව දෙනවා කියන එකයි අභය දානය කියන්නෙ. ඔහු නිසා තමන්ගෙ ජීවිතයට හිංසාවක්, මරණයක් සිදු වේවි කියල කිසිවෙක් බිය වෙන්න ඕන නෑ. අනුන්ට මරණ භය ඇති නොකරන හේතුවෙන්, තමන්ට මරණ භය ඇති වෙන්නෙ නෑ. තමන් අන් සතුන්ට වෛර නොකරන හේතුවෙන් අන් සතුන්ගෙන් තමන්ට වෛරයක් ඇති වෙන්නෙ නෑ. මේ විදියට පාණාතිපාතා පටිවිරතෝ හෝති ..... ආදී වශයෙන් දක්වූ සීලයෙන් කය, වචනය සංවර කරගත් තැනැත්තා පංච දුෂ්චරිතය මුල් කරගෙන සිද්ධ වෙන වෛර පහකින්, භය පහකින් මිදෙනවා. මේ සීලය පූර්ණ වෙන්නෙ අරිහත්වයෙන්. සීලය වැඩුන ප්‍රමාණයටයි ප්‍රතිඵල ලැබෙන්නෙ. නිවන් දක්නා මොහොත දක්වා යම් කෙනෙකුට තමන්ගෙ ජීවිතය ගැන, වස්තුව ගැන, සැප සම්පත් ගැන, තමන් ඇසුරු කරන අය අතරේ සමගිය ගැන, නුමුලාව (මුලා නොවී), සිහි ඇතිව ජීවිතය පවත්වා ගන්න හැකිවීම ගැන බයක් සැකයක් නැතුව ඉන්න පුළුවන් නම්, ඔහු හෝ ඇය මොන තරම් වාසනාවන්තයෙක්ද කියන එක හිතල බලන්න. මේ ලෝකයේ මහන්සියෙන් හරි හම්බකරගත් ධනය, ගේ දොර, ඉඩ කඩම් ආදියේත්, අඹු දරුවන්ගේත් ආරක්ෂාව පිළිබඳව මිනිස්සු මොන තරම් වෙහෙසෙනවද? ධනය වැය කරනවද? නමුත් කය, වචනය සංවර කරගත් තැනැත්තා ඒ සීල ධනය හේතුවෙන් වෛර පහකින්, භය පහකින් සදහටම මිදීමේ මහා ධන නිධානය ලබනවා.

හිරි කියන්නෙ පවට ලජ්ජා ඇති බව. පවට ලජ්ජා ඇත්නම්, යම් පාප කර්මයක් කරන්න සිදුවුනොත්..... කවදා නමුත් මට මේ හේතුවෙන් නින්දා අපහාස විඳින්න වෙයි, මගේ ගුරු දෙමාපිය, ඥාති හිත මිතුරන්ට, ඔබේ අසවලා මෙබඳු දෙයක් කරල.... කියල නින්දා අපහාස විඳින්න වෙයි, ඒ අය මට චෝදනා කරාවි .... කියල ලජ්ජාවට බියෙන් පව් කිරීම අත් හරිනවා. කවුරු මොනව කිව්වත් මට මොකද? මම කැමති දේ මම කරනවා කියල ලජ්ජාව ගණන් නොගෙන පව් කරන තැනැත්තා මෙලොවදී නින්දා අපහාස විඳිනවා. පරලොව දුගතියට යනවා. එහි දුක් විපාක විඳිනවා. ඒ නිසා පවට ලජ්ජා ඇති බව කියන්නේ නින්දා අපහාස, දුක් විපාක, දුගති විපාක විඳීමෙන් මිදෙන්න පුළුවන් මහා ධනයක්.

ඔත්තප්පය කියන්නෙ පවට බය ඇති බව. යම් අකුසලයක් කරන්න සිද්ධ වුනොත්, තමා හැදූ වැඩූ, ශිල්ප ඉගැන්වූ වැඩිහිටි ගුරු දෙමව්පියන්, නෑ හිත මිතුරන් සිහි වෙනවා. මම වගේ කෙනෙක් මෙවැනි නොකටයුතු දෙයක් කළොත්, ඒ අයට අගෞරවයක්, නින්දාවක්, හොඳ නමට කැළලක් වේවි කියල පවට බිය වෙනවා. හොරකම වගේ පවක් කළොත් නඩු හබ ඇති වේවි, හිරේ යන්න වේවි. කාමයෙහි වැරදි ලෙස හැසිරුනොත් නින්දා අපහාස අහන්නත්, රෝග පීඩා විඳින්නත් සිද්ධ වේවි. මේ විදියට පාපයේ පසු විපාක සිහිකරමින් පවට බිය වෙනවා. මේ ගති ලක්ෂණය ඔත්තප්පයයි. හිරි ඔත්තප්ප හෙවත් ලජ්ජා බය නැතිනම් ඕනම පවක් කරන්න පුළුවන්. එසේ කිරීමෙන් මෙලොවදී ධනයෙන්, සෞඛ්‍යයෙන්, නෑ හිත මිතුරන්ගෙන් පිරිහීමත්, මුලාව නිසා පරලොව දුගතියත් උරුම වෙනවා. එහෙනම් හිරි ඔත්තප්ප කියන්නෙ මෙලොව පරලොව අභිවෘද්ධිය සලසන ධන නිධානයක්.

සුත ධනය කියන්නෙ මුල යහපත්, මැද යහපත්, අග යහපත් අර්ථ සහිත වූ, ව්‍යංජන සහිත වූ, සර්වාකාරයෙන් පරිපූර්ණ වූ, පාරිසුද්ධ වූ බ්‍රහ්ම චරියාව දැන ගැනීමයි. සුත යන්නට ඇසූ යන අර්ථයත් තියෙනවා. ඒ වගේම සුචරිත ගුණයේ පිහිටි යන අර්ථයත් තියෙනවා. ඒ අනුව ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කිරීමෙන්, බ්‍රහ්ම චරියාව දැන ගැනීම සිදුවිය යුතුයි. ඒ බ්‍රහ්ම චරියාව දැනගෙන, ඉගෙන ගෙන ධාරණය කරගෙන, නැවත නැවත ඒ බ්‍රහ්ම චරියාවේ යෙදෙමින් මෙනෙහි කරමින් මනාව පුහුණු කිරීමෙන්, ලෝකය අනිච්චයි, දුක්ඛයි, අනත්තයි කියල වටහා ගැනීමේ යෙදීම බ්‍රහ්ම චරියාවයි.

''ආදි කල්‍යාණං ....'' කිව්වෙ මුල යහපත් කියන එකයි. කල්‍යාණ (කලණ) කියන්නෙ කලු දහම් නසනවා කියන එකයි. දස අකුසල් තමයි කලු දහම්. බුදු බණ අහල පැහැදිලා දන් හොඳ වෙලා හිටියට, අපි හිතාගෙන ඉන්නෙ නම් අනන්ත සසරෙ හැමදාමත් අපි මෙහෙම හොඳවෙලා හිටපු අයම තමයි කියල. නමුත් අනන්ත සසරේ අපි වැඩියෙන්ම කරල තියෙන්නෙ කලු දහම්. ඉතින් ඒ කලු දහම් නසන මග කියා දෙන උත්තම පිරිස තමයි කල්‍යාණ

මිත්‍රයො. එහෙමනම් ඒ දේශනා කරන ධර්මය ආදි කල්‍යාණයි. මුල යහපත්. මේ වර්තමාන කාලයේදිත් අපට කලු දහම් - දස අකුසල් අත් හැරල, දස අකුසලයෙන් වෙන්වෙලා සුචරිතව ජීවත් වෙන මග දේශනා කරන්නෙත් මේ කල්‍යාණ මිත්‍ර පිරිසයි. එහෙම නම් ඒ ධර්මය මජ්ජෙ කල්‍යාණයි, මැද යහපත්. මේ සසර දුකෙන් මිදෙන, නිවන් අවබෝධ කරගන්නා මග දේශනා කරන්නෙත් මේ කල්‍යාණ මිත්‍ර පිරිසයි. එහෙම නම් ඒ ධර්මය පරියෝසාන කල්‍යාණයි, අග යහපත්. අර්ථය මොකක්ද, අනර්ථය මොකක්ද කියලත් අපි දැනගන්න ඕන. ඒ වගේම අවිද්‍යාව නමැති මුලත්, සංඛාර - විඤ්ඤාණ....... තණ්හා - උපාදාන - භව - ජාති ආදී මැදත්, ජරා - මරණ නම් අගත් නිරෝධ කරන නිසා මුල, මැද, අග යහපත් වෙනවා.



සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය...... සම්මා ඥාණය, සම්මා විමුක්තිය ධර්මය හා අර්ථයයි. මිච්චා දිට්ඨිය, මිච්චා සංකප්පය..... මිච්චා ඥාණය, මිච්චා විමුක්තිය අධර්මය හා අනර්ථයයි. (අං. නි. (6), 403 පිටුව දුතිය අධම්ම සූත්‍රය) එහෙම නම් ලෝකෝත්තර අරි අටඟි මග නම් වූ ධර්මය අපට මුල යහපත්, මැද යහපත්, අග යහපත්, අර්ථ සහිත වූ දහමක් කියන එක පැහැදිලියි. මේ දහම් මග අනුගමනය කරන්නාට, මෙලොව යහපත, පරලොව සුගතිය, නිවන කියන තුන් අභිවෘද්ධියම සැලසෙනවා. සර්වාකාරයෙන් පරිසුද්ධ වූ කියන්නෙ, නිවන කියන පරමාර්ථය දක්වාම සුද්ධ වීමේ පර තෙරටම යන නිසයි. නිවන දකින්නෙ මේ අත්බැව තුළමයි. ඒ නිසා අරිහතුන් වහන්සේගේ චරියාවටත් බ්‍රහ්ම චරියාව කියල කියන්න පුළුවන්. රහතන් වහන්සේට නමක් තමයි බ්‍රහ්ම කියන්නෙ. මානය අළු කර දැමූ (බහ + මන) කියන අර්ථයෙන් බ්‍රහ්ම කියනවා. උන්වහන්සේගේ චරියාව තමයි, බහා තැබූ දඬු මුගුරු ඇතිව, බහා තැබූ දූල් උගුල් ආයුධ ඇතිව, පාපයට බිය ඇතිව, පාපයට ලජ්ජා ඇතිව, දයාවට පැමිණ සියලු ලෝ සතුන් කෙරෙහි හිතානුකම්පාවෙන් වාසය කරන්නේය..... ආදී වශයෙන් නවාංග උපෝසථ සූත්‍රයේ විග්‍රහ කරල තියෙන ආකාරයට සිල් ගුණයේ අඛණ්ඩව පිහිටමින් දෙවි මිනිසුන් සහිත ලෝකයාට හිතසුව පිණිස පිරිනිවීම දක්වා ජීවිතය පවත්වාගෙන යාම.

බ්‍රහ්ම නමින් දේව කොට්ඨාශයකුත් ඉන්නවා. කාමයන්ගේ ආදීනව දැක, කාම ලෝක කෙරෙහි කලකිරී, කාම ලෝකවලින් මිදී ජීවත් වෙන්න ඇත්නම් කියන මානසිකත්වය ඇතුව බණ භාවනා කරන පින්වතුන් උපදින සුගති ලෝක තියෙනවා. ඒ වගේම නිවන අරමුණු කරගෙන භාවනා කළත්, ඒ මාර්ගය පූර්ණ කර ගැනීමට පෙර ජීවිත කාලය අවසන් වූ පින්වතුන්ද උපදින සුගති ලෝක තියෙනවා. ඒ ඒ සුගති ලෝකවල උපදින අයටත් බ්‍රහ්ම කියනවා. ඒ නම නිසා ඒ අයගේ චරියාවටත් බ්‍රහ්ම චරියාව කියල කියන්න වෙනවා. නමුත් සර්වාකාරයෙන් පරිපූර්ණ වූ පාරිසුද්ධ වූ බ්‍රහ්ම චරියාව කියන්නෙ ලෝකෝත්තර අරි අටඟි මගයි. (සං. නි. 5 (1) කුක්කුඨාරාම සූත්‍රය) ජාති, ජරා, මරණ ..... ආදී සියලු දුකෙන් නිදහස් වන ඒ ලෝකෝත්තර අරි අටඟි මග දැන ගැනීම සුත ධනයයි. සියලු දුකෙන් නිදහස් වීමේ මහා ධන නිධානය සුත ධනයෙන් ලැබෙනවා.

චාග ධනය කියන්නෙ, දුරු වූ මසුරු මළ ඇති සිතින්, නිවන කැමතිව, මිදු (යමක් දුන්නට පසු නැවත අල්ලා නොගත්) ත්‍යාග ඇත්තේ, දෙනුවට (දෙන අයට) දෙවිඅත් (සුද්ධ ඇතිව පිරිසිදු දැතින්ම දෙන) ඇතියේ පිදීමෙහි ඇලුනේ, යදනට (ඉල්ලීමට යැදීමට සුදුසු) නිසි වූයේ, දානයෙහිත් සංවිභාගයෙහිත් ඇලුනේ ගිහි ගෙයි වෙසෙයි යනුවෙන් විස්තර වෙනවා. (අං.නි. (4), 286 පිටුව - විත්ථක ධන සූත්‍රය) මේ ලෝකෙ අපි කැමති හැම දේටම අපේ හිත තදින් බැඳිලයි තියෙන්නෙ. මේ අල්ලගෙන ඉන්න දේවල් මුදාහැරීම චාගයයි. දානය, හොඳට දැත සෝදගෙන දෝතින්ම දුන්නත්, දාන වස්තුව පිළිබඳ හිතේ අල්ලගෙන ඉඳීම මුදා හැරියෙ නැත්නම් ඒක චාගයක් වෙන්නෙ නෑ. සමහර කෙනෙක් දෙන්න කැමති වුනත්, දෙන්න තරම් ධනයක් දාන වස්තුවක් නෑ. නමුත් දන් දෙන අය දැකල සිත සතුටු කර ගන්නවා. තවත් සමහර අයට දෙන්න බොහෝ වස්තුව තියෙනවා. නමුත් දෙන්න හිතක් නෑ. අන්න ඒ හිතට කියන්නෙ මසුරු මළ ඇති හිතක් කියල. දෙවියෝ දෙවි වෙලා ඉන්නෙ, මිනිසත්ව ඉඳිත්දි විවිධාකාරයෙන් අන් අයට ප්‍රයෝජන වෙන දේවල් දන් දීමෙන්. දන් දීමෙන් අපමණ සැප ලැබූ දෙවියන්, දැනුත් දන් දීමට අවස්ථාවක් ලැබෙන මොහොතක් බල බලා ඉන්නවා. අපිත් මෙන්න මේ වගේ මහත් ඵල ලැබෙන දානයක් දෙන්න අවස්ථාවක් බල බලා ඉන්නව නම් ''දෙවි අත් ඇති'' කියල කියනවා. දානයක් දුන් පසුවත් තමන්ට මහත් වූ ලාභයක් ලැබුණ කියල සතුටු වෙනවා. මෙන්න මේකට දානසංවිභාග කියල කියනවා. බුදුපියාණන් වහන්සේටත්, ආර්ය මහා සංඝරත්නයටත් දෙන දානය මහත් ඵලයි, මහානිසංසයි. මෙන්න මේ විදියට දන් දීමට, පුන පුනා දන් **දීමට අවස්ථාවක් බල බලා, සුදුසු පිරිසිදු දාන වස්තුවක් සපයා ගෙන, මසුරු මළ නැතිවම දානය දීල, දීමෙන් පසු මනා ලාභයක් ලැබුවෙමි යි කියල ඒ ගැන සතුටුවීම කියන ගුණාංගවලින් යුක්තව දන් දීම චාග ධනයයි. මේ චාග ධනය නිවන දක්වාම අග හිඟයක් නැතිව සුවසේ දිවි ගෙවන්න සම්පත් ළඟා කර දෙන ධන නිධානයක්.**

ජරා, මරණ, සෝක, පරිදේව .... ආදී උපන් සත්වයාට හිමි සියලු දුක් ක්‍ෂය කිරීම සුවයි. මේ සියලු දුක් උපදින්නේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන පංච උපාදානස්කන්ධයට ඇලුම් කරන හේතුව නිසයි. ඇලුම් කරන්නේ එය වටිනවා කියන අවිද්‍යාව නිසයි. පටිච්ච සමුප්පාද ධර්මය තේරුම් ගෙන, ඒ අවිද්‍යාවත් තණ්හාවත් දුරු කරන මාර්ගය, පාරිසුද්ධ වූ මතු සඳහන් කළ බ්‍රහ්ම චරියාව හෙවත් අරි අටඟි මග බව අවබෝධ කර ගැනීම ආර්ය ප්‍රඥාවයි. මෙන්න මේ ආර්ය ප්‍රඥාව ලැබීමට පඤ්ඤා ධනං කියල කියනවා. මේ පඤ්ඤා ධනය මගින් සියලු දුකෙන් නිදහස් වීම සිදු කරන නිසා ධන නිධානයක් වෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ඩබ්. ඒ. තිළිණවතී**
**(විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී )**
**කඩවත**

# දේව රැකවරණයට හා සශ්‍රීකත්වයට මනුස්ස ගති සිරිත් බලපාන හැටි

*(පසුගිය කලාපයෙන් - ආදි පැරැණ්නන් දහමට අනුව ගොවිතැන් කර පෙරදිග ධාන්‍යාගාරය ගොඩ නැගූ හැටි...)*

දෙවියන්ගේ ආරක්‍ෂාව මනුස්සයන්ට ලැබෙන ආකාරයත්, මනුස්සයන්ගේ ගති සිරිත් දූෂ්‍ය වෙන කොට ඒ දේව රැකවරණය නොලැබී නොයෙක් විපත් ඇතිවන ආකාරයත්, අපේ පැරැන්නන් දහමට අනුව ජීවත් වෙලා යහපත් ගති සිරිත් වඩා සශ්‍රීකත්වය ලබාගත් ආකාරයත් ඇතුලුව තවත් සැඟව ගිය දහම් කාරණා කිහිපයක් තමයි මේ හෙලිදරව් කරන්නේ.

විශේෂයෙන් දෙවි දේවතාවන් ගැන කතා කරන කොට ලෝක පාලක දෙවි දේවතාවන් කියන්නේ නිකන්ම ඉන්න පිරිසක් නෙවෙයි. ඒ අයගේ විශේෂත්වයක් තියෙනවා. **මනුස්සයන්ගේ යහපතට විරුද්ධ වන්නා වූ අමනුස්සයන්, යක්‍ෂයන් ආදී කොටස් වෙන් කරල බැඳ තබල, මනුස්සයන්ට කරුණාව දක්වල යහපත් විදියට ජීවත් වෙන්න මග සලසා දෙන උදවියක් තමයි මේ දෙවි දේවතාවන් කියන්නේ.** දේවතාවෝ දේව නිගමන අනුව යම් යම් දරුණු අමනුස්ස, යක්‍ෂ කොට්ඨාශවලට නීති පනවල, අනුන්ට හිංගි හිංසා කරන්න ඉඩ නොදී, ඒ අය වෙන් කරල තියෙන ක්‍රමයක් තියෙනවා. ඒක මනුස්සයන් කෙරෙහි කරුණාවෙන් කරන ක්‍රියාවක්. හැබැයි එහෙම කරුණාවෙන් ක්‍රියා කරන්නේ යහපත් මනුස්සයන්ට විතරයි. මනුස්සයන් යහපත් විදියට ඉන්න තාක් ඒ ආශිර්වාදය, රැකවරණය ලැබෙනවා. මනුස්සයන් අසත් පුරුෂ වුණාම දෙවියන් ඒ රැකවරණය අත්හරිනවා. එතකොට අර බැඳගත් දරුණු යක්‍ෂයන් අමනුස්සයන් පවා, උඹලට ඕන දෙයක් කරගනින් කියල ලිහල අතහරිනවා. උදාහරණයකින් පහදනව නම්, යම් රජයක් මිනිස්සුන්ගෙ යහපතට නීතියක් පනවන කොට ඒ නීතිය ඔක්කොම මිනිස්සු කඩකරනව නම්, රජය ඒ නීතිය ගණන් නොගෙන අතහැර හිටියොත් මොකද වෙන්නෙ? එතකොට අර සමාජයට හිංගි හිංසා කරන්න බලාගෙන හිටපු දාමරිකයන්ට රැකුලක් වෙනවා. ඒ වගේ අයුතු පුද්ගලයන් අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නවා. මේ වගේ දේව අධිකරණයෙන්, දේව නීතිය නොසලකා නිදහස් කළොත්, අතහැර දම්මොත් අර දරුණු යක්‍ෂයන්, අමනුස්සයන් තම හිතු මනාපෙට කටයුතු කරන්න පටන් ගන්නවා.

ආකාසගත දේවතාවන් වගේම මිනිස් ලෝකය ආශ්‍රිත විමාන සහිත වෘක්ෂ දේවතාදී කොට්ඨාශත් ඉන්නවා. ඒවායේ ඔවුන්ගේ විමන් පිහිටල තියෙනවා. **මිනිස්සු අසත් පුරුෂ කටයුතුවල යෙදෙන කොට විස කිරණ විශ්වයට ක්‍රියාත්මක වෙලා, වායුගෝලයේ සුළි සුළං ආදිය ඇතිවෙලා කැලඹෙන්න පටන් ගන්නවා. මේ සුළි සුළං**



**නොයෙක් ආකාරයෙන් විකෘති විදියට හමන කොට දේවතා විමන් හරහාත් ගමන් කරල ඒවත් කැලඹෙනවා. එතකොට දෙවි දේවතාවන් තීරණයක් ගන්නවා.** මේ මිනිස්සු කරන අසත් පුරුෂ වැඩ නිසා අපටත් ඉන්න විදියක් නෑ, මේ වගේ අසත් පුරුෂයන්ට රැකවල් දීල මොකටද කියල, නියෝග දාල හිර කරල හිටපු යක්‍ෂ, අමනුස්සයන් මුදාහරිනවා. මුදාහැරපු ගමන්ම තමන්ගෙ වැඩය කරගන්න බලාගෙන හිටපු යක්‍ෂ, අමනුස්සයන් අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නවා. මොකද මේ අමනුස්සයන්, යකුන් කියන්නෙත් කවදා හෝ මනුස්සයන් වෙලා අපිත් එක්ක එකට හිටපු උදවියමයි. නමුත් යම් පාපී ක්‍රියාවන්, වෛර කිරීම් ආදිය නිසා පලිගන්න පුළුවන් අත්බැව්වල උප්පත්ති ලබනවා. එවැනි යක්‍ෂයන්, අමනුස්සයන් ආදීන්ට දරුණු හිංගි හිංසා කිරීමේ ඕනකම තිබුණත්, දෙවියන්ගේ රැකවරණය නිසා එවැනි කටයුතු කරන්න බැරිව ඉන්නවා. දෙවි දේවතාවුන් ඒ රැකවරණවලින් ඉවත් වුණොත්, උන්ගෙ බලාපොරොත්තු ඉටු කර ගන්න ඒ සැඩ යකුන්, අමනුස්සයන් ඇවිත් මිනිස්සුන්ට ආවේශ වෙලා නොයෙක් කරදර කරනවා, විනාශයන් ඇති කරනවා.

මේ ආකාරයෙන් මනුස්සයන්ගේ විනාශයට හේතුවන කාරණා අතර මෙවැනි පැත්තකුත් ක්‍රියාත්මක වෙනවා. මනුස්සයන් වඳවෙලා යන්න හේතු විදිහට ධර්මයේ පෙන්වපු කාරණයක් තමයි මේ. එනම් මිනිස්සුන්ගේ වැරදි කටයුතු නිසා දෙවි දේවතාවෝ කලකිරුනොත්, කරදර කරන නිසා බැඳ තබාගෙන ඉන්න සැඩ යකුන් නිදහස් කරනවා. අදටත් මහා විනාශකාරී දේවල් සිද්ධ වුනාම ''දෙවියො කෝප වෙලා, දේව සාපයක් වැදිලා....'' ආදී වශයෙන් කියන්න ජන සමාජය පුරුදු වෙලා ඉන්නෙත් මේ නිසයි. නමුත් මෙතනදී දේව සාපය කියල කිව්වට, දෙවියන් සාප කිරීමක් නෙවෙයි සිද්ධ වෙන්නේ. යකුන්ට, අමනුස්සයන්ට මිනිස්සු කෙරෙහි කරදර හිරිහැර කරන්න නොදී තමන්ගේ දේව බලය යොදවල කරුණාවෙන් රැකගෙන ඉඳීම අත්හැර දැමීමයි සිද්ධ වෙන්නේ. ''මේ වගේ අසත් පුරුෂයෝ ආරක්ෂා කරල වැඩක් නෑ, මේ වගේ අය නිසා අපිටත් ඉන්න නැනේ'' මේ වගේ අදහස් තමයි ගන්නේ. ඒක ද්වේෂ අදහසක් නෙවෙයි. **සාප කිරීම කියන්නෙ එකක්, කරුණාව අතහැරීම කියන්නෙ තව එකක්.** මේ කාරණා දෙක පටලවා නොගත යුතුයි. මිනිස්සු අසත් පුරුෂ වෙන කොට කරුණාවෙන් රැකවරණය සැලසීම තේරුමක් නෑ කියල, ඒ කාරණය අතහැර දාල නිහඬ වීමයි මෙතනදී සිද්ධ වෙන්නෙ. එතකොට දරුණු යක්ෂයන්, අමනුස්සයන් ඇවිත් කරන කරදර හිරිහැර තමයි දේව සාපයක් විදියට හඳුන්වන්නේ.

උදාහරණ විදියට නැති බැරි මනුස්සයන්ට යම් කිසි කෙනෙක් උදව් කරනව කියල හිතමු. එතකොට එසේ උදව් කිරීම යහපත් දෙයක්. නමුත් නැති බැරියි කියන ඒ මිනිස්සු ඒකෙන් බූරු ගහල, සූදු කෙළල, මත්පැන් පානය කරල ....

මේ වගේ දුරාචාර කරන්න පටන් ගත්තොත්, අර උදව් කරපු පුද්ගලයා මොකද කියන්නේ? මම උඹලට උදව් කළේ මේ වගේ දුසිරිත් වැඩ කරන්න නෙවෙයි, මනුස්සයන් වෙලා හැදෙන්නයි කියල ඔහු කියනවා. මේ නිසා, මොකටද මේ වගේ එවුන්ට උදව් කරන්නෙ කියල ඉන් පස්සෙ උදව් නොකර ඉන්නවා. උදව් නොකර ඉන්න එක තරහක් හෝ ද්වේෂයක් නෙවෙයි. උදව් කිරීමෙන් ඵලක් නැති නිසා අතහැර දැමීමයි කරන්නෙ. නමුත් අනුන්ට හිංගි හිංසා කිරීම, සාප කිරීම වෙනම කාරණයක්. ඒක කරන්නෙ තරහෙන්, ද්වේෂයෙන්. උදව් කරන කෙනෙක් ඵලක් නැති නිසා උදව් නොකර සිටීම තරහෙන් හෝ හිංගි හිංසා කරන චේතනාවෙන් කරන දෙයක් නෙවෙයි. ඒක පාපයක් සිද්ධවෙන දෙයකුත් නෙවෙයි. මේ නිසා දෙවියන්ගේ සාපය කියල කිව්වට, දෙවියන්ගේ හිත් දූෂිත වීමක් ගැන නෙවෙයි මේ කියන්නේ.

''දේවතා රක්ඛන්ති'' කියල කියන කොට, මෙත් සිතකින් යුතුව නින්දට යන කෙනා දෙවියන් ආරක්ෂා කරනවයි කියනවා. **යම් විදියකින් මනුස්සයින් කාම සිතිවිලිවලින් දූෂිත වෙලා අනුන්ට හිංගි හිංසා කරන අදහසින් නිදා ගත්තොත්, දෙවියො ආරක්ෂා කිරීම නතර කරනවයි කියල** ධර්මයේ පෙන්වා තියෙනවා. මේ නිසා විපත් සිද්ධ වෙන්නත් ඒක හේතු වෙනවා. මනුස්සයා ගන්නා අදහස්, කරන ක්‍රියාවන් දහමට නොගැලපේ නම් ඒවාට දෙවියො ප්‍රිය කරන්නෙ නෑ. එතකොට දෙවියන්ගේ ආරක්ෂාව ආශිර්-වාදය නතර කර දමනවා. එතනදී පළිගන්න බලාගෙන ඉන්න අමනුස්ස-යන්ට, යක්ෂයන්ට ඒක හොඳ අවස්ථාවක් වෙනවා. ගැමි වහරේ කියවෙන දෙවියන්ගේ ලෙඩ කියන්නෙත් එහෙම දෙයක්. ඒ වගේ දෙවි දේවතාවුන්ගේ ආරක්ෂාව නතර වුණොත්, අර යක්ෂ අමනුස්ස ආදී කොට්ඨාශ විස බීජ පතුරුවනවා. මොකද ඒ අය ඇසුරු කරන්නෙත් විස ලෝකය. ඒ ලෝකය මනුස්සයත් ඇසුරු කරන කොට ඇතිවෙන්නේ විස බීජවලට පසුතලයක්. මේ නිසා ඒක වසංගත රෝග හැදෙන්නත් හේතු වෙනවා. නමුත් දෙවියන් විසින් ඒවා කරනව නෙවෙයි. කරුණා හිතකින් කරපු යහපත් කාර්ය භාරයෙන් මනුස්සයා අයුතු ප්‍රයෝජන ගැනීම නිසා, ඵලක් නෑ කියල අතහැර දමා නිහඬවීම නිසා සිදුවන දෙයක්. එහෙම නැතිව, මුන් වැනසිලා පලයන් කියල ද්වේෂ හිතකින් කරන ක්‍රියාවක් නෙවෙයි.

මේ කාරණාවන් ඒ විදියට සිද්ධ වෙද්දී මනුස්සයාට ලබන්න තිබිච්ච සශ්‍රීකත්වය නැතිවෙලා, නොයෙක් කරදර බාධක එන්න හේතුවෙන තවත් පැත්තක් තමයි අපේ පැරණ්නන් ළඟ තිබුණු දහමට අනුව කෘතෝපකාර කරන ගුණය පිරිහීම. **එදා හිටපු පැරැණ්නන්, දහමට අනුව තමන් දහඩිය මහන්සියෙන් හරිහම්බ කරගත් ධනය පරිහරණය කරපු ක්‍රමවේදයක් තිබුණා.** ඔවුන් සිය ධනයෙන් පළමු කොටස බුදු, පසේබුදු, මහරහත් ආදී ආර්ය උත්තමයන් උදෙසා වෙන් කළා. ඉන් පසු දෙවියන් උදෙසා කොටසක් වෙන් කළා. මොකද අපේ ආදි පැරැණ්නන් වැව් අමුණු හදල දීලා, කුඹුරු අස්වද්දල දීලා, ගස් කොලන් හිටවල දීලා, ඒදඬු පාලම් හදල දීලා, අනාගත පරපුරේ යහපතට කටයුතු කරල දීලා, ඒ පිනෙන් තමයි දේවත්වයට පත් වුණේ. මින්නේරිය වැව හදපු මහසෙන් රජතුමාට මින්නේරි දෙවියන්



කියලයි කිව්වෙ. මොකද ඒ කරපු යහපත් කටයුතුවලට ඒ අය දේවත්වයෙනුයි සැලකුවේ. අදත් ඒවායේ ඵල ප්‍රයෝජන තමයි අපි ලබා ගන්නේ. අපි දෙවියන් උදෙසා පූජාවන් තියනවයි කියන්නෙත් මේ කාරණය මුල් කරගෙන. අයියනායක දෙවියන්, ගම්භාර දෙවියන් ආදී ලෙස අදත් විවිධ ප්‍රදේශවල ඒ ඒ දෙවියන්ගේ නමින් පූජා විධි පවත්වන්නෙත් ඒ අය කරපු සේවයට කෘතෝපකාර සලකන්න. අපි අද මේ ගොවිතැන් කරන්නෙත්, ගස්-කොලන්වලින් ඵල ප්‍රයෝජන ගන්නෙත්, වතුර ටික සපයා ගන්නෙත් අපේ ආදි පැරැණ්නන් එදා මහන්සි වෙලා කුඹුරු හදල, ගස් කොලන් හිටවල, වැව් අමුණු බැඳල දීපු නිසා. එහෙම කරපු අයට අපේ යුතුකමක් තියෙනවා, අද ඒ අය යම් තැනක ඇත්ද අපි මේ කරගන්න පින ඒ අයටත් අනුමෝදන් කරන්න. ඒ නිසා තමයි දෙවියන්ගෙ කොටස කියල කොටසක් වෙන් කරන්නේ.

ඒ වගේම අපේ යුතුකමක් තියෙනවා, කිසිම පිළිසරණක් නැති කාලයේ අපිව හදාවඩා ගත් දෙමවුපියන්, මෙලොවදී අපිට උදව් උපකාර කරපු වැඩිහිටියන් ආදීන්ට කෘත ගුණය සැලකීමක් වශයෙන් ඒ අයටත් කොටසක් වෙන් කරන්න. ඒ වගේම අපිට ගුරුවරු ඉගැන්නුවා, ජීවත් වෙන්න මග පෙන්වා දුන්නා, දැනීම් ඉගෙනීම් ලබා දුන්නා. ඒ ගුණයෙන් ඒ අයටත් අපි සලකන්න ඕන. ඒ අය දැනට ජීවතුන් අතර නැත්නම් දෙමවුපිය ගුරුවර ආදීන් වෙනුවෙන් දන්පෙත් දීල පින් අනුමෝදන් කළ යුතුයි. ඒ වගේම අපට වැඩ කරගන්න ආධාර උපකාර කරපු අපේ පිරිස් හිටියා. ඒ අය අපිට නැති බැරි වෙලාවට ණය තුරුස් ලබා දුන්නා. කුඹුරු වපුරගන්න බිත්තර වී ටිකක් ලබා දුන්නා. හාන්න පෝරු ගාන්න උදව් කළා. දැසි දස් කම්කරුවන් වශයෙන් උදව් කරපු පිරිස් හිටියා. ඒ ආදී වශයෙන් නන් අයුරින් ආධාර උපකාර කරපු පිරිස් හිටියා. ඒ අයටත් යම් කොටසක් චිත්ත ප්‍රසාදයෙන් යුතුව දිය යුතුයි, වෙන් කළ යුතුයි. උතුම් ගුණ ඇත්තන්ගේ යුතුකමක් තමයි මේ විදියට කෘත ගුණ සැලකීම.

ඒ වගේම මේ කියන දේවල් නොකළත්, මේ පොදුවේ තියෙන ලෝකයේ සියල්ලන්ටම යම්කිසි හිමිකමක් තියෙනවා. ඒවා තමයි අපි මේ වැටකඩොලු ගහගෙන වෙන්කරගෙන තියෙන්නේ. ඒ නිසා තමයි ඒ අයට හිමිකම නැතිවෙලා තියෙන්නේ. අපිට අද තිබුණට, ඒ අයටත් තිබිච්ච හිමිකම නමුත් බලහත්කාරයෙන් කවදා හෝ යම්කිසි උපක්‍රම වලින් ඒ අයට නැතිවෙලා. නමුත් ස්වභාව ධර්මයෙන් ඒ අයටත් හිමිකමක් තියෙනවා. ඒ නිසා පොදුවේ සමාජයටම තමන්, තමන්ට ලැබෙන හැටියට ඒ අයටත් කොටසක් වෙන් කර දෙනව කියල, දුගී මගී යාචක ආදී කොට්ඨාශවලටත් යුතුකමක් විදියට පොඩි කොටසක් හෝ වෙන් කරල දෙනවා.

ඉතින් අපිට අද මේ විදියට යහපත් දේවල් කරල දීල තියෙනවා වගේම, අනන්ත සසරේදී අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් හිටපු අය නමුත්, මේ අවිද්‍යාවේ මහත හැටියට පව් කරගෙන සතර අපාගත වෙච්ච කොටසකුත් ඉන්නවා. අපි අතරෙම හිටපු අය තමයි අද මේ විදියට බල්ලො, බලල්ලු, හරක් වෙලා ඉන්නෙ, ඒ වගේම විවිධ පක්ෂීන් වෙලා ඉන්නෙ. වී ගොවිතැන් කරන කොට ඒ අයත් ඉන්නවා. ඒ නිසා උන්ටත් ගොවිතැන් කරල දෙන කොටසින් ටිකක් එකතු කරන්න ඕන. උන් ගොයම් කපන්නෙ නෑ. ඒ නිසා ඒ සතුන්ටත් වී ඇටයක් හරි කන්න ගොයම් කපන කොට නොකපා පොඩ්ඩක් ඉතිරි කරනවා. අපේ පැරණි ගෙවල්වල එලිමහනේ වී කරල් මිටියක් එල්ලා තිබුණොත් මේ හේතුව උඩයි. අදත් හේතුව නොදැන නමුත් ☞

කලාතුරකින් හෝ එහෙම කරන තැන් තියෙනවා. ඒකත් කෘතෝපකාර සැලකීමක්. ඒ වගේම දුගී මගී යාචක ආදීන්ටත්, බලු කපුටන්ටත් පොඩි දානයක් හෝ දෙනවා. මේ විදියට දෙන්න ඕන කොටස්වලට දීල, තමන් හදාගත්තු කොටසේ ඉතිරිය නිදහස්ව භුක්ති විඳිනවා.

මෙහෙම සර්ව සාධාරණ විදියට කටයුතු කරන ගොවියන්ට ඒ චිත්ත ප්‍රසාදයෙන් නැගෙන ශාන්තියෙන්, විශාල සශ්‍රීකත්වයක් උදාකරල දෙනවා. ඒ යුතුකම ඇතිව ඉන්න කෙනාට විශාල සම්පත්තියක් හිමියි. නමුත් ඒ විදියට මනුස්සයාට මිනිස් ගුණය නිසාම හිමි සම්පත්තිය දහස් ගණනින් අඩුවෙලා තියෙන්නේ දැන් තමයි. **මිනිස් කාම සුගතියක ලැබෙන්න තියෙන සම්පත්තිය, අර කියපු ගුණාංග සලකන්නෙ නැතිව, තම තමන්ගේ ආත්මාර්ථ-කාමීත්වය වැඩිවෙලා, අනෙකාට හෙණ ගැහිල ගියත් කමක් නෑ තමන් තමන්ගෙ බඩ විතරක් වඩාගන්න ඕනෙයි කියන අදහසින් ගන්න කොට, ඒ පුද්ගලයාට දූෂ්‍ය මානසිකත්වයක් උදා වෙනවා. ඒකෙන් අර තිබ්බ්ච සම්පත්තිය දහස් ගුණයෙන් අඩු වෙනවා.** ගොවිතැන් නිස්සාර වෙලා යනවා. කෘමි සතුන්ගෙන් පාඩුවෙලා නොයෙක් විනාශයන්ට ගොදුරු වෙනවා. ලෝක විපර්යාසයන් පවා ඒ මානසිකත්වය තුළින් උදාවෙලා, ඉර හඳ පවා කක්ෂයෙන් පිට පනිනවා. මීට පෙර පෙන්වා දුන්න වගේ කාලගුණික දේශගුණික වෙනස්කම් ඇතිවෙනවා. ඒ නිසා මහත් වූ විනාශයන්ට පත්වීමක් තියේනම්, ඒ මේ කියන්නා වූ අසාධාරණයන් නිසා වන ප්‍රතිඵල තමයි.

නමුත් මේ විස්තර කරපු විදියට මනුස්සයා සාධාරණයට පත්වෙනව නම්, පෙර තිබ්බ්ච සශ්‍රීකත්වය යළි ඇතිවෙලා කාලගුණ දේශගුණ රටාවන් පවා බලා ඉඳිද්දී හරියනවා. එතකොට ඒ සඳහා අමුතුවෙන් කරන්න දෙයක් නෑ. ලෝකය හැදිල තියෙන්නෙ ඒවා ස්වභාවයෙන්ම ලැබෙන්න. මේ මහ පොලවට ලැබෙන්න තිබුණා වූ ඒ සශ්‍රීකත්වය අද නැතිවෙලා තියෙන්නෙ මේ කියපු දූෂිත ක්‍රියා පිළිවෙත නිසා. ස්වභාවිකව පොලව සරුවන චක්‍රය මනුස්සයාගේ දූෂ්‍යභාවය නිසා සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගිහින් තියෙන නිසයි අද ගස්වලට කෘතීම පොහොර දමන්න සිද්ධ වෙලා තියෙන්නේ. ඒ විදියට ඇතිවන ශාකවල සශ්‍රීකත්වය නැති නිසා ප්‍රතිශක්තිය අමුතුවෙන් දෙන්න විවිධ බෙහෙත් වර්ග යොදන්න වෙලා තියෙනවා.

මේ නිසා පරිභෝග කරන යම්කිසි වස්තුවක් අපට හම්බවුනා නම් හෝ තිබුණ නම්, ඒක අර කියපු යුතුකම් ඇතිව පරිභෝජනය කරන්න ඕන. ඒක ඒ විදියට නොකර, අද **මේ සමාජයේ එක්තරා පිරිසක් තමන්ගෙ වාසියට පමණක් හදපු නීති රීති නිසා එක්තරා පිරිසකට පමණක් සශ්‍රීකත්වය, සුබෝපභෝගීත්වය ලබාදෙන බලහත්කාර ක්‍රමයක් හැදිල තියෙනවා.** ඒක පිරිසක් පීඩනයට පත්වෙන විදියේ ක්‍රමයක්. ඒ වෙනස බලන්නෙ නැතිව, රටේ සශ්‍රීකත්වයේ නිලතල දරන පළමු පෙල බලයක් තියෙන ඉහල නිලධාරී පිරිස්, අපිට අරක දීපන් මේක දීපන් නැත්නම් අපි වැඩ කරන්නෙ නෑ කිව්වොත් එහෙම, බලාපොරොත්තු වෙන යහපත් පාලන බලයම කඩා වැටෙනවා. ඒ නිසා ඒ අය වැඩ වර්ජන ආදිය වගේ මොනව හරි කරල අච්චර දීපන් මෙච්චර දීපන් කියල බලහත්කාරයෙන් හෝ වැඩිපුර ඉල්ල ගන්නවා. හැබැයි ගොවියන්, කම්කරුවන් වගේ අය කිව්වොත්, අපි වැඩ වර්ජනය කරනව කියල මොනවා කරන්නද? ඉතින් කරගනිල්ලකෝ අපට මොකද, අපිට පාඩුවක් වෙනවද කියල වගකිව යුත්තන් නිකන් ඉන්නවා. මේ නිසා සාමාන්‍ය කම්කරුවන්ගේ උද්ඝෝෂණයන් ඒ අයට ප්‍රශ්නයක් නෙවෙයි. නමුත් මහ නිලධාරීන් වැඩ වර්ජනය කරනවයි කියන්නෙ විශාල ලෙස කඩාවැටෙන පාඩු ලබන වැඩක්. ඒ නිසා ඒ අයට රැකවරණ දීල, ඒ අයගෙ පහසුකම් විතරක් වැඩි කළාම මොකද වෙන්නෙ, පොදුවේ බෙදෙන්න තියෙන සම්පත්තිය එක්තරා පිරිසකට පමණක් වැඩිවෙලා විෂම වූ පඩි රටාවක්, සම්පත්ති රටාවක් හැදෙනවා. අන්තිමට ඉහල නිලධාරීන් විතරයි මැරුණට පස්සෙ තමන්ගේ භාර්යාවට, ඔත්පල වෙච්ච දරුවෙක් ඉන්නව නම් ඒ අයටත් එක්ක ජීවත් වෙන්න වැටුප් සහිත පහසුකම් ලබා ගන්නේ. නමුත් සාමාන්‍ය සේවකයන් උදේ ඉඳන් රෑ වෙනකල් මැරෙන තෙක් වැඩ කළත්, අවසානයේදී හම්බ කරගත්තු සොච්චමෙනුත් තවත් ගාණක් කපල අරගෙන ඒකත් ගන්නවා.

දැන් මේ වගේ දෙයක් ලෝකයේ සිද්ධ වෙනවා. එතකොට මේ වගේ අසාධාරණයන් වෙනකොට අපි දැනගන්න ඕන, අපිට පොදුවේ ලෝකය හදන්න බෑ කියන කාරණය. මේ නිසා තමන්ට ලැබිච්ච දෙයින් තමන් ඒ වගේ අසාධාරණවලින් වෙන්වෙලා, තමන්ට ලැබෙන පළමු කොටස බුද්ධාදී උත්තමයන් සහිත ශාසනයටත්, ඊළඟ කොටස යහපත් කටයුතු කළා වූ මග පාදා දුන්නා වූ දේවාදී කොටස්වලටත්, ඉන්පසු හැදූ වැඩූ දෙමවුපියන්, ගුරුවරුන්, උදව් උපකාර කළ පිරිස් ආදී ලෙස එකින් එක වෙන් කළා නම්, ඒ අයට කවදාවත් අභිවෘද්ධියක් මිසක් පිරිහීමක් නෑ. ඒ අයට පුද්ගලිකව දියුණුව ලැබිල විශාල වශයෙන් සම්පත්තිය ලැබෙන ක්‍රමයක් එනවා. ඒක කිසිම ක්‍රමයකින් වළක්වන්න බෑ. මොකද හේතුවේ ඵලය ඒකයි.

ඉතින් සියලු පිරිස් අත්දැකීමෙන් මේ විදියට හැදුනොත් මුළු ලෝකයටම සශ්‍රීකත්වයක් ස්වයංජාතව නැගෙන්න පටන් ගන්නවා. ලංකාවේ ඒ විදියේ දැහැමි පාලනයක් තිබ්බ්ච මුල් යුගයක, වී කුල්ලක් අරගෙන රටේ එක කෙලවරක ඉඳන් අනෙක් කෙලවරට ගියත් ඒක තවත් එකකට මාරු කරන්න බැරි වුණා. ඒ කියන්නෙ කාටත් සශ්‍රීකයි, ඒ තරම්ම වී තිබුණා. ඒ කාලයේ තිබ්බ්ච සුචරිතය ගැන කියවෙන කොට, ස්වර්ණාභරණයෙන් සැරසිච්ච ස්ත්‍රියකට ලංකාවේ එක කෙලවරක ඉඳන් රෑ දවල් අනෙක් කෙලවරට යන්න කාගෙන්වත් බාධාවක් කරදරයක් නැතිව පුළුවන් වුණාලු. **මෙහෙම සුචරිතයන් ගුණධර්මයන් තිබ්බ්ච කාලයක ලෝකයේ කිසිම රටකට මේ හෙළ දීපය අල්ල ගන්න විනාශ කරන්න බැරි වුණා. කිසිම විරුද්ධ පාර්ශ්විකයෙකුට එබඳු රාජ්‍යයක් විනාශ කරන්න බැරි වුණා. විනාශ වුණා නම් විනාශ වුණේ, එබඳු පාලනයක් නැති වෙච්ච දුර්වල කාලයක තමයි. ඒ වගේ කාලවල ගැටුම් විනාශ වැඩියි.**

ඒ කාලයේ ඒකාධිපති පාලනය කියල දැහැමි පාලනයක් තිබුණා. ඒක එක එක්කෙනාට ඕන හැටියට පාලනය කිරීමක් නෙවෙයි, **එකම ධර්මය අධිපති කරගත්තු පාලනයක් තමයි ඒ කාලයේ ඒකාධිපති පාලනය කියල කිව්වෙ. ධර්මය තමයි ඒ ක්‍රමයට රජයක පලවෙනි තැන ගත්තේ.** ධර්මයෙන් පිටස්තරව කටයුතු නොකරන දස රාජ ධර්ම ක්‍රමයක් තිබුණා. ඒ දස රාජ ධර්ම ක්‍රමය අධිපති කරගෙන පාලනය කරපු පාලනය තමයි එදා ඒකාධිපති පාලනය කියල හැඳින්නුවේ. නමුත් පසු කාලයේදී එක එක්කෙනාට ඕන ඕන විදියට පාලනය කරන හිතුවක්කාර ක්‍රමයක් තමයි ඒකාධිපති පාලනය කියල ආවේ. නමුත් ඒක හරියන්නෙ නෑ, මහා විනාශයක්. නියම ඒකාධිපති පාලනය කියන්නෙ දස රාජ ධර්මයෙන් කරන ධර්මානුකූල පාලනය. ඊට අනුව, ධර්මයට අනුකූලව තමන්, තමා හෝ තමාගේ පිරිසට හෝ ඒ ධර්මයට විරුද්ධව වැඩ කරන්න ඉඩ දුන්නෙ නෑ, වාසියට නීති හදන්න ගියෙත් නෑ. ඒ පාලනය හරි සශ්‍රීක වුණා. අද වුණත් එහෙම පාලනයක් එනව නම් විශාල සශ්‍රීකත්වයක් එනවා. එහෙම පිරිසක් ඉන්නව නම් ලේසියෙන් පරාජය කරන්න බෑ. නැත්නම් ඉතින් කරන්න දෙයක් නෑ මේ ගිනි ගුලිය දිගටම ගෙනියන්න වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අරුත් සැඟව ගිය ආමිස පූජාව සහ ප්‍රතිපත්ති පූජාව නිවැරැදි දහම් ඇසින්...



උපාසක අම්ම කෙනෙක් මල් වට්ටියක් අරගෙන පැන් දෝවනය කරනවා. ඒ අම්ම බොහොම ගෞරවයකින් පෙරලයි පැන් ගත්තේ. ඊට පස්සෙ ඒ පැන් මල්වලට ඉස්සා. ඊළඟට බුදු පිළිම වහන්සේ ඉදිරියේ ඒ මල් ටික පූජා කරල දොහොත් මුදුන් දීල වැන්දා. ඒ කාරණාව ඉෂ්ට කළාට පස්සෙ උපාසක අම්මා පිටත් වුණා. එතන හිටපු පණ්ඩිතයො දෙන්නෙක් දැන් අර උපාසක අම්ම මෙතෙක් වෙලා කරපු සත්කාර්ය විවේචනය කරනවා. ''ඔහොම ආමිස පූජා කරල හරි යනවද? බුදුන් වහන්සේ කිව්වෙ ප්‍රතිපත්ති පූජාව කරල නිවන් දකින්න නේ! මොනවද මේ අය කරන්නෙ? ඔය ටික කරල නිවන් දකින්න පුළුවන්ද? මහ ලොකුවට බෞද්ධයො කියල ඉන්න අය මොනවද මේ කරන්නෙ?'' මේ වගේ දහසක් දේවල් ඒ දෙන්නගෙ කතාව ඇතුලෙ තිබුනා. මේක බොහොම වැදගත් කාරණාවක් නිසා ආමිස පූජාව සහ ප්‍රතිපත්ති පූජාව කියන්නෙ මොකක්ද කියල හොයල බලන්න ඕන. ඒ වගේම මේ පූජා ක්‍රම දෙකේ වෙනස හඳුන ගන්නෙ කොහොමද කියලත් බලන්න ඕන.

පූජාව කියන වචනය බෝධි පූජාව, බුද්ධ පූජාව, මල් පූජාව, පහන් පූජාව.... ආදී වශයෙන් නිතර පාවිච්චි කරන වචනයක්. හැම එකකම අග පූජාව කියන වචනය භාවිතා වෙනවා. මලක් අරගෙන ගිහින් බුදු පිළිම වහන්සේ ඉදිරියේ තියල එනව කියල කියන්නෙ නෑ. ඒකට විශේෂ වචනයක් පාවිච්චි කරනවා. කියන කොට කියන්නෙ මල් පූජා කරල ආව කියල. නිකන් කෙනෙකුට මලක් දුන්නොත් ඒකට පූජා කළා කියල කියන්නෙ නෑ. එහෙනම් ඇයි මේ විශේෂ වචනයක් පූජා කියල පාවිච්චි කරන්නේ? ඒ වැඩෙන් අපිට යමක් ලැබෙනවද? මොකක්ද ලැබෙන්නෙ? එහෙම නැත්නම් ඒකෙන් යමක් ඉපදෙනවද? ජනිත වෙනවද? බුදුන් වහන්සේ ඉදිරියේ මලක් පූජා කරල ඒ කරපු වැඩෙන් අපිට යමක් ජනිත වුනාද? සසර ගමන බාධා කරදර අවම කරගෙන යන්න බලාපොරොත්තු වෙන අයට අවශ්‍ය පුණ්‍ය ශක්තියක් හෝ නිවන් මග ගමන් කිරීමට අවශ්‍ය සුව පහසුවක් තමයි ඒකෙන් ජනිත වුනේ. කොටින්ම කියනව නම් ආහාරයක් ජනිත වුනා. ඇයි ආහාරයක් ජනිත වුනා කිව්වෙ? ආහාරයෙන් තමයි කෙනෙකුට යම් දෙයක් කරන්න අවශ්‍ය කාය ශක්තිය ලැබෙන්නේ. සිතෙන් හෝ කයෙන් හෝ වචනයෙන් හෝ වෙන්න පුළුවන්, යම් දෙයක් කරන්න ශක්තියක් අවශ්‍යයි. ඒ ශක්තියට ආහාරයක් අවශ්‍යයි. ඒකයි ආහාරයක් ඉපදුනා කියල කිව්වෙ. අපි කන බොන දේ කියල කියන්නෙ එක ආහාරයක් පමණයි. එතකොට ''පූ'' කියන අකුරෙන් පෙන්වන්නේ ''ආහාරයක්'' කියන එකයි. ''ජා'' කියන අකුරෙන් පෙන්වන්නේ ජනිත වුණා, එහෙම නැත්නම් ඉපදුනා කියන තේරුමයි. (පූ+ජා=ආහාරයක් ජනිත වුනා).

දැන් බලන්න ඕන ආමිස පූජාවක් කරල ලැබෙන දේ මොකක්ද, ඒ වගේම ප්‍රතිපත්ති පූජාවෙන් ලැබෙන දේ මොකක්ද කියල. සරලව කියනව නම් **සසර ගමන හදන තාවකාලික ආහාරයක්, ශක්තියක් ජනිත වුනා නම් ඒක ආමිස පූජාවක්. ඒ වගේම කවදා හෝ නිවන් මගට යොමු කරවන ආහාරයක්, ශක්තියක් ජනිත වුනා නම් ඒක ප්‍රතිපත්ති පූජාවක්.** අපිටම ලේසියෙන් තෝරගන්න පුළුවන්. දැන් ප්‍රශ්නයක් එනවා අර උපාසක අම්ම කරපු පූජාව ආමිස පූජාවටද, ප්‍රතිපත්ති පූජාවටද අයිති වෙන්නෙ කියල. මේ ගැන අර පණ්ඩිතයො දෙන්න වගේ නැතුව, හේතු ඵල රටාව අනුව බලලම තීරණයකට එන්න ඕන. සරල උදාහරණ දෙකක් අරගෙන ආමිස පූජාවයි, ප්‍රතිපත්ති පූජාවයි වෙන් කර ගත්තොත්, උපාසක අම්ම කරපු පූජාව හේතුඵල දහම් රටාවට අනුව තමන්ටම තෝරගන්න පුළුවන්.

ගමක ඉන්නවා මනුස්සයෙක්. මේ මනුස්සයා හරිම හොඳ කෙනෙක්. කාටත් උදව් කරගෙන ජීවත් වෙනවා. ඔහු දවසක් ඒ ගමේම තවත් අසරණ මනුස්සයෙක් දකිනවා. ඉතින් මේ මනුස්සය හිත උණුවෙන කෙනෙක් නිසා ගිහින් අහනව, උන්නැහේ මොකක්ද ඔබට වෙලා තියෙන්නෙ, ඇයි පාරෙ ඉන්නෙ කියල. ඉතින් අර අසරණ කෙනා කියනවා, අනේ මහත්තයෝ මට ඉන්න හිටින්න තැනක් නෑ, කන්න බොන්න විදිහක් නෑ, ඒකයි මම මේ පාරෙ ඉන්නෙ කියල. දැන් අර උදව් කරන මනුස්සයා මේ අසරණයට ඉන්න හිටින්න තැනක් හදල දීල, කන්න බොන්න ක්‍රමයකුත් හදල දෙනවා. අසරණ මනුස්සයත් කිසි කතාවක් නෑ, හදල දුන්න තැන තමන්ට ඕන විදිහට කාල බීල ඉන්නවා. දැන් උදව් කරපු මනුස්සයටත් හරි සතුටුයි. ඉතින් ඔහොම කාලයක් යනකොට, උදව් කරපු මනුස්සයට හිතෙනවා, අර තමන් උදව් කරපු අසරණ මනුස්සයා බලන්න යන්න. ගිහින් බැලුවම ඒ මනුස්සයා මරණාසන්නව ඇඳක වැතිරිලා ඉන්නවා. නැවතත් ගිහින් අහනව මොකක්ද වුනේ කියල. දැන් අර මරණාසන්නව ඉන්න මනුස්සයා මෙහෙම කියනවා, ''අනේ දැන් මගේ අන්තිම කාලෙ කරගන්න දෙයකුත් නෑ, අතපයත් වාරු නෑ, එක එක විකාර පේනවා, ගිනි දැල් පේනවා, හරිම බය හිතෙන දේවල් පේනවා'' දැන් ඉතින් උදව් කරපු මනුස්සයත් අහනවා, මම කරපු උදව්වල අඩුපාඩු එහෙම තිබුනද කියල. නැවතත් අර මරණාසන්න මනුස්සය කතා කරල කියනවා, අනේ නෑ ඔබතුමාට පින් ☞

සිද්ධ වෙන්න මම හොඳට කාල බීල ඇඳල හිටිය කියල. කාල බීල විනෝදෙන් හිටිය මිසක් වෙන මොකුත් පිනක් දහමක්, බණ භාවනාවක් එහෙම කළේ නැද්ද කියල අර මනුස්සය නැවතත් අහනවා. අනේ නෑ, ඒවට වෙලාවක් තිබ්බෙ නෑ, මට ඒව කරන්න හිතුනෙත් නෑ කියල මරණාසන්න මනුස්සය උත්තර දෙනවා. ඉතින් අර ගමේ ඉන්න හොඳ මනුස්සයත්, ආ ඇත්තද කියල යන්න යනවා.

දැන් ඉහත කතාවෙන් අපිට මොකක්ද ගන්න පුළුවන්? එක මනුස්සයෙක් තමන්ගෙ ගුණ යහපත්කම නිසා වෙන කෙනෙකුට උදව් කළා. නමුත් ඒ උදව් ගත්ත කෙනා මොකද කළේ? ඒ දුන්න දේ කාල ඇඳල මේ ලෝකෙ සම්පත් භුක්ති විඳිමින් නිකරුනේ කාලය ගත කළා. දැන් මරණාසන්න මොහොතෙ දුගතියකට යන්න පාර කැපිල, අර දුන්න දෙයින් වැඩක් ගත්තෙ නෑ. පුළුවන් වෙලාවෙ පිනක් කරගත්තෙ නෑ. ආ කියල දුන්න මිසක්, ගත්ත කෙනා ඒක වැය කළා මිසක්, වෙන ප්‍රයෝජනයක් නෑ. ඉතින් ඔය ජාතියේ **ආ කියල දුන්න මිසක් (ආ+මිස) ගත්ත කෙනා ඒකෙන් ප්‍රයෝජනයක් ගත්තෙ නැති පූජාවලට ආමිස පූජා කියල කියනවා.** එයින් ජනිත වෙන ආහාරයෙන් මහ ලොකු දෙයක් කරන්න ශක්තියක් නෑ. බත් ටිකක් දුන්න නම්, ගත්ත කෙනාට ඒකෙ වටිනකම තියෙන්නෙ නැවතත් බඩගින්න එනකල් විතරයි.

දැන් ඊළඟට පන්සලක හෝ ආරණ්‍යයක හෝ යම්කිසි නිදහස් තැනක බණ භාවනා කරන ස්වාමීන් වහන්සේ නමකට පැහැදිලා දන් දෙන මනුස්සයෙක් ගැන බැලුවොත්,

එක්තරා ගුණ යහපත් මනුස්සයෙක් ඉන්නවා. තමන්ගෙ ගෙවල් ළඟ හෝ ටිකක් ඈතින් පන්සලක හෝ ආරණ්‍යයක හෝ නිදහස් තැනක වැඩ ඉන්න ස්වාමීන් වහන්සේ නමක් දකින මේ මනුස්සය උන් වහන්සේ ළඟට ගිහින් කතා කරනවා. උන්වහන්සෙත් තමන් වහන්සේගෙ අත්දැකීම් අනුව අර මනුස්සයට දහම කියල දෙනවා. ඒකෙන් හරි පැහැදීමක් එනවා. ඒක දහම් දැකල ගත්ත පැහැදීමක්. බුද්ධ, ධම්ම, සංඝ කියන ත්‍රිවිධ රත්නය කෙරෙහි ඇති වුන ශ්‍රද්ධාවක්. ''අනේ මේ ස්වාමීන් වහන්සේ නිසා මට කොච්චර ලාභයක්ද ලැබුනෙ? මේ තරම් ගුණස්කන්ධයක් තියෙනව කියල මම කලින් දැන ගෙන හිටියෙ නෑනෙ!'' මේ විදියට උන්වහන්සේට දානයක් දෙන්න ඕන කියල හිතල දානෙ ලෑස්ති කරල ගිහින් පූජා කරනවා. දැන් මේ කරපු දෙයින් ජනිත වුන ආහාරයේ බලය කොච්චර නම් ඇත්ද? බුද්ධ කියන්නේ අප්‍රමාණ ගුණස්කන්ධයක්, ධම්ම කියන්නෙත් ඒ වගේම අප්‍රමාණ ගුණස්කන්ධයක්. ඒ වගේම සංඝ කියන්නෙත් අප්‍රමාණ ගුණස්කන්ධයක්. මේ අප්‍රමාණය වෙනුවෙන් කරපු පූජාවකින් ලැබෙන දේ ප්‍රමාණ කරන්න පුළුවන්ද?

ඒ වගේම අර ස්වාමීන් වහන්සේ ඒ දානය වළඳලා මොනවද කරන්නෙ? උන්වහන්සේ ධර්ම දේශනා කරනවා. එහෙම නැත්නම් භාවනා කරනවා. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා කියන සතර බ්‍රහ්ම විහරණයෙන් වාසය කරනවා. ඉතින් උන්වහන්සේ නිසා ලෝකයට කොච්චර නම් සෙතක් ශාන්තියක් වෙනවද? අර කලින් අවස්ථාව වගේ බඩගින්න නිවිල නැවතත් එනකල් නෙවෙයි. උන්වහන්සේ ඒ දාන වේල නිසා ගත්ත ශක්තියෙන් අප්‍රමාණ සත්වයන්ට සෙතක් සැලසෙනවා. ඒ නිසයි ජනිත වුණ ආහාරයේ ශක්තිය, ප්‍රමාණය කියන්න බෑ කියල කිව්වෙ. දැන් මේ කාරණය සම්බන්ධයෙන් බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛ



දේශනාව මොකක්ද කියල විමසා බලමු.

සිල්වත් වූ යමෙක් දැහැමින් ලැබ පහන් සිත් ඇති වැ මහත් වූ කම් ඵල අදහමින් සිල්වතුන් විෂයෙහි දන් දේ ද, ඒකාන්තයෙන් ඒ දානය මහත්ඵල ඇතැයි කියමි. (මජ්ජිම නිකාය (3) - 527 පිටුව දක්ඛිණ විභංග සූත්‍රය )

මෙයින් පැහැදිලි වෙන්නෙ මොකක්ද? සිල්වතුන් විෂයෙහි, ඒ කිව්වෙ අර ඉහත සඳහන් කරපු භික්ෂූන් වහන්සේ වගේ ගුණවතුන් කෙරෙහි. එතකොට මහත්ඵල කිව්වෙ මොකක්ද? ඵලයක් කියන්නෙ අපි යමක් කරල ඒකෙන් බලාපොරොත්තු වෙන දේට. තිරිසන් අපාගතව සිටින සතෙක් මනුස්සයෙක් වෙලා ඉපදෙන එක ඉහල ඵලයක්. ඒකට පිනක් ඇදිල එන්න ඕන. ඒ වගේම මනුස්සයෙක් දෙවියෙක් වෙන්න නම්, මනුස්සකම ඉක්මවා ගිය යහපත් දෙයක් කරල තියෙන්න ඕන. ඒ වගේම දෙවියෙක් බ්‍රහ්මයෙක් වෙන එක ඊටත් එහා ගිය පිනක් කරල ලැබෙන ඵලයක්. නමුත් බුද්ධ ශාසනය තුල ඉන්න උතුමෙක් කවදාවත් පැවැත්මක් නිච්ච, සුඛ, අත්ත, සුභ වශයෙන් වර්ණනා කරන්නෙ නෑ, ඒ ලැබුන දේට උදම් වෙන්නෙ නෑ. එතකොට කලින් සඳහන් කළ බුද්ධ වචනය අනුව ඔය මිනිස්, දේව, බ්‍රහ්මවලට වඩා එහා ගිය ඵලයක් තියෙන්න ඕන. මේ කොහේ ඉපදුනත් කෙනෙකුට රක්ෂණයක් දෙන්න පුළුවන්ද, නැවතත් ඒ පුද්ගලය බල්ලෙක් වගේ සතර අපා ගත වෙලා ඉපදෙන්නෙ නෑ කියල ? දෙවියෙකුට එහෙම ඇප වෙන්න පුළුවන්ද? ඊට උඩින් ඉන්න බ්‍රහ්මයෙකුට ඇප වෙන්න පුළුවන්ද? එතකොට ඔය ලැබුන ඵලයන් එකක් වත් මහත් (විශාල, උපරිම) ඵලයන් වෙනවද?

නමුත් රක්ෂණයක් දුන්න එකම එක උත්තමයෙක් ඉන්නවා. නුඹලා සෝවාන් ඵලය ලබා ගනිල්ලා, සතර අපායෙන් සදහටම නිදහස් කියල බුදුන් වහන්සේ දේශනා කරනවා. අනන්ත අප්‍රමාණ සංසාරයේ උපමා කරන්න බැරි තරමට මහා දුක් කන්දරාවක්, කෙනෙක් මේ සතර අපායේ ගෙවනවා. දෙවියෙක් වුණත් රක්ෂණයක් නැති, බ්‍රහ්මයෙක් වුණත් රක්ෂණයක් නැති, අනිවාර්යයෙන්ම විඳවන්න සිද්ධ වෙන මේ සතර අපා දුකින් සෝවාන් උත්තමයා සදහටම නිදහස්. ඉතින් ඒක මහත් ඵලයක් නෙවෙයිද? ඒ වගේම සකෘදාගාමී උත්තමයාට, සෝවාන් උතුමෙක් විඳින කාම ලෝකයේ ගින්න තුනී වෙලා යෑම මහත් ඵලයක් නෙවෙයිද? අනාගාමී උත්තමයා කාම ගිනිවලින් සදහටම නිදහස්. ඒක මහත් ඵලයක් නෙවෙයිද? අරිහත් උත්තමයා පිරිනිවන් පෑවට පස්සෙ සියලු දුකින් නිදහස්. නැවතත් ඒ ගැන අපට කතා කරන්නවත් දෙයක් නෑ.

මේකෙන් තේරුම් ගන්න ඕන, බුදු පියාණන් වහන්සේ අදහස් කරපු මහත්ඵලය මොකක්ද කියල. අර කලින් වගේ, ආ කියල දුන්න මිසක් එතනින් වැඩක් නෑ කියල කියන්න පුළුවන්ද? මේ ආකාරයෙන් **මහත්ඵලවලින් කෙලවර වෙන හෝ කවදා හෝ කෙලවර කරගන්න පුළුවන් පූජාවක් තියෙනව නම්, ඒකට ප්‍රතිපත්ති පූජාව කියල කියනවා. බුද්ධ ශාසනය වෙනුවෙන් කරන සියලුම පූජා මේ කොටසට අයත් වෙනවා.**

දැන් කෙනෙකුට මෙහෙම හිතෙන්න පුළුවන්, එතකොට බුදුන් වහන්සේට තියන කොඩි සේසත්, උඩුවියන්, පෙරහැරවල්, බෝධි පූජා, මල් පහන් ආදියත් ඒ හා සමගාමීව කරන තොරණ, දන්සැල්, සැරසිලි, බැති ගී ආදියත් මේ කොටසට අයිතිද? මේ වගේ කාරණා සම්බන්ධයෙන් විවේචනය කරන්න කලින් ටිකක් හිතල බලන්න ඕන. අපි මේ කවුරු වෙනුවෙන් කවුරු මුල්කරගෙනද මේ පූජා කරන්නේ? බුදුන් වහන්සේ හෝ උන්වහන්සේගේ ☞

ශාසනය හෝ උන්වහන්සේ දේශනා කරපු ධර්මස්කන්ධය හෝ ඒ මග අනුගමනය කරන සංඝයා වහන්සේ මුල්කරගෙන නේද?

ධම්මපද අටුවාවේ සුමන කියල මල් විකුණපු කෙනෙකුට වෙච්ච සිද්ධියක් ගැන සඳහන් වෙනවා. ඔහු බුදුන් වහන්සේ වෙනුවෙන් කරපු පූජාවක් ගැනත්, ඔහුගේ හිතේ තිබුන පැතුමත්, අවසාන ප්‍රතිඵලයත් ගැන පැහැදිලිවම සඳහන් වෙනවා. ඔහුට (සුමන මාලාකරුට) මෙබඳු සිතක් පහල වුණා. ඉතින් රජු මා ඝාතනය කළත්, බන්ධනාගාරගත කළත්, රටින් එළවා දැම්මත් කමක් නෑ. ඔහු මට දෙන්නෙත් මෙලොව ජීවත් වීමට පමණක් සෑහෙන ධනයක්. බුදුන්ට පූජා පැවැත්වීමෙන් මට නොයෙක් කල්ප කෝටි ගණන් හිත සුව පිණිස වන්නේ යැයි කියා තමන්ගේ ජීවිතය බුදුන් උදෙසා පූජා කළා. බුදුන් වහන්සේට කරපු පූජාවකින් තමන්ට කල්ප ගානක් ගියත් ගෙවල ඉවර කරගන්න බැරි පිනක් ලැබීමක්, පහළ වෙනව කියල ඔහු දැනගෙන හිටියා. ඒ නිසා බුදු පියාණන් වහන්සේ වෙනුවෙන් ජීවිතය දෙවැනි කරල ඒ පූජාව කළා. රහත් වෙන්නවත්, අනාගාමී වෙන්නවත්, වෙන ශ්‍රාවක පැතුමක් සම්බන්ධයෙන්වත් හිතේ කිසි බලාපොරොත්තුවක් තිබුණෙ නෑ. තනිකරම ලෞකික සැප සම්පත් බලාපොරොත්තුවක් තමයි තිබුණෙ. නමුත් බුදුපියාණන් වහන්සේ ඔහුට ලැබෙන දේත්, අවසාන ප්‍රතිඵලයත් ආනන්ද හාමුදුරුවන්ට පෙන්වා දුන්නා.

උන්වහන්සේ ආනන්ද තෙරුන් අමතා මෙහෙම කියනවා. ''ආනන්ද, මේ මාලාකාර විසින් කුඩා දෙයක් කරන ලදැයි නොසලකව. මොහු විසින් මා වෙනුවෙන් දිවි පුදා මේ පූජාව කරන ලදී. හෙතෙම මෙසේ මා කෙරෙහි සිත පහදවා කළ පිනෙන් කල්ප ලක්ෂයක් දුගතියට නොයයි. දෙව් මිනිසුන් අතර මේ හේතු කොටගෙන මහත්ඵල ලබා පසුව සුමන නමින් පසේ බුදුවරයකු වන්නේය.''

මෙතනදී පැහැදිලි වෙනවා, මොන බලාපොරොත්තු තිබුණත් පූජාව කළේ වීතරාගී, වීතදෝෂී, වීතමෝහී උතුමන්ට කියන කාරණය. අවසාන ප්‍රතිඵලයත් වීතරාගී, වීතදෝෂී, වීතමෝහී ප්‍රතිඵලයක්මයි. ත්‍රිපිටක පොත් වහන්සේලා කියන්නේ අපට ශ්‍රී මුඛ බුද්ධ දේශනාව දැනගන්න පුළුවන් එක ක්‍රමයක්. ඒ වගේම එහි ප්‍රධාන පෙළ වශයෙන් නිවන් දැකීමට අවශ්‍ය දහම් කාරණා තියෙනවා. ඒ ප්‍රධාන පෙළට එන්න කලින් අනු පෙළක්, එනම් අප්‍රධාන පෙළක් වශයෙන් අපදාන පාලිය කියල වෙනම පොත් වහන්සේලා කොටසක් තියෙනවා. ඒවායේ බුද්ධ ශාසනයේ වැඩ හිටපු බොහෝ රහතන් වහන්සේලා ගැනත්, උන්වහන්සේලා මාර්ගය කෙලවර කරගන්න පටන් ගත් හැටිත් පැහැදිලි කරල තියෙනවා.

''විපස්සි බුදුරජාණන් වහන්සේට බුද්ධත්වයට උපකාර වූ උතුම් වූ දැම මූලයෙහි (බෝධි මූලයෙහි) පරණ වැලි අස් කොට පිරිසිදු (අලුත්) වැලි විසිර වීමි. මෙයින් අනූවන කපෙහි මම යම් වැලි දනක් දුනිම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. මෙය වාලුකා (වැලි) දානයාගේ විපාකයයි. මෙයින් තෙපණස්වන (53 වන) කපෙහි ජනයා අධිපති වන මහත් බල ඇති මහපුලින නම් වූ සක්විති රජෙක් වීමි. සිවු පිළිසිඹියාවෝද අෂ්ට විමෝක්ෂයෝද ෂඩ් අභිඥාවෝද සාක්ෂාත් කරන ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරන ලදී.'' (අපදාන පාළිය (1) - 141 පිටුව පුලිනපූජකස්ථවරාවදානය )

දැන් මේ රහතන් වහන්සේ, රහත් වෙන්න පෙර කරපු දේ ගැන බලන්න. බෝධින් වහන්සේ ළඟ සුද්ධ පවිත්‍ර කරල, අලුත් වැලි අතුරල.... මේ ආදී වශයෙන් සාමාන්‍ය කටයුත්තක් විදියට කෙනෙකුට මතුපිටින් මේ කාරණය පේන්න පුළුවන්. නමුත් උන්වහන්සේට හැඟීම තියෙන්න ඇති, කා වෙනුවෙන්ද මේ දේ කළේ කියන කාරණය සම්බන්ධයෙන්. ඒක වැදගත්ම කාරණයක්. ප්‍රතිපත්ති පූජාව හරියට දැනගන්න මේ අපදාන පාළිය බොහොම වැදගත්. **බුද්ධ ශාසනය කියන්නෙ පෙලට ගමන් කරන ක්‍රමයක්. පිළිවෙතින් පෙල ගැසීමක්. පෝලිමේ ඉස්සරහ වගේම පිටුපසින් යන අයත් ඉන්නවා. ඉදිරි පසින් ඉන්න කෙනා පිටුපසින් ඉන්න කෙනාට හිනාවෙන්න හොඳ නෑ, ඔහු තාම මල් පූජ කර කර කොඩි බැඳ බැඳ ඉන්නව කියල. මොකද ඉස්සරහින් ඉන්න කෙනත් එකපාරටම එතනට ආවෙ නෑ.** ඔහුත් පිටිපස්සෙ ඉඳල තමයි ඉස්සරහට ආවෙ. මෙතනදි බලන්න ඕන, කවුරු වෙනුවෙන්ද යන්නයි, ඒ ගුණස්කන්ධය දැකීමයි. මුලින් අර පණ්ඩිතයො දෙන්නගෙ විවේචනයට ලක් වෙච්ච උපාසක අම්ම කරපු පූජාව ආමිස පූජාවටද, ප්‍රතිපත්ති පූජාවටද අයිති වෙන්නෙ කියන කාරණය දැන් තෝර ගන්න පුළුවන්.

එහෙනම් කෙනෙකුට පුළුවන්ද, ආමිස පූජාවක් ප්‍රතිපත්ති පූජාවක් බවට හරව ගන්න? මේ ලිපිය කියවන කෙනෙකුට එහෙම හිතෙන්න පුළුවන්. ඒකත් හොඳ ප්‍රශ්නයක්. ගෙදර ඇති කරන හෝ අහල පහල ඉන්න සතෙකුට හෝ කෑම ටිකක් දීල, ඒකෙන් ඒ සතාටත්, අපිටත් සෙතක් වෙන විදිහෙ දෙයක් කරන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා. සතෙක් ගත්තෙ උදාහරණයකට විතරයි. ඕනම උදව්වක් කරල ඒ උදව්ව ලබාගත් කෙනාට කවදා හෝ යහපතක්, නිවන් මග විවෘත කරන්න පුළුවන් ක්‍රමයක් තමයි මේ පෙන්වා දෙන්නෙ. හැබැයි මුලින් අපි තුල ඒ ගුණය ගොඩ නගා ගන්න ඕන. මොකක්ද මේ ගොඩනගා ගත යුතු ගුණය?

සමාජයේ පොදුවේ හොඳ මනුස්සයෙකුට ගුණවතෙක්, ගුණ යහපත් මනුස්සයෙක් කියල කියනවා. යම්කිසි දෙයක් වැඩි කරනවට ගුණ කරනවා කියල කියනවා. එතකොට කෙනෙක් නරක ගති පැවතුම් අත්හැරල, හොඳ පැත්ත වැඩි කරනව නම් ඔහුගේ ක්‍රියා කලාපය හොඳ පැත්තට වැඩි වෙනවා. එහෙම නැත්නම් ගුණ වෙනවා. මෙතනදී හොඳ පැත්ත වැඩිවෙනවා කියන අර්ථයෙන් ගන්නේ. ගුණවතෙක් කිව්වම ඔහුගේ හෝ ඇයගේ වත් පිලිවෙත්, කරන වැඩ හොඳ පැත්තට වැඩි වෙනවා. පොදුවේ හොඳ පැති දෙකක් තියෙනවා. එකක් ලෞකික හොඳ පැත්ත. අනෙක ලෝකෝත්තර හොඳ පැත්ත. මෙතනදී කතා කරන්නෙ ලෝකෝත්තර හොඳ පැත්ත ගැන. ඒ පැත්තෙ තියෙන ගුණ මොනවද? නව අරහාදී බුදු ගුණ, ඊට පස්සෙ ස්වාක්ඛාත, සංදිට්ඨික ආදී.... ධර්මයේ ගුණ. ඊළඟට ඒ ධර්මයේ ගුණ වඩන උත්තමයන්ගේ ගුණ, එහෙම නැත්නම් සඟ ගුණ. මේ අප්‍රමාණ ගුණ කන්දරාවක්. බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ කියන මේ ගුණ කන්දරාවට කියන තවත් නමක් තමයි සාසන ගුණය කියන්නෙ. මේ සාසන ගුණය කෙනෙකුට පිහිටන්නෙ කොහොමද? යමෙක් බුදුන්, දහම්, සඟුන් සරණ යයි ද ඔහුට මේ කියන සාසන ගුණය පිහිටනවා. ඇත්තටම ඒක පුද්ගල ගුණයක් නෙවෙයි, ඒ ගුණයන් කෙරෙහි නැමෙන නිසා ඔහුට හෝ ඇයට පිහිටන ගුණයක්. මෙන්න මේ ගුණය තමයි ප්‍රයෝජනයට ගන්න ඕන.

එතකොට කොහොමද ඒක කරන්නෙ? සතෙකුට ආහාරයක් දෙනකොට අපි තුලින් නැගෙන්න ඕන දෙයක් තියෙනවා. මම මේ සතාට කෑමක් දුන්නා. ඌ කරගත්ත දෙයක් නිසා දැන් විපාක විඳිනවා. නමුත් මුගේ බඩගින්න යම් ප්‍රමාණයකින් හෝ මට නිවන්න පුළුවන් වුනා. මූ මා කෙරෙහි පැහැදිලා දුන් නකුට වනනවා, දුවනවා, පනිනවා, සතුටු වෙනවා. ඒ පැහැදුනේ මට නෙවෙයි, මම නැමුන, මට පිහිටපු සාසන ගුණයන්ට. සාසන ගුණය කියන්නේ අප්‍රමාණ ගුණ කන්දරාවක්. වීතරාගී, වීතදෝෂී, වීතමෝහී ගුණ. ඉතින් මේ සතාට මේ සතර අපායෙන් මිදිල, සසර දුකින් මිදෙන්න ලැබෙවා කියල ප්‍රාර්ථනා කරනවා. නැවතත් කන්න දීපු කෙනාව දැකල වලිගය වැනුවත්, දුවල ඇවිත් ලෙව කෑවත් ඒ සතාට හොඳක් මිසක් නරකක් වෙන්නෙ නෑ.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**රික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# එක ක්ෂේත්‍රයකට පමණක් සීමා නොවූ පද නිරුක්ති ක්‍රමය එදිනෙදා ජීවිතයටත්...


*(පසුගිය කලාපයෙන් - පද නිරුක්ති මගින් හෙළිවන ස්වභාව ධර්මයේ නිපැයුම්)*

පද නිරුක්ති ගැන කතා කරන කොට ඒක එක ක්ෂේත්‍රයකට පමණක් සීමා වෙන්නෙ නෑ. ලෝකයේ භාවිතා වෙන ඕනෑම ක්ෂේත්‍රයක ඕනෑම වචනයක් අර්ථ දක්වීමටත් පද නිරුක්ති යොදා ගන්න පුළුවන්. උදාහරණ විදිහට අද ලෝකයේ පාසල් අධ්‍යාපනයේ පටන් හැම තැනම භාවිතා කරන විද්‍යා ක්ෂේත්‍රයේදී මතුවන වචන තුනක් තමයි ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝන කියන්නේ. මේවායෙත් තියෙනවා සැඟවුණු දහම් අරුත්. ඒවා නිරුක්ති මගින් මතු කර ගන්න පුළුවන්.

ඒ වගේම ඒවා හැදිල තියෙන භාෂාව මොකක් වුනත්, ඒවායේ අර්ථයන් ගැලපිලා තියෙනවයි කියන කාරණයත් ඔප්පු කරන්න පුළුවන්. ඉල්ලන අයට ඕනෑ කරන දේ තමයි ඉලෙක්ට්‍රෝන කියන්නේ. එනම් යම් කිසි දෙයක් බලාපොරොත්තු වෙනවා, දුකට පිහිටක් බලාපොරොත්තු වෙනවා. බලාපොරොත්තු වෙන පුද්ගලයා ඒක ඉල්ලන්නේ බැගෑපත්ව අත් දෙක දික් කරගෙන උඩට හරවගෙන. දෙවියන්ට යාච්ඤා කරන්නෙත් ඒ විදිහට. අත් දෙක උඩට හරවගෙන ඉල්ලන දේ ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. මේ තමයි ඉලෙක්ට්‍රෝනවල ස්වභාවය. දැන් මේ කියන ගති ලක්ෂණ, අද පාසල්වල උගන්වන විද්‍යාවේ එන ඉලෙක්ට්‍රෝනවල ස්වභාවයටත් කදිමට ගැළපෙනවා. සෘණ ආරෝපිත ඉලෙක්ට්‍රෝන හැමවිටම කරන්නේ ලබා ගැනීමක්.

ඊළඟට පරවුන්ට ඕන කරන දේ තමයි ප්‍රෝටෝන කියන්නේ. ඒ කියන්නේ අනුන්ට දෙන එක. දෙවියන් එක අතක් පහළට හරවගෙන ඉන්න ස්වභාවයෙන් පෙන්වන්නේ ආ... කියල දෙන ස්වභාවය. මේ කියන කාරණය දේව රූප මගින් පිළිබිඹු වෙනවා. ආශිර්වාද දෙන හැමවිටම අල්ල පහතට හරවා යමක් දෙන අයුරු පෙන්වන්නේ මේ නිසා. එහෙනම් කෙනෙක් ඉල්ලන විට ඒ පරවුන්ට ඕන දේ දෙන එක තමයි ප්‍රෝටෝනවල ස්වභාවය.

ඊළඟට නිකන් ඉන්න අයට, නිදහස්ව ඉන්න අයට ඕන කරන දේ තමයි නියුට්‍රෝන කියන්නේ. ඒ කියන්නේ ඒ අය දෙන්නෙත් නෑ, ගන්නෙත් නෑ. මේ කාරණය දැක ගන්න පුළුවන් අවස්ථාවක් තමයි එරමිණිය ගොතාගෙන අත් දෙක එක උඩ එක තියාගෙන සිටින භාවනානුයෝගී අවස්ථාව. එතැන ගනුදෙනුත් සමග සම්බන්ධයක් නෑ.



නිදහස්ව ඉන්න කොට දීමයි ගැනීමයි කියන දෙකේ ක්‍රියාවලියක් නෑ. සංසාර ගනුදෙනුවලින් මිදී නිවී සැනසී ඉන්න අවස්ථාවක් තමයි මේකෙන් පෙන්වන්නේ. දෙන්න බලාපොරොත්තු වෙන අය ඉන්නෙ අත් දික් කරල ආශිර්වාද කරන ආකාරයෙන්. නිදහස්ව ඉන්න අවස්ථාව භාවනානුයෝගී අවස්ථාව. ඒ වගේ අවස්ථාවක් තමයි එරමිණිය ගොතාගෙන නිහඬව ඉන්න අවස්ථාව. එතකොට නිදහස්ව ඉන්න ඕන අය කියන්නේ ඒකෙන් කාටවත් වැඩ කරන එකක් නෙවෙයි. නමුත් එතැනදී පැතිරෙන ශාන්තිය අනෙක් අයගේ යහපත් වැඩ කටයුතුවලටත් ලොකු ආධාරයක්. මේ වගේ අපි ලෝක සම්මතයේදී කතා කරන නියුට්‍රෝනත් අක්‍රියයි. නමුත් ඒවා ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝනවල වැඩපිළිවෙළට ලොකු ආධාරයක්. දැන් මේ කියන ස්වභාවයේ ගති ලක්ෂණ ජනිත වෙච්ච රූප කලාප තමයි අපි විද්‍යාවේදී හඳුන්වන ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝන කියන්නේ. එහෙනම් වචන මොන භාෂාවෙන් හැදුනත් ඒවට ගැළපෙන අදහස් එන බව පැහැදිලිව පේනවා.

එහෙනම් ඒ ඒ කාලවලදී භාවිතා කරපු වචන මාලාවන් අනුව තමයි ඒ අදහස් අරගෙන කැටි කරල පදයක් හදන්නෙ. එතකොට **ඒ පද හිතල හැදුවෙ නැති වුණත්, කවුරු කොහොම හැදුවත් හැදෙන්නෙ පටිච්ච සමුප්පන්නව.** එහෙම නොගැළපෙන එකක් හදන්න හැදුවත් ඒක භාවිතයට එන්නෙ නෑ. කෘතිම විදිහට පදයක් හදල දැම්මට ඒකට කල් පැවැත්මක්, භාවිතයක් නෑ. මේ කාරණය අපට හොඳින් දැක බලා ගන්න පුළුවන් පාසල් යන ළමුන් අතරේ. යම් ළමයෙකුට දෙමාපියන් විසින් එක්තරා විදිහකට නිර්මාණය කරල හොඳ නමක් දානවා. උදාහරණ විදිහට ගුණයෙන් පාලනය වෙන කෙනාට ගුණපාල කියල කියනවා. හැබැයි ඒ නම ඔහුගේ හේතු කාරකයක් නොවෙන්න පුළුවන්. නමුත් ළමයගෙ තියෙන හැඩරුවක් හෝ ගති ලක්ෂණයක් අනුව ඔහුට යාළුවන් විසින් ඔච්චමට වෙනත් නමක් පටබඳිනවා. ඊළඟට ඒ වචනය අර කියපු මුල් නමට වඩා සිය දහස් ගුණයකින් භාවිතා කරනවා. මෙහෙම කාලයක් යනකොට මුල් නම කිව්වට කවුරුවත් දන්නෙ නෑ. සමහර විට දැන ගත්තත් භාවිතා කරන්නෙ නෑ. නමුත් පසුකාලීනව පටබැඳපු නම කියන කොටම දැන ගන්නවා මේ අහවල් කෙනා කියල. ඉන්පසු ඔහුගේ ජීවිත කාලය යනතුරුත් ඒ නමින් භාවිතා කරනවා.

මේ වගේ නිරුක්ති නාමය කියන එක, නිරුක්ති ගැළපිලා තියෙන ☞

එක බොහෝ කොට කල් පවතිනවා. එතකොට මිනිස්සු අතරේ අර්ථයේ අදහස් ගන්න පහසු වෙනවා. සමහර විට අර ගුණපාල කියන ළමයා පසුකාලීනව හොරෙක්, මිනීමරුවෙක් වෙන්නත් පුළුවන්. එතකොට යහපත් ගුණයෙන් පාලනය වන අර්ථයට ඔහුගේ ක්‍රියා කලාපය නොගැළපී යනවා. මේ වගේ අදත් මිටි නිසා මිට්ටා කියනවා, කුදු නිසා කුදා කියනවා, කළු නිසා කළුවා කියනවා. මේ විදිහට ඒකට හේතුවක් තියෙනවා. එතකොට ඒවා හරියට නිරුක්ති ගැළපිලා ඒවටම ආපු පද. ඉතින් පදයෙන් කියන්නෙ මොකක්ද කියල දැන ගන්න මූලධර්මයක් තියෙනවා. ඒක තෝර ගන්නෙ නිරුක්ති පටිසම්භිදා ඥානයෙන්. හැබැයි ඒක භාෂා නිරුක්ති රටාවක් නෙවෙයි.

දැන් මේ විදිහට ධර්මයේ එන 'සම්මා' කියන පදයෙත් නිරුක්තිය දැකිය යුතුයි. 'සං' කියන එකතුවෙන් මිදීම තමයි සම්මා කිව්වේ. ඒ සඳහා දැකිය යුක්ත තමයි සම්මා දිට්ඨී කියන්නේ. එහෙනම් 'සං' කියන එකතුවෙන් මිදෙන්න වෙන මොකක්වත් දැකල හරියන්නෙ නෑ. සම්මා දිට්ඨී කියන එකේ ලෝකෝත්තර අර්ථය තෝරා-ගත යුතුයි. හැබැයි අද ලෝකයේ බොහෝ තැන්වල සම්මා දිට්ඨී වෙන්න හුඟක් දේවල් කරනවා. කේන්දරයක් තියෙනව නම් ඒක පිච්චුවාම සම්මා දිට්ඨී වෙනවලු. නැකැත් බැලුවෙ නැත්නම් සම්මා දිට්ඨී වෙනවලු. දෙවියන්ට පුද පූජා තිබ්බෙ නැත්නම් සම්මා දිට්ඨී වෙනවලු. මේ තමයි අද බොහෝ තැන්වල සම්මා දිට්ඨී වෙන්න කරන්නෙයි කියන දේවල්. නමුත් බුදුන් වහන්සේ මෙහෙම ක්‍රමයක් දේශනා කරල තියෙනවද? ඔය කියන ක්‍රමවලින් 'සං' කියන එකතුවෙන් මිදෙන්න පුළුවන්ද?

එහෙනම් 'සං' කියන එකතුවෙන් මිදීමට දැකිය යුක්ත මොකක්ද? 'යං කිංචි සමුදය ධම්මං සබ්බන්තං නිරෝධ ධම්මන්ති' මේ කාරණයත් භාෂා නිරුක්තිවලින් තෝරන්න ගිහින්, යම් දෙයක් හටගත්තේද ඒ සියල්ල නැති වෙලා යනවා කියන අර්ථයක් දුන්නා. නමුත් මෙතනදී රෝධ ධර්මයයි, නිරෝධ ධර්මයයි පළමුව තෝරාගත යුතුයි. අපේ ආදි පැරැණ්නන් දහම් අර්ථයන් ගෙනාපු අදහස් එදිනෙදා භාෂාවට භාවිතා කරපු අවස්ථාවලින් මේක තේරුම් ගන්න පුළුවන්. ''උදේ ඉඳන් රෑ වෙනකල් රවුම් ගහල ගහල ආව මෙතන! කොහෙද රවුම් ගහන්න ගියේ?'' දෙමවුපියන් ළමයින්ට බණින කොට අදත් මෙහෙම අහනවා. ''මං ඇඳපු එක රවුමක් තියේ නම් පෙන්නන්නකො අම්මේ''. ළමය මෙහෙම කිව්වොත් දැන් ඒක පෙන්වන්න පුළුවන්ද? ''මං කොහේවත් රවුමක් ගහල ආවෙ නෑ''. දැන් මේ කිව්වෙ මොකක්ද? තැනින් තැන රස්තියාදු වෙලා ආශාවන්ට ඇලිල ගැලිල, එක එක තැන්වල ආස්වාදයන්ගෙන් වෙළී පැටලී ඉඳල, ඒ වගේ වැඩපිළිවෙළක් කරල ආවම කියනව රවුම් ගහල ආව කියල. රවුම් ගහන එක තමයි රෝන්ධ ගහනවයි කිව්වෙ. රෝ + අන්ධ - රෝන්ධ, රෝ කියන්නෙ රවුම් ගහනවයි කියන එක. **අන්ධ වැඩවලට රවුම් ගහන්න ගියාම කියනවා රෝන්ධෙ යනවයි කියල.**



කාමයන්ට මුළා වෙලා, අන්ධ වෙලා ඒවා පස්සෙ යනකොට තමයි මෙහෙම කියන්නෙ.

මේ තමයි අපේ ආදියේ තිබ්බ්ච, හරි දහම් අර්ථයක් තියෙන වචන. පංච කාමයන් පස්සෙ යන එක රෝධ ධර්මයක්. ඒකෙන් මිදෙන එක නිරෝධ ධර්මයක්. ඒ කියන්නෙ රෝධ නැති ධර්මයක්. රෝධ තියෙනකල් සැරිසරනවා. රෝධ නැතිනම් සැරිසරන්නෙ නෑ, නිරෝධයි. යං කිංචි සමුදය ධම්මං - 'සං' කියන එකතුව උදාකරන යම් ධර්මයක් ඇත්ද, ''සබ්බන්තං'' - ඒ හැම දෙයක්ම, ''නිරෝධ ධම්මං'' - රවුම් ගහන්න වටින ඒවා නෙවෙයි, සැරිසරන්න වටින ඒවා නෙවෙයි. නමුත් මේකට නැතිවෙන සුලුයි කියල කිව්වොත් ඇත යනු එක අන්තයක්, නැත යනු තව අන්තයක් කියන දෘෂ්ටියට වැටෙනවා. (සං.නි. 2, 28 පිටුව - <u>කච්චාන ගොත්ත සූත්‍රය</u>) බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ මේ අන්ත දෙකම අතහැර දමා මාධ්‍ය (වැඩ පිළිවෙල) තුළින් නිවන් අවබෝධ කරගන්න කියල. අන්ත දෙකෙන් නිවන් දකින්න බෑ. මේ නිසා සියල්ල නැති වෙන සුලුයි කියන එක බුදුන් වහන්සේ දේශනා කරපු ධර්මයට එකඟ ද කියල බලන්න ඕන.

සියල්ල නැතිවෙනවයි කිව්වොත් නාම ගෝත්‍ර මොනවටද අයිති වෙන්නෙ? ඒකත් සමුදය ධර්මවලට අයිති වෙනවා. හට ගත්තු ඒවාට අයිති වෙනවා. දැන් අපි යමක් කරනවා. ඊයෙ යමක් කළා. එතකොට අද අහනවා ඊයෙ මොකද කළේ කියල. මං අහවල් අහවල් දේ කළා කියල උත්තර දෙනවා. කොහොමද ඇහුවොත් එහෙම කියන්නෙ? මට මතකයිනෙ කියල උත්තර දෙනවා. එහෙනම් අපි හිතින්, කයින්, වචනයෙන් කරපු දෙයක් මිසක් ඉබේ හැදිච්ච මතක සටහනක් නෙවෙයි අපේ මතකය කියන්නේ. අපි කරල, කියල, හිතල ඒ තුළින් ගොඩනැගිච්ච එකක් තමයි අපේ මතකය. මේවාට කියන්නේ නාම ගෝත්‍ර කියල. එහෙනම් බුදුන් වහන්සේ දේශනා කළා 'නාම ගොත්තං නජීරති' - නාම ගෝත්‍ර දිරන්නෙ නෑ කියල. (<u>නජීරති සූත්‍රය</u>) එහෙනම් හට ගත් සියල්ල විනාශ වෙනවයි කිව්වොත් කෝ ධර්මයත් එක්ක ගැලපීම? සියල්ල දිරනවයි, වැනසෙනවයි කිව්වොත් ''**රූපං ජීරති (දිරනවා) මච්ඡානං (මැරෙනවා) නාම ගොත්තං නජීරති**'' කියන කොට දිරන්නෙ නැති නාම ගෝත්‍රය හට ගත්තු එකක් නෙවෙයිද කියල ඇහුවොත් දෙන උත්තරේ මොකක්ද? එහෙනම් සියලු ධර්ම නැතිවෙන සුලුයි කියල නෙවෙයි මේ කියන්නේ. සැරිසරන්න වටින ඒවා නෙවෙයි, හරයක් ඇති ඒවා නෙවෙයි කියන එකයි මේ කියන්නෙ. හරයක් නැත්නම් ඒකෙ සැරිසරන්න වටින්නෙ නෑ. ඒක අවබෝධ කරගත්තම ඒකෙ රවුම් ගහන්නෙ නෑ. රෝධ ධර්මයක් කරන්නෙ නෑ. ඒවා නිරෝධ ධර්ම. නැතිවන ධර්ම කියන එක නෙවෙයි මෙතන අර්ථය. සැරිසරන්න වටින ඒවා නෙවෙයි කියන එක. 'අසාරට්ඨේන අනත්තා' - සාරත්වයක් නැති අර්ථයෙන් අනත්තයි කියනවා. (පටි සං. ම. ප්‍ර. 1, 68 පිටුව) නමුත් මේකට අද අනාත්මයි කිය කියා ඉන්නවා. හැබැයි අපට ඕන හැටියට අනත්ත තෝරන්න බෑ. ධර්මයට ගැලපෙන විදියට, කියල තියෙන කාරණය හරියට දැන ගත්තොත් දහම් හරය වැටහෙනවා.

'යධ නිච්චං තං දුක්ඛං' (සං.නි. (4) <u>බාහිර අනිච්ච සූත්‍රය</u>) කියන එක භාෂා නිරුක්තිවලින් තෝරන්න ගිහින්, යමක් අනිත්‍ය ද ඒක දුකයි කියල අදහස

අරගෙන තියෙනවා. නමුත් යමක් පොතේ තිබුණත්, කවුරු කිව්වත් ධර්මයට බහා බලන කොට බහා හිටිනව නම්, විනයට සැසඳෙනව නම් ඒක බුද්ධ දේශනාව ලෙස පිළිගන්න කියලයි බුදුන් වහන්සේ දේශනා කළේ. එහෙනම් 'යධ නිච්චං තං දුක්ඛං' කියන එකත් බුද්ධ දේශනාවක් ලෙස පිළිගන්න හේතු තියෙන බව විග්‍රහ කරන කොට පෙනී යන කරුණක්. හැබැයි යමක් අනිත්‍ය ද ඒක දුකයි කියල දනට දීල තියෙන සිංහල තේරුම බුද්ධ දේශනාවක්ද, නැත්නම් පසුකාලීනව හදාගත් ආචාර්ය වාදයක් ද කියන කාරණය විමසා බැලිය යුතුයි. යමක් අනිත්‍ය නම් ස්ථිර නැත්නම් ඒක දුකයි කියලයි අද සිංහලෙන් තෝරන්නේ. යමක් කියල කියන කොට මේ ලෝකයේ ඒකට අහුනොවෙච්ච දෙයක් නෑ. ඔක්කොම යමක් කියන වචනයට කොටු වෙනවා. අංශභාගය, පිළිකාව, බඩේ අමාරුව, සංසාරය කියන මේ හැම එකක්ම යමක් කියන එකට අයිතියි. දැන් මේ විග්‍රහය ගත්තොත් යමක් ස්ථිර නැත්නම් දුකයි, ස්ථිර නම් සැපයි කියලයි නිගමනය එන්නේ. ඒ කියන්නේ අංශභාගය, පිළිකාව, බඩේ අමාරුව, සංසාරය කියන මේවත් ස්ථිර නැත්නම් දුකයි, ස්ථිර නම් සැපයි කියලයි නිගමනය එන්නෙ. එතකොට මේ කියන කතාව ඇත්තද කියල හොඳින් කල්පනා කරල බලන්න. දැන් ධර්මයට බහා බලන්න. හැබැයි පොතේ තියෙන ධර්මය නෙවෙයි ධර්මය කිව්වේ. අපට ගෝචර වන ධර්ම රටාවක්, ධර්ම න්‍යායක් තියෙනවා. න්‍යාය ධර්මයට එකඟ නම් ඒක ඇත්ත විය යුතුයි.

මේ ලෝකය දුකින් පිරිලා. ඒ දුක් කන්දරාව ස්ථිර නැත්නම් ඒකත් දුකද? ''දුක්ඛෝ ලෝකේ පතිට්ඨිතා'' මේ ලෝකය දුකේ පිහිටලා කියල බුදුන් වහන්සේ දේශනා කරනවා. ඉතින් ස්ථිර නම් සැපයි කිව්වොත් මේ කියන ලෝකයත් ස්ථිර නම් අපි අනාථයිනේ ! එහෙනම් අපට යන්න තැනක්වත්, බේරෙන්න තැනක්වත් තියෙනවද? **කොතැනක හෝ අපි ලබපු අත් බවක් ස්ථිර වුණා නම් එහෙම අපි අනාථයි. ලෝකය දුකෙහි පිහිටල තියෙනව නම්, ඒ දුකෙහි පිහිටපු එකේ අපි ස්ථිර වුණා නම් අපිට වෙන්නෙ මහා විනාශයක්. එතකොට ඒක ස්ථිර නැත්නම් ඒක දුකක්ද?** දුක ස්ථිර නැත්නම් දුකෙන් මිදීමක් තියෙනව නේද? බැරි වෙලාවත් දුක ස්ථිර වුණා නම් එහෙම දුකෙන් මිදීමක් තියෙනවද? එහෙනම් දුකෙන් මිදීමත් දුකක්ද? හොඳට හිතල



බලන්න. මේ කියන කාරණය න්‍යාය ධර්මයට එකඟද? ඥානවන්තයින්ට ගෝචර වෙනව නම් ඒක එහෙම කියන්න පුළුවන්ද? මේ දුකින් පිරිල තියෙන ලෝකය ස්ථිර නැති නිසාම අපිට බේරිල්ලක් තියෙනවා. එහෙනම් යමක් ස්ථිර නැත්නම් දුකයි කියන කතාව හරිද? ඔය දුක් ගොඩ ස්ථිර වුණා නම් එහෙම (ස්ථිර නැත්නම් දුකයි කියන්නේ ස්ථිර නම් සැපයි කියන එක) ඒක සැපක්ද? එතකොට දුක් ගොඩ ස්ථිර නැත්නම් ඒක දුකද? කෝ න්‍යාය ධර්මයට ගැළපීම? මජ්.නි. (1) 702 පිටුවේ එන <u>චූලවේදල්ල සූත්‍රයේ</u> **''සැප එන විට සුඛයි, ගෙවෙන විට දුකයි, දුක එන විට දුකයි, ගෙවෙන විට සැපයි''** කියල විස්තර කරල තියෙනවා. එහෙනම් 'සං' කියන එකතුවෙන් මිදීමට දැකිය යුත්ත තියෙන්නෙ මෙතන. සම්මා දිට්ඨි වෙන්න දැකිය යුක්ත මේකයි. ඒක දකින්නෙ නැතිව වෙන මොනවා දැක්කත්, මොනවා කළත් සම්මා දිට්ඨි වෙන්න බෑ.

මේ නිසා 'යධ නිච්චං තං දුක්ඛං - යං දුක්ඛං තදනත්ථා' කියන කාරණය හරියට න්‍යාය ධර්මයට එකඟව තෝරාගත යුතුයි. නිරුක්තිය දකින්න ඕන කිව්වෙ මේ නිසයි. ඒ විදිහට තෝරා ගත්තොත් ඒක තර්ක වාදවලින් පරද්දන්නත් බෑ. තර්කයට ගෝචර කරන්නත් බෑ. ඒක එහෙම නෙවෙයි කියල කියන්න බෑ. න්‍යාය ධර්මයට එකඟයි. ඥානවන්තයන්ට ගෝචරයි. නමුත් යමක් අනිත්‍ය නම් ඒක දුකයි කියන කතාව නම් එහෙම පිළිගන්න බෑ. අපට අහන්න වෙනවා එහෙම වෙන්නෙ කොහොමද කියල. **දුකෙන් පිරිල තියෙන ලෝකය ස්ථිර නැත්නම් ඒකත් දුකද?** නෑ. එහෙනම් ඒ නිසාම තමයි සැනසීම ලබන්න පුළුවන් වෙන්නේ. ඒ නිසාමයි දුකෙන් මිදෙන්න මාර්ගයක් තියෙන්නේ. එහෙනම් ඒක දුකක් වෙන්න පුළුවන්ද? දැන් කොතනද අපට වැරදුණේ?

මේ තමයි භාෂා නිරුක්තියෙන් තෝරන්න ගිහින් අපි වරද්ද ගත්තු තැන්. අනිච්ච කියන පදය නිරුක්ති පටිසම්භිදා ඥානයට අනුව ගෝචර කරල තෝර ගත්ත නම් ප්‍රශ්නය එතනම විසඳෙනවා. ඉච්ඡ කියන්නේ කැමැත්ත. අනිච්ච කියන්නෙ නිසි නෑ. ඇයි? කැමති සේ නැති නිසා. යමක් කැමති සේ නැත්නම් ඒක දුකයි. දැන් මේක කාටවත් නැහැයි කියන්න පුළුවන්ද? අපි කැමතියි සැප විඳින්න. නමුත් පුළුවන්ද? අපි කැමතියි අංශභාගය, පිළිකා හැදෙන්නෙ නැත්නම්, ලෙඩවෙන්නෙ නැත්නම්. නමුත් අපි කැමති වුණායි කියල ලෙඩ නොවී තියෙනවද? නෑ. **ප්‍රිය මධුර දෙයක් එනවා. අපි ඒක පවතිනවට කැමතියි. ගෙවෙනවට අකමැතියි. නමුත් එහෙම පවතිනවද? නෑ ඒක ගෙවෙනවා, කැමති සේ නෑ. ඉච්ඡ සේ නෑ, අනිච්චයි. දුකක් එනවා. එනවට කැමති නෑ. නමුත් කරන්න දෙයක් නෑ එනවා. එහෙනම් ඒකත් අනිච්චයි, කැමති සේ නෑ.**

ගිරිමානන්ද සූත්‍රයේ බුදුපියාණන් වහන්සේ ''කතමාචානන්ද අනිච්ච සංඥා ඉධානන්ද භික්ඛු සබ්බ සංඛාරේසු අට්ඨීයති හරායති ජිගුච්ඡති අයං වුච්ඡතා නන්ද අනිච්ච සංඥා...'' ආදී වශයෙන් දේශනා කරල තියෙනවා. ඉහත වචන තුනෙන් අනිච්ච දෙයක ලක්ෂණ දැකිය යුතුයි. එනම් මේ වචන තුනට දැන් අර්ථ පෙන්වා තියෙන්නෙත් වේදනා සහගතයි, ලජ්ජා සහගතයි, පිළිකුල් සහගතයි කියල මිසක් ස්ථිර නැති කතාවක් මෙතනදී කියවෙන්නෙ නෑ. එහෙනම් මෙතනදීත් අනිච්ච කියන වචනයට ස්ථිර නෑ කියන අර්ථයක් දීල නැති බව ඔප්පු වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

***වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :***

**නීතිඥ චන්දන සිරිවර්ධන**

**අභයරතනාලංකාරය - 19**



# භූමි පාළුවකින් සිදුවන විනාශය සම්බන්ධයෙන් සත්‍ය අත්දැකීමක්

*(පසුගිය කලාපයෙන් - ගුප්ත ලෝකයේ සිට ලෙඩ රෝග හදන අමනුස්සයින් සම්බන්ධ අත්දැකීම් කිහිපයක්...*

මිනී අළුවලින් කරන ජීවම්, කොඩිවින ආදියෙන් නොයෙක් කරදර ලෙඩ රෝග ඇති වෙන හැටි මේ දහම් සඟරාවෙන් මීට පෙර විග්‍රහ කරල තියෙනවා. දැන් මේ විස්තර කරන්න යන්නේ එවැනි කොඩිවිනයකින් කරපු භූමි පාළුවක් ගැන අත්දැකීමක්. මම ගිහි කාලයෙදී තමයි මේ සිද්ධිය වුනේ. මම ඒ කාලයේ මුල් අවධියේදී බොහොම සශ්‍රීක විදියට ගොවිතැන් කටයුතු සිදුකරමින් හිටියත් හිටි ගමන් වගේ සිද්ධ වූ සිද්ධියක් තමයි මේ.

ඒ දවස්වල මම එළවළු වගාවෙන්, ගොවිතැන් බතින්, කරන කියන රැකී රක්‍ෂා ආදී මේ කිසිම දෙයක් හරි ගියේ නෑ. ඒවායින් ඔක්කොම පාඩු තමයි සිද්ධ වුණේ. ඉතින් බොහොම අමාරු තත්ත්වයක් තමයි ඒ කාලෙ තිබුණෙ. නමුත් බොහෝ දෙනෙක් මේක නිකන් සිද්ධ වෙන දෙයක් කියල හිතනව මිසක් භූමි පාළුවක් වගේ දේකින් වෙනවයි කියල විශ්වාස කරන්නෙ නෑ. ඒ කාලෙ මම ගොවිතැන් බත් කර ගෙන අපේ ගෙවත්ත සීමාව තුළම අංග සම්පූර්ණ ගල් වැටි ඉදිකරල, අඩි දෙකහමාරක් තුනක් විතර යටට යනකල් සම්පූර්ණයෙන්ම පොළව හාරල, කානු කපල, කොච්චර වැස්සත් වත්තෙන් පිටට වතුර ගලාගෙන යන්න නොදී හොඳට සකස් කරල තිබුණා. මේ විදියට වත්ත පිටිය සකස් කරල තිබුණට ඒකෙ මොනව හිටෙව්වත් හරි ගියේ නෑ. පස්සෙ මම මොකද කළේ, මේ කිසිම දෙයක් හරියන්නෙ නැත්තෙ මොකද කියල බලන්න, හොඳ මඤ්ඤොක්ක ගෙනැල්ල එක පෙළට හිටෙව්වා. මොකද මඤ්ඤොක්ක කියන්නෙ කිසිම අමතර පොහොරක් දාන්නෙ නැතුව, සාත්තු සප්පායමක් නොකරත් ඉබේම හොඳට හැදෙන අල වර්ගයක්. ඉතින් මේක කාලයක් ගිහිල්ල පොලවෙ තිබ්බ්ච පෝර නිසාම අඟල් හයක් විතර උඩට ඇදුණා. හැබැයි එච්චරම තමයි එයින් එහාට හැදුනෙ නෑ. කරන්න දෙයක් නැති තැන මමත් මොකද කළේ, මඤ්ඤොක්ක පඳුරු ටික ගලවල දාල එතැන කෙහෙල් පඳුරක් හිටෙව්වා. හදන්න බැරිනම් මම කොහොම හරි හදන්නම් කියල, කඩෙන් රසායන පෝර ගෙනත් සතියෙන් සතිය දැම්මා. ඒ වගේම වතුරත් දැම්මා. මේ නිසා ගහ හැදෙන්න පටන් ගත්තා. මෙහෙම ටිකක් හැදිල සාමාන්‍ය නාම්බන් ගහක් වුණා විතරයි, පූදින්න කාලයක් ආවෙ නෑ. දවසක් රෑ එක පාරටම දඩබඩ ගාල සද්දයක් ඇහුණා. බලන කොට මී හරකෙක් ඇවිත් ගහ පෙරලල පතුරු ගහල දාල ගිහින්. හැබැයි මී හරක ආගිය අතක් නෑ. ඌට එන්න තැනකුත් නෑ. කොහෙන් ආවද කොහොම ගියාද කියල මොකවත් හිතාගන්න බෑ. පස්සෙ මම දැනගත්ත මේ වත්තෙ මොනම විදියකින්වත් මොනම දෙයක්වත් හදන්න බැරි බව. ඒ කියන්නෙ වගා පාළුවක් හෙවත් භූමි පාළුවක්.

මට යම්කිසි ගුප්ත ශක්තියක් මතු වෙච්ච මුල් කාලෙ, මේ වගේ දෝස ඔක්කොම කපා ගත්තෙ මම තනියෙන්මයි. ඒ විදියට මේ භූමි පාළුව කියන දෝසයත් මට සමාධියට ආපු ගුප්ත ක්‍රමයකින් කැපුවා. එහෙම නැතිව මන්ත්‍ර බලයකින් නෙවෙයි. ඊට පස්සෙ සමාධියෙන්ම දැනුම් දුන්නා, දැන් අර කලින් හිටවපු තැනම මඤ්ඤොක්ක හිටවන්න කියල. ඒ අනුව පඳුරු 5 ක් විතර හිටෙව්වා. පස් ටිකක් දැම්ම එච්චරයි. වෙන මොකුත් පෝර දැම්මෙ නෑ. පුදුමෙ කියන්නෙ බලා ඉඳිද්දී, අද බලල හෙට බලන කොට ගස් ලොකු වෙලා. මෙහෙම හැදිල ටික දවසක් යනකොට, අල බහින ඒවායින් මතුවෙන ඉරි පාරවල් පවා බිම දිගේ යන්න පටන් ගත්තා. මේ විදියට මාස 3 ක් විතර ගියාට පස්සෙ මට හිතුණා, එක පඳුරක් ගලවල බලන්න. ඒකත් සමාධියෙන්මයි දැනුම් දුන්නේ. මඤ්ඤොක්ක පඳුර ඇදල බලන කොට මටම පුදුම හිතුණා. තරුණ කාලෙ වෙලත් මට තනියෙන් උස්සන්නවත් බෑ. එක අලයක් අඩි හතර හමාරක් විතර දිගයි. ඒ වගේම කකුලක් විතර මහතයි. ඒ වගේ අල හතරක් විතර එක පඳුරක තිබුණා. හිතන්නත් බැරි දෙයක්. ප්‍රදර්ශනයකට තියන්න තරම් ලොකුයි.

දැන් මේ භූමි පාළුව කරපු අයත් මම දැන ගෙන හිටියා. අහළ පහළ ගෙදරකින්ම තමයි කරල තිබුණෙ. හැබැයි මම ඒක කාටවත් ඇඟෙව්වෙ නෑ. අපේ ගෙදර ළඟ තවත් ගෙයක් තිබුණා. මම අර මඤ්ඤොක්ක අලයක් අරගෙන ඒ ගෙදරට දුන්නා, වටපිටාවේ සම්බන්ධ ගෙවල්වලටත් ගෙනිහින් දීල, තවත් ඕන කෙනෙකුට දෙන්න කියල. මොකද තනියෙන් කන්න බෑ, මහ විශාල අල. එහෙම අහළ පහළ ගෙවල්වලට දෙනකොට, මෙච්චර විශාල මඤ්ඤොක්ක කොහෙන්ද කියල ඇහුවොත්, මේව මේ කොඩිවින කරපු අයගෙ කොඩිවින පෝරෙන් හදපුව කියල කියන්න කියලත් මම ඒ අයට කිව්වා. එහෙම කියල අර කොඩිවිනය (භූමි පාළුව) කරපු අයටත් යැව්වා. එතකොට ඒ අය කියල තියෙනව, ඕක ගේන්න එපා ඇස්වහ වදීවි කියල. පස්සෙ මම ආයෙත් පණිවිඩයක් යැව්වා, ඇස්වහ වදින්නෙ නෑ ඕක කොඩිවින පෝරෙන් හදපුව කියල. ඒ වගේම, තවත් මේ වගේ කොඩිවින කළොත් මං ඒකත් විනාඩි 15 කින් පෝර කරනව කියල කියන්න කියලත් කිව්වා. මේ විදියට ළඟ පාත ගෙදරට දීල, ඒ අයට පුළුවන් තරමක් කාල අනෙක් ගෙවල්වලටත් දෙන්න කියල තමයි යැව්වේ. ඒ අයත් දැනගෙන හිටියා කොඩිවින කරපු ගෙදර මොකක්ද කියල. ඒ නිසා ඒ අයත් මොකද කළේ, ඒ කොඩිවින කරපු ගෙදරටත් මඤ්ඤොක්ක ගෙනිහින් දීල, මෙන්න මෙහෙම කතාවක් කිව්ව කියලත් කිව්වා.

මේ කාරණය හෙළි කළේ, මේ වගේ කොඩිවින තියෙනවයි කියල අත්දැකීමෙන්ම පෙන්වන්න. මොකද නිකන් කිව්වට මේව මිනිස්සු විශ්වාස කරන්නෙ නෑ. දැන් මෙතන දී වෙනස බලන්න. ඉස්සෙල්ල පොඩි පැළයක්වත් පෝර දාලත් හදාගන්න බැරි වුණා. අර ☞

කොඩිවිනය කපල භූමි පාළුව අයින් කළාට පස්සෙ අමුතු පෝරක් කියල මොකුත් නොදා බෝග වගා කරන්න පුළුවන් වුණා. මඤ්ඤොක්ක විතරක් නෙවෙයි, වත්තෙ තිබ්බ්ච අනෙක් පඳුරුත් ඒ වගේම හොඳට එලදාවට හැදුණා. හැබැයි මේ වගේ එක් කාරණයක් මගේ අත්දකීමෙන් කිව්වට, මේවා කොයි කොයි ආකාරයෙන් වෙනත් ඉඩම්වලට කරල තියෙනවද කියල කියන්න පුළුවන් කමක් නෑ. මොකද මේවට එකක් නෙවෙයි විවිධාකාර ක්‍රම තියෙනවා. මේ වගේ දේවල් අපි කොච්චර නෑ කිව්වත් නැත්තෙ නෑ තියෙනවා.

ඒ වගේ කොඩිවිනයක් ගැන නොවුණත්, මිනී අළු සම්බන්ධ තවත් අත්දකීමක් තමයි මේ හෙළි කරන්නේ. හැබැයි මේක මම පැවිදි වුණාට පස්සෙ සිද්ධ වෙච්ච දෙයක්. මම ගිහි කාලෙ වාසය කරපු වත්ත පිටියෙම තමයි දැන් තියෙන මේ අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානය ඉදි කරල තියෙන්නේ. පැවිදි වෙච්ච අලුත මේ භූමිය පන්සලක් විදියට සකස් කරන්න, බැකෝ යන්ත්‍රයක් ගෙනල්ල තවත් පිරිස් යොදවල පස් කපල සුද්ධ පවිත්‍ර කළා. එතකොට මේ භූමියේම කෙළවරක අපේ තාත්තගෙයි, ආච්චි අම්මගෙයි වල නොබැඳපු සොහොන් පිහිටල තිබුණා. ආච්චි අම්මගෙ භෂ්මාවශේෂ තැන්පත් කරපු මුට්ටියකුත් ඒ සොහොනෙ තිබුණා. මොකද සාමාන්‍යයෙන් අද වගේම එදත් පවුලෙ කෙනෙක් නැතිවුණාම, තමන්ගෙ කෙනෙක් නිසා ඒ අයගෙ භෂ්මාවශේෂ වත්ත කොනක වළදාන්න සමහර අය පුරුදු වෙලා හිටියා.

කොහොම හරි බැකෝ යන්ත්‍රයෙන් මෙතන සුද්ධ කරන කොට අර සොහොනත් කැඩිල ආච්චි අම්මගෙ මිනී අළු වළදාල තිබ්බ්ච මුට්ටියත් අහුවුණා. ඒ වෙලාවෙ මමත් ළඟ හිටියා. දැන් මට සමාධියට පේනවා, එක පාරටම මියගිය ආච්චි අම්ම කොණ්ඩෙත් කඩාගෙන අවුල් කරගෙන ''මොන අපරාධයක්ද මේ කරන්නෙ! මගේ අළු ටික'' කියන මහා ශෝකාකූල හැඟීමකින් ඉන්නවා. බලන කොට මේ ආච්චි අම්ම මැරිල ගන්ධබ්බ ශරීරයෙන් තමයි අර විදියට පෙනී හිටියෙ. එතකොට උන්දෑ නැති වෙලත් අවුරුදු ගණනාවක් වෙනවා. පස්සෙ මම මොකද කළේ, කාටවත් හානියක් නොවෙන්න, ඒක ගෙනිහින් දොල පාරකින් එහා සොහොන් පිටියකට විසි කළා.

මේ කාරණය මේ විදියට සඳහන් කළේ තවත් වැදගත් කාරණයක් පෙන්වා දෙන්න. කලින් කිව්ව වගේ යම්කිසි පවුලක කවුරු හරි ඥාතියෙක් මියගියාම, ඒ කෙනාගෙ භෂ්මාවශේෂ (මිනී අළු) මුට්ටියක තැන්පත් කරල සොහොනක් බඳින්න හෝ වෙනත් ක්‍රමයකට ගෙදර තියාගන්න සමහර පිරිස් කැමතියි. නමුත් මේකෙන් තේරුම් ගන්න ඕන, ඒ මියගිය කෙනා යක්ෂ, පෙරේත වගේ දුගති ස්ථානයක හෝ ඥාති ප්‍රේත කියන යම් කිසි ගන්ධබ්බ ස්ථානයක ඉන්නව නම්, මැරිලත් තමන්ගෙ මිනී ඇටකටු ටිකට පෙරේත කමින් ඒක ආරක්ෂා කරගන්න රැකවල්ලාගෙන ඉන්න පුළුවන් බව. ඒක ඉවත් කරනවට ඒ අය කැමති නෑ. මහා දාහයකින් ඒක ආරක්ෂා කරනවා. මැරිල අවුරුදු ගණනාවක් ගිහිල්ලත් මේ විදියට මිනී අළු ටිකවත් දාල යන්න බැරිව ඉන්නවයි කියන්නෙ මොන තරම් තණ්හාවක්ද? **මේ ලෝක සත්වයා මිය ගියාට පස්සෙ මිනී අළුවලටත් මෙච්චර පෙරේතකම් කරනව නම්, ජීවත්ව ඉඳෙද්දී පරිහරණය කරපු භාණ්ඩවලටත් කොයි තරම් නම් ආසාවෙන් අරක් ගෙන ඉන්නව ඇත්ද? කොයි තරම් නම් දාහයකින් මේව දාල යන්න බැරිව අනන්ත දුක් විඳිනව ඇත්ද?**

මේ නිසා අපි දැනගන්න ඕන, තමන්ගෙ කෙනෙක් වුණත් මියගියාම ඒ අයගෙ ශරීර කොටස් මේ වගේ තමන්ගෙ සීමාවෙ තියාගෙන ආරක්ෂා කිරීම නොගැලපෙන නුසුදුසු ක්‍රියාවක් බව. මොකද තමන්ගෙ කියල නෑ, මළාට පස්සෙ අර වගේ ගන්ධබ්බ ස්ථානයක ඉපදුනොත් ඒ අය තමන්ගෙ අයටත් කරදර කරනවා. ඉතින් ළඟ තියා ගත්තට පස්සෙ ඒකට අරක් ගන්නවා. ඊට පස්සෙ අයින් කරනවට කැමති නෑ.

ඒ වගේම මේකෙන් තවත් වැදගත් කාරණයක් දැනගන්න ඕන. අද සමහර උදවිය, කෙනෙක් මියගියාම ඒ අයගෙ ඇස්, මස්, හදවත, වකුගඩු ආදී ඉන්ද්‍රියන් ඒ අයට පින් සිද්ධ වෙන්න කියල වෛද්‍ය තාක්ෂණයෙන් තවත් අයට බද්ධ කිරීමට පරිත්‍යාග කරනවා. මෙතනදී ක්‍රම 2 ක් තියෙනවා. එකක් තමයි මියගිය කෙනා මිය යන්න පෙර ඒ විදියට තමන්ගෙ ශරීර අවයව දන් දෙන්න කියල අන්තිම කැමැත්තකින් ලියල හරි කියල හරි මැරෙනවා. ඒක ඒ පුද්ගලයා දැනුවත්ව යහපත් චේතනාවකින් කරන නිසා, ඒ වගේ අයගෙ ඒ ශරීර අවයව වෙනත් රෝගීන්ට බද්ධ කිරීමේ ගැටළුවක් නෑ. නමුත් මැරෙන්න පෙර, ඒ වගේ කැමැත්තක් ප්‍රකාශ කරල නොතිබුණ අයගෙ ශරීර අවයවත් ඒ අයගෙ ඥාතීන්ගෙ කැමැත්තට පරිත්‍යාග කරන අවස්ථා අද බොහොමයක් තියෙනවා. ඒ වගේ අවස්ථාවලදී ඒ මියගිය කෙනා යම්කිසි ගන්ධබ්බ ස්ථානයක ඉන්නව නම්, තමන්ගෙ ඒ අවයව ලබාගත් කෙනාට (රෝගියාට) වෛරයෙන්, තරහෙන් කරදර කරන්න පුළුවන්. මොකද මියගියත් තමන්ගෙ දේවල්වලට තියෙන ආසාව අතහැරිල නෑ. හැබැයි මේ කාරණය වෛද්‍ය විද්‍යාවට අහුවෙන්නෙ නෑ. නමුත් මේ වගේ කාරණයක් මට පෞද්ගලිකව දැනගන්න ලැබුණා.

එක්තරා මහත්මයෙක් තමන්ගෙ වකුගඩු දෙකම නරක් වෙලා අක්‍රිය වුණාට පස්සෙ, වෛද්‍ය විද්‍යාවේ බල මහිමයෙන් වෙනත් මියගිය කෙනෙකුගේ වකුගඩුවක් බද්ධ කර ගත්තා. වකුගඩුව බද්ධ කරල ටික දවසක් යන කොට රෑ නින්දෙදි ඔහුට යමෙක් කතා කරල තමන්ගෙ වකුගඩුව දෙන ලෙස කරන ඉල්ලීමක් හැඟෙන්න වුණා. ඔහු ඒක මුලින් එතරම් ගනන් අරගෙන නොතිබුණත්, තවත් ටික දවසක් ගතවෙන කොට මේ තත්ත්වය උත්සන්න වෙලා, අර පුද්ගලයා ඉදිරියේ රෑට ඇවිත් පෙනී ඉඳල, තමන්ගෙ වකුගඩුව දුන්නෙ නැත්නම් කරදර කරන බවට තර්ජනය කරන්න වුණා. මේ සිද්ධිය ඉවසගෙන ඉන්න බැරිම තැන ඒ මහත්තය මේ කාරණය මට ඇවිල්ල කිව්වා. මම ඒක සමාධියට යොමු කරල බලන කොට, මේ වකුගඩුව දීපු මියගිය පුද්ගලයා ගන්ධබ්බ අත්භවයක ඉඳගෙන වකුගඩුව මේ විදියට ඉල්ලන බව පෙනී ගියා. පස්සෙ මොකද කළේ, මේ මහත්තයට පෝය දවසක අට පිරිකරක් අරන් එන්න කියල, ඒ වකුගඩුව ගත්තු පුද්ගලයගෙ නම් ගම් විස්තරත් අහගෙන ඒ පුද්ගලයාට අනුමෝදනාවක් කළා. ඒ කියන්නෙ තමන්ට වකුගඩුව පරිත්‍යාග කරපු මියගිය ඒ පුද්ගලයාට, ඒ කරපු උදව්ව සිහි කරල පින් අනුමෝදන් කළා. ඊට පස්සෙ ඒ ගන්ධබ්බ අත්භවයෙ හිටපු කෙනාට සම්පත් ලැබීම පහළ වෙලා ඒ තත්වයෙන් අත් මිදුනා. ඊට පස්සෙ අර වගේ කරදර කරන්න ආවෙ නෑ.

ඉතින් මේ වගේ **තමන්ගෙ ඥාතියෙක් මිය පරලොව ගියාම, ශාසන න්‍යායට අනුව ඒ පුද්ගලයාට පින් අනුමෝදන් කරල යහපතක් කරල දෙනව මිසක්, ඒ පුද්ගලයගෙ ශරීර කොටස් (භෂ්මාවශේෂ) තමන් සන්තකයෙ තබා ගැනීම සුදුසු නැති බව ධර්මානුකූලව තේරුම් ගන්න ඕන. ඒ වගේම ශරීරාංග බද්ධ කළාම ඒවායේ හිමිකරුවන් වෙලා හිටපු අය මියගිහිල්ල නම්, ඒ අය සිහිකරල දාන මාන පිං කර අනුමෝදන් කිරීමත් ඉතා හොඳයි.**

මේ නිසා අපි දැනගන්න ඕන, බුදුන් වහන්සේ දේශනා කරල තියෙන ථූපාර්හ පුද්ගලයින් හතර දෙනාගේ (බුදු, පසේ බුදු, ආර්ය ශ්‍රාවක, සක්විති රජ) හැර වෙනත් අය මියගියාම ඒ අයගෙ ශරීර කොටස් ගෙවල්වල තියා නොගන්න. ථූපාර්හ පුද්ගලයන් හතර දෙනාගෙ භෂ්මාවශේෂ ධාතුන් වහන්සේලා විදියට වන්දනාමාන පූජා සත්කාර කිරීමට සුදුසුයි කියල දේශනා කරල තියෙන්නෙ, ඒවායින් ලොවට සෙතක් ශාන්තියක් විහිදෙන නිසා. දෙවියන් බ්‍රහ්මයින් පවා ඒවාට වන්දනාමාන කරල යනවා. මේ නිසා මේ කාරණය ඥානවන්තව තේරුම් ගත යුතුයි.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

**සටහන - නීතිඥ චන්දන සිරිවර්ධන**

# නූල් පැන්නුම්, වැල් පැන්නුම්, ඉරි පැන්නුම් ආදියෙන් ලෙඩ රෝග කරදර ඇති වන හැටි

*(පසුගිය කලාපයෙන් - ඉනා බන්ධන, වශී ගුරුකම් ආදියෙන් ලෙඩ රෝග ඇති වන හැටි....)*

වෛද්‍ය විද්‍යාවට හසු නොවූ, මනුස්සයින්ට ලෙඩ රෝග කරදර හදන තවත් පැතිකඩක් තමයි මේ හෙළිදරව් කරන්නේ. කෙනෙක් තමන්ට ඕන විදියට පාලනය කරගන්න අවශ්‍ය වුනාම සිද්ධ කරන, ඒ වගේම අනාදිමත් කාලයක පටන් පැවතෙන ගුප්ත ක්‍රමයක් තමයි මේ නූල් පැන්නුම් (කළු නූල්, තුන් නූල් ආදියෙන් මතුරා), වැල් පැන්නුම් (විවිධ කටුවැල් වර්ග මතුරා), ඉරි පැන්නුම් (බිම ඉරි ගසා මන්ත්‍ර මතුරා ඒ උඩින් පැන්නීමට සැලැස්වීමෙන්) ආදියෙන් කරන්නේ.



මෙතනදී යම්කිසි නූලකින් හෝ වැලකින් මද්දක් කියල එකක් හදනවා. ඒ මද්දට යම් අක්ෂර, ගණ ගැලපීම නිසා හට ගන්නා යම් කිසි ශක්ති විශේෂයක් එහෙම නැත්නම් කිරණ විශේෂයක් මන්ත්‍ර බලයකින් කාවද්දනවා. ඒක දූෂ්‍ය හිතක් මුල් කර ගෙන හට ගන්නා කළු කිරණ විශේෂයක්. නිකන් පිටින් බැලුවට පේන්නෙ නෑ, හරියට සතෙකුට මදු (මද්ද) තියනවා වගේ වැඩක් තමයි වෙන්නෙ. ඉත්තෑවො වගේ සත්තු අල්ලගන්න, උන් යනකොට මද්දක් තියනවා. උං ඒකට අඩිය තිව්වොත් මද්දට කොටුවෙලා, යන යන තැනට මද්දත් එක්ක යන්න වෙනවා. මේ විදියට මදු ගැට ගහල තියනවා වගේ, මන්ත්‍ර බලයෙන් ජීවම් නූලක්, සමහර විට අමනුස්සයොත් එක්කත් බන්ධනය කරල, කෙනෙක් යන එන තැන් බලල පෑගෙන්න තියනවා. එතනින් යනකොට ඒ පුද්ගලයාගේ කකුලේ කිරණ මද්දක් පැටලෙනවා. ඒක උඩින් පැන්නම තමයි ඇඟට වදින්නේ. එහෙම පැටලුනාට පස්සෙ ඒ පුද්ගලයා කොච්චර දුරක් ගියත් අර කිරණ මද්ද නිසා කකුල් දෙකට විලංගු දැම්ම වගේ කොටු වෙනවා. එහෙම නැත්නම් සමහර වෙලාවට අමනුස්ස බන්ධනයක් තිබුනොත් ඒකට කොටුවෙනවා. මෙතනදී අමනුස්සයෙක් සම්බන්ධ වෙන්නෙ කිරණ ශක්තියකින්. බැඳෙන්න නම් ඒ කිරණ ශක්තිය අවශ්‍ය වෙනවා. කිරණ මද්දක් වෙනම හදල තියන ක්‍රමයකුයි, අමනුස්ස බන්ධනයක් සම්බන්ධ කරන ක්‍රමයකුයි ක්‍රම දෙකක් තියෙනවා. පුද්ගලයා හරහට ඕක උඩින් යන කොට කිරණ ශක්තිය ඇඟට වැදිල මද්දට පැටලෙනවා.

මෙතනදී පූට්ටු, හිර පූට්ටු.... ආදී වශයෙන් කියන මන්තර වචන තියෙනවා. හිර වෙලා තද වෙන්න කියන එක තමයි මේකෙන් කියන්නේ. සමහර වෙලාවට නාගයෝ දපන දාන්නත් මේ වගේ මන්තර පාවිච්චි කරනවා. ඕං නමෝ අහසෙන් යුක්තක් (ප්‍රදේශයක්) බැන්දෙන් පොලොවෙන් යුක්තක් බැන්දෙන් සතර මණ්ඩලයෙන් සතර යුක්තක් බැන්දෙන් නාග රාජයා තා බැන්දෙන්.... ආදී වශයෙන් නයෙක් බඳින ක්‍රමයක් තියෙනවා. මේ වගේ බන්ධන මන්තර කියල වැල් පැන්නුම්, ඉරි පැන්නුම් වශයෙන් බන්ධනය කරල මනුස්සයෝ හිර කරන ක්‍රමයකුත් තියෙනවා. වැල එතැනම තියෙද්දී කිරණ වළල්ලට පුද්ගලයා කොටු වෙනවා. හරියට ගඟේ ගහගෙන යන මිනිහෙකුට අල්ලන්න මොකක් තිබුනත් අහුවෙච්ච එක බදා ගන්නවා වගෙයි, පැගිච්ච හැටියෙම බන්ධනය වෙන්න තමයි මේවා ජීවම් කරල තියෙන්නේ.



අමනුස්සයෙක් බන්ධනය කළොත් උං කොච්චරවත් බලා ඉන්නවා, කවුද යන්නෙ කියල පැනල අල්ලගන්න. මෙතනදී අමනුස්සයෙක් අහුවෙන්නෙ අපේ තියෙන කිරණ ලෝකයට. ඒ කියන්නෙ මේ හැම මනුස්සයෙක්ගෙම ශරීරය වටා ඕරා වළල්ලක් කියල එකක් පිහිටනවා. ඒකට අහු වෙච්ච ගමන් ඕරා වළල්ලත් එක්ක අමනුස්ස බන්ධනය බැඳෙනවා. මේක පුද්ගලයා යන එන මං බලලයි තියන්නේ. කිරණ මද්දට කකුල් දෙක හිරවුනාට පස්සෙ ඒක කැපෙන්නෙ නෑ. මනෝ කාය නිසා ක්‍රමයෙන් මේක බලවත් වෙනවා. මනෝ කායිකත්වයට බලවත් වෙලා නැගුනම, ඒ මනෝ කාය ආශ්‍රිතව තියෙන භෞතික කය ක්‍රමයෙන් ඒකට අනුව හිර වෙනවා. ඊට පස්සෙ යන්න එන්න බැරිව අතපය කොරවෙන්න පටන් ගන්නවා. විවිධාකාරයෙන් අබ්බගාතයන් බවට පත් වෙනවා. අර පැන්නුමෙන් පස්සෙ හරියට විදුලි සැරයක් ඇඟට වැදුන වගේ කිරණ වළල්ලෙන් තමයි මේක කරන්නේ. ඒක ඇඟට දැනෙන්නෙ නැතිවට කකුල් දෙකටයි, අත් දෙකටයි, බෙල්ලටයි.... මේ ආදි වශයෙන් ඇඟ පුරාම පටලවන්න පුළුවන්. මේ වගේ විවිධ තැන්වලට කිරණ මදු හදන්නත් පුළුවන්. මද්ද හදනකොටම ඒක මන්තරයක් එක්ක ජීවම් කරනවා. හදල ගැස්සුනාට පස්සෙ හැම තැනම විසිරිලා යනවා. සමහර අයගේ ලිංගවලට, හදවතට බැඳෙනවා. එහෙම බැඳුනම සමහර විට ඒවා හිරවෙලා අප්‍රාණික වෙලා යනවා.

**මේ වගේ දෙයක් කෙනෙකුට එල්ල කරල කරන්නේ මොනව හරි දේකින් ඒ පුද්ගලයා අඩපණ කරන්න.** කායික අඩපණ කිරීම්, මානසික අඩපණ කිරීම් කරන කොට ඉස්සෙල්ලම මේක බලපාන්නේ මනුස්සයාගේ කිරණ කයට. ඊට පස්සෙ තමයි භෞතික කයට බලපාන්නේ. **පසු කාලීනව ඒක හොයන්න බැරි ලෙඩක් වෙනවා. හෙව්වට අහුවෙන්නෙ නෑ.** හැබැයි දැන් තියෙන කිරිලියන් කැමරා තාක්ෂණය වගේ දියුණු ක්‍රමයකින් මේ කළු කිරණ මද්ද කියන එක බලන්න පුළුවන්. ඒවායේ තියෙන අඳුරු හිර කිරීම් ඒ කැමරාවට අහුවෙනවා. එහෙම ක්‍රමයකට අහුවුනොත් මිසක් එක්ස් රේ (X–ray) වලටවත් ඒක අහුවෙන්නෙ නෑ. දිවැස් සමාධි නැත්නම් අර වගේ දියුණු කැමරා ක්‍රමයකින් තමයි මේ කිරණ ක්‍රියාවලිය කොහොමද කියල බලා ගන්න පුළුවන් වෙන්නේ. දිවැසට නම් මේ ☞

වගේ දේවල්වලින් පුද්ගලයො හිරවෙලා, බැඳිල ඉන්න හැටි විවිධ මට්ටම්වලින් බලාගන්න පුළුවන්. මේකෙ අවසන් ප්‍රතිඵලය තමයි පුද්ගලයා රෝගියෙක් වීම.

මේ විදියට සමහර විට පුද්ගලයෙකුගේ මනස බඳින්නත් පුළුවන්. **ස්නායු පද්ධතිය බැන්දොත් එහෙම පිස්සෙක් වෙන්නත් පුළුවන්.** සමහර විට මේ පැන්නුම්වලින් පස්සෙ, සමහර අයට ගම රට අතහැරල යන්න සිද්ධ වෙනවා. මොකද එහෙම වුනාට පස්සෙ ඒ පුද්ගලයාට ගමේ රටේ ඉන්න එපා වෙන විදියට මනස හැඩ ගැහෙනවා. **යම් කිසි කෙනෙකුට තවත් කෙනෙක්ගේ ඉඩකඩම් දේපොල අත්පත් කරගන්න ඕන වුනාමත්, ඒ අරමුණෙන් මේ වගේ නීච වැඩ කරන අවස්ථාත් තියෙනවා.**

මේ වගේ පැන්නුම් ක්‍රම විවිධාකාර දේවල්වලට යොදා ගන්නවා. සමහර විට කෙනෙක් පිස්සෙක් කරල විනාශ කරන්නත් මේ වගේ දේවල් පාවිච්චි කරනවා. මොකද සමහර අමනුස්සයො ඉන්නවා, මනුස්සයින්ට එකතු වුනොත් ඒ එකතු වෙච්ච මිනිස්සුත් එක්කම ක්‍රියාත්මක වෙනවා. උදාහරණ විදියට ගත්තොත්, නිකන් ඇවිද ඇවිද රස්තියාදු ගහල මැරිල යන සමහර මනුස්සයො ඉන්නවා. ඒ වගේ කෙනෙක් මැරිල ගන්ධබ්බයෙක් වුනොත්, ඒ ගන්ධබ්බයත් අර වගේ නන්නත්තාර එකෙක්මයි. ගහක් ගහක් ගානෙ ඇවිදිනවා. මේ වගේ ගන්ධබ්බ අමනුස්සයො අල්ලල බඳින මන්තර තියෙනවා. එහෙම අමනුස්සයෙක් වැල් පැන්නුමකට බැඳල පැන්නුවොත්, ඒ අමනුස්සයගෙ ආකර්ෂණය ක්‍රියාත්මක වෙනකොට ඒකට බැඳිච්ච මනුස්සයත් අර වගේම නන්නත්තාර වෙනවා. ඊට පස්සෙ ඒ අමනුස්සයා යන යන තැනට නන්නත්තාර වෙලා පස්සෙන් යනවා. මොකද ඒ ගන්ධබ්බ අමනුස්සයගෙ අදහස් තමයි දැන් අර මනුස්සයට එන්නේ. එතකොට නිකරුනේ රස්තියාදු ගහන්න හිතෙනවා. සමහරවිට දරුණු අමනුස්සයෙක් බැඳල පැන්නුවොත් ඒකට අහුවෙන පුද්ගලයත් දරුණු වෙනවා.

හැබැයි මේ වගේ දෙයක් කරපු පලියට එහෙම වෙන්නෙත් නෑ. ඒ පුද්ගලයටත් ඒ වගේ දෙයක් වෙන්න නම්, අර අමනුස්සයාගේ ගතියට සමාන ගති ලක්ෂණයක් තියෙන්න ඕන. එහෙම වුනොත් තමයි ඒක බලවත් වෙලා ක්‍රියාත්මක වෙන්නේ. මේකට ගති ආකර්ශණය කියල කියනවා. ඒ කියන්නේ සමාන ගතියට සමාන ගතියක් ආකර්ෂණය වෙනවා. ඇවිදින රස්තියාදුකාරයෙකුට ඒ ජාතියේම නන්නත්තාර වෙච්ච අමනුස්සයෙක් බැන්දොත්, ඒ පුද්ගලයාගේ අර ගතිය තවත් වැඩිවෙලා, ගම රට අතහැරල යන්නත් පුළුවන්. මේ නිසා හොඳ සාන්තුවරයෙක් වගේ කෙනෙකුට ඒ වගේ අමනුස්සයෙක් බැඳල වැඩක් නෑ. හැබැයි ඒ පුද්ගලයාව ඇවිද්දවන්න, දරුණු කරන්න ඒකෙන් බැරි වුනත් යම්කිසි ආකාරයක වික්ෂිප්ත භාවයක් ඇති කරන්න පුළුවන්. මේ නිසා රෞද්‍ර මනුස්සයෙකුට රෞද්‍ර අමනුස්සයෙක් බැන්දොත් සමහර විට මරාගෙන මැරෙන්නත් පුළුවන්. තමන්ගෙ දෙමාපියන් පවා මරල දාන්න පුළුවන්. ඒ තරම් හරි භයානකයි. මෙතනදී ක්‍රියාත්මක වෙන්නේ ගතියට ගතිය සම්බන්ධ වීම. ඒ නිසා ගති සම්බන්ධය මේ වගේ වෙලාවකදී අනිවාර්යෙන්ම තියෙන්න ඕන. ඉතින් මේව කරන මිනිස්සු ඒවත් බලල තමයි ඔය වගේ දේවල් බොහෝ කොටම කරන්නේ. යමෙකුගේ හොඳ ගති ගුණ තියේනම්, ඒ වගේ ක්‍රමයකින් ඒ පුද්ගලයා බාහිර අයට අවශ්‍ය විදියට පාලනය කරන්න අමාරු වුනත් යම්කිසි වික්ෂිප්ත භාවයක්, කැළඹීමක් ඇති කරන්න පුළුවන්. මොකද ගති යහපත්නම් පුද්ගලයා පාලනය වෙන්න, ඒ ගති විශේෂයෙන් බලපානවා.

මෙතැනදී මනුස්ස ගතිය, දේව ගතිය කියන දෙක හරි බලවත්. ඒවා සාමාන්‍ය කෙනෙකුට ලේසියෙන් මැඩ පවත්වන්න බෑ. ගති නියත වෙන්නේ මග ඵල ලාභීන්ට. ඒ කියන්නේ ඒ වගේ අයට දේව හෝ මනුස්ස ගතිය අඩු වැඩි වශයෙන් පිහිටනව මිසක්, එයින් මෙහාට පල්ලම් බහින්නෙ නෑ. මේ නිසා ඒ අය අර වගේ පහත් ගතිවලට ගන්න බෑ. ඒ පහත් ගති තියෙන අමනුස්සයෝ බැන්දත් මානසික වශයෙන් බරපතල හානියක් කරන්න බෑ. යම් කිසි වික්ෂිප්ත භාවයක් මිසක් ඊට එහා දිගු කාලීනව මානසික හානියක් කරන්න බෑ. ඕන නම් කයට අසනීප හදන්න පුළුවන්. ඒකත් පුද්ගලයාගේ කර්ම විපාකය අනුව වෙනස් වෙනවා. නමුත් මානසික රෝගියෙක් කරන්න බෑ. මග ඵල ලාභීන් හා සාමාන්‍ය පුද්ගලයන් අතර මෙහෙම වෙනසක් තියෙනවා.

ඊළඟට සමහර වෙලාවට ස්ත්‍රී පුරුෂ බන්ධනයක් කඩන්නත් මේ වගේ දේවල් කරනවා. සමහර විට ස්ත්‍රීන්ට අකමැති අමනුස්සයොත් ඉන්නවා. එහෙම අමනුස්සයෙක් යොදාගෙන කරන නූල් පැන්නීමකින් ස්ත්‍රී පුරුෂ සම්බන්ධය කඩල දාන්න පුළුවන්. එතකොට ඒ පැන්නුමට ලක්වුනේ පුරුෂයෙක් නම්, අමනුස්සයාගේ අර ගති ලක්ෂණ අනුව ඒ ස්ත්‍රිය දකින කොටම දැන් ඒ පුරුෂයාට පෙන්නන්න බැරිව යනවා, බනින්න හිතෙනවා. ඉතින් **පවුලක් වුනත් මේ වගේ නීච වැඩවලින් කඩා කප්පල් කරන්න පුළුවන්.** සමහර විට ඒ පවුලට සම්බන්ධ ගන්ධබ්බ අමනුස්ස නෑයින් විශාල වශයෙන් ඉන්නව නම් සහ ඒ අතර අර වගේ ගන්ධබ්බ අමනුස්සයෙකුත් ඉන්නව නම් උෟට ස්ත්‍රීන් රුස්සන්නෙ නැතිව යනවා. එහෙම කෙනෙක් අල්ලල බැන්දොත් වැඩේ කරන අයට තවත් ලේසියි. මේ වගේ **අමනුස්සයෙකුට යම් කිසි කෙනෙකුගේ ගති ලක්ෂණ රුස්සන්නෙ නැත්නම්, ඒ අමනුස්ස බැඳීමට ලක් වෙච්ච කෙනාටත් ඒ කෙනාව රුස්සන්නෙ නැතිව යනවා.** දෙන්නෙක් ආකර්ශණය කරන්නෙත් මේ වගේම තමයි. ස්ත්‍රීන්ට කැමති අමනුස්සයෙක් බන්දල පැන්නුවොත්, ඒ පැන්නීමට ලක් වෙච්ච කෙනා ස්ත්‍රීන් කෙරෙහි ආකර්ශණය වෙනවා. මේ වගේ විවිධාකාර ක්‍රම තියෙනවා. මෙහෙම බැඳගත්තු සමහර අමනුස්සයින්ට කන්න බොන්න දොල පිදේනි දීල, මන්තරවලින් ගෙන්න ගෙන වැඩ ගන්නවා. එහෙම දොල පිදේනි දුන්නම සමහර අමනුස්ස පිරිස් විශාල වශයෙන් ඇදිල එන්නත් බලාගෙන ඉන්නවා.

හැබැයි මේ වගේ දෙයක් කෙනෙකුට නිකන්ම වෙන්නෙත් නෑ. සමහර පුද්ගලයන්ගේ ග්‍රහචාරය (කර්ම ශක්තිය) දුර්වල වෙන වෙලාවල් තියෙනවා. ඒවා තමයි කර්ම විපාක කියන්නේ. ඒ වගේ වෙලාවක් වුනොත් ඒක ග්‍රහචාරයේ දුර්වල කමකින් පෙන්වනවා. ඒ ග්‍රහචාරය දුර්වල වීමෙන් පෙන්වන්නේ ඒ පුද්ගලයාට නරක විදියට කර්ම විපාකයක් තියෙන බව. ඒ වගේ අවස්ථාවකදී ශරීරයේ තියෙන ආලෝක කිරණ අඳුරු වෙනවා. ඊට පස්සෙ කළු කිරණ තමයි විපාක පරිසරය වශයෙන් හැදෙන්නේ. එතකොට අනන්තරය සකස් වෙලා සමනන්තර - අනන්තර ප්‍රත්‍යය අනුව, අර බාහිරින් කරන අණවින කොඩිවින වගේ දේවල් විපාක විදියට වදිනවා. සමහර අයට ඒක වැඩියෙන් බලපානවා. ඒ නිසා තමයි ග්‍රහ බල අඩු අයට මේ වගේ දේවල් වදිනව කියල කියන්නේ. අපල කාලය කියන්නෙත් ඒක තමයි. එනම් පුද්ගලයෙකුට කර්ම විපාකයක් ඵල දෙන්න තියෙන කාලය. එහෙම අවස්ථාවක් වුනොත්, අර වගේ පැන්නුම් ඉක්මනට වදිනවා. මේ නිසා සමහරු මොකද කරන්නෙ, තමන්ට පාලනය කරන්න අවශ්‍ය කෙනාගේ ග්‍රහචාරය පවා බලල, ඊට අනුව දුර්වල කාලයක මේ වගේ දේවල් කරනවා.

ඒ වගේම සමහර අයගේ ග්‍රහ බලය බොහොම ප්‍රබලයි. එතකොට මනුස්සයා පල්ලෙහා නියරෙ යනවනම්, සූනියන් දේවතාවන් වහන්සේ උඩ නියරෙ යන්නෙ නෑ කියල පැරණි කථාවක් තියෙනවා. ඒ කියන්නේ ග්‍රහචාරය ඒ තරම් බලවත් වුනාම දෙවියෙකුටවත් විපත් කරන්න බෑ කියන එකයි. මොනව කළත් ඒ වගේ දෙයක් ඒ වෙලාවට වදින්නෙ නැතුව යනවා. මොකද එතකොට ඒ පුද්ගලයාගේ සුදු කිරණ ශක්තිය ප්‍රබල වෙනවා.

එතකොට කළු කිරණවලට ඔහුව මෙල්ල කරන්න බැරිව යනවා. ඒ වෙලාවට කොඩි විනයක් හරි මොනව හරි කරල තිබුන නම්, ඒකෙ බලය මැඩ පවත්වන්න ඒ පුද්ගලයාගේ ග්‍රහචාරය අනුව පුණ්‍ය ශක්තියක්, පුණ්‍ය විපාකයක් ක්‍රියාත්මක වෙනවා. පුණ්‍ය ශක්තිය අඩු වෙච්ච කාලයක් වුනොත් තමයි ග්‍රහචාරය දුබලයි කියන්නේ. එතකොට එන්නෙ පාප විපාකයක්. ඒ වගේ වෙලාවට අර වගේ කොඩිවින ආදී විපාකයන් එල දෙන්න උදව් වෙනවා. මොකද ඒ වගේ අවස්ථාවකදී ශරීරයේ වැඩිපුරම තියෙන්නෙ කළු කිරණ. පිටින් වදින්නෙත් අඳුරු කළු කිරණ. ඒ දෙකම ශරීරයට අගුණයි. ඒ විදියට මේ දෙකම එකතු වෙලා ඒ විපාකය එල දෙනවා.

ඊළඟට කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, මේ වගේ වැල් පැන්නුම් ආදිය එල්ල කරල කරපු අයට අමතරව වෙනත් අයටත් බලපාන්න පුළුවන්ද කියල. කෙටියෙන් කියනව නම් පිළිතුර පුළුවන් කියන එකයි. ඒක වෙන්නෙ මෙහෙමයි. යම් කිසි කෙනෙකුගේ නමකට ජීවම් කරල පැන්නුම කළොත් සහ එකම නම තියෙන කිහිප දෙනෙක් හිටියොත්, සමහර වෙලාවට අර කලින් කියපු වගේ කර්ම ශක්තිය අනුව අනෙක් පුද්ගලයින් වුනත් ඒ වැල් මද්ද උඩින් පැන්නොත් ඒක වදින්න පුළුවන්. එහෙම නැතිව එල්ල කරපු කෙනාටම වදින්නෙ, ඒ පුද්ගලයාගේ ලේ ටිකක්, කෙස් ගහක්, නියපොතු කෑල්ලක් වගේ දෙයක් අරගෙන ජීවම කළොත් තමයි. ඒ විදියට ජාන සම්බන්ධ කරල කළොත් නම් වෙන කෙනෙකුට වදින්නෙ නෑ. නමුත් නමට එල්ල කළාම එකම නම හා වාසගම තියෙන අය තව හිටියොත් ඒ අයටත් බලපාන්න පුළුවන්. එහෙම වෙච්ච අවස්ථාත් අත්දකින්න තියෙනවා. (එවැනි සිදුවීම් ඉදිරියේදී අභයරතනාලංකාරය තුලින් බලාපොරොත්තු වෙන්න) හැබැයි එහෙම වෙන්නෙ බොහෝ විට කෙටි නම විතරක් පාවිච්චි කරල ජීවම් කරන අස්ථාවලදී තමයි. මොකද කෙටි නමකින් බොහෝ දෙනෙක් ඉන්න පුළුවන්. නමුත් සම්පූර්ණ නම, වාස ගමත් එක්ක දාල ජීවම කළොත්, ඒ සම්පූර්ණ නමින් ඉන්න තවත් පුද්ගලයො අඩු නිසා ඒ පුද්ගලයාටම එල්ල වෙන්න පුළුවන්. එහෙම නැතුව එකම නමින් කිහිප දෙනෙක් හිටියොත් ඒක බෙදිල යනවා. උදාහරණ විදියට කළුවා, චූටියා... ආදී වශයෙන් කෙටි නමකට ජීවම කළොත්, ඒ නම තියෙන අය සමාජයේ ඕන තරම් ඉන්නවා. එතකොට අර බන්ධනය නිසා වන ආකර්ශනය හෝ විකර්ශනය ඒ අයටත් බලපානවා. හැබැයි අර කියන කර්ම ශක්තියට යටත්ව.

ඒ වගේම මේ විදියට නමට එල්ල කරල පැන්නුම් නොකළත්, ඒ පැන්නුමට හසුවන වෙනත් අයටත් එක්තරා මට්ටමකින් ඒක බලපාන්න පුළුවන් අවස්ථාත් තියෙනවා. මොකද ඒකට යොදා ගන්න අමනුස්ස බන්ධන, කළු විස කිරණ ආදිය නිසා කර්ම විපාකත් සම්බන්ධ වෙලා යම් කිසි බලපෑමක් වෙන්න පුළුවන්. මේ වගේ පැන්නුම් කරන කොට බොහෝ විට ඉස්සෙල්ලාම පනින පුද්ගලයාට වදින්න තමයි තියන්නේ. ඒ වගේම සමහර අය අතර මතයක් තියෙනවා, සපත්තු සෙරෙප්පු දාගෙන ගියොත් වැල් පැන්නෙව්වට වැඩක් නෑ, හරියට පතුල ස්පර්ශ වෙන්න ඕන කියල. සමහර විට එහෙමත් වෙන අවස්ථා තියෙනවා, නැත්තෙ නෑ. (එවැනි අවස්ථාවන් සම්බන්ධ අද්දැකීම් ඉදිරියේදී අභයරතනාලංකාරය තුලින් බලාපොරොත්තු වෙන්න)

**ඊළඟට මේ වගේ කරන සමහර පැන්නුම් බොහොම භයානකයි.** උදාහරණ විදියට කාන්තාවක් මාස් සුද්දිය හැදිල ඉන්න අවස්ථාවක, ඒකට ගැලපෙන අමනුස්සයෙක් බැඳල තිව්වොත් ලේ යාම නතර කරන්න බැරිව යනවා. මේ වගේ පැන්නුම්වලට රත් නිවිතිය දණ්ඩ මතුරල තියනවා. එහෙම තිව්වට පස්සෙ ඒවට සම්බන්ධ යක්ෂ අමනුස්ස කොට්ඨාශයන් බැල්ම දා ගන්නවා. යම් කිසි ස්ත්‍රියක් ඒක උඩින් පැනල ගියොත් ඇගේ ගර්භාෂය අර අමනුස්සයින් විසින් අල්ල ගන්නවා. ඊට පස්සෙ ඒ නිවිති දණ්ඩෙන් තමයි ඒක පාලනය වෙන්නේ. ඒ කියන්නෙ නිවිති දණ්ඩ අරගෙන දියේ බැන්දොත් වක්කඩ කැඩුව වගේ ලේ පිටවෙන්න පටන් ගන්නවා. ඊට පස්සෙ රෝහල්ගත කළාම, ඒ ගැන සෝදිසියෙන් බලන් ඉඳල ඒ පැන්නුම කරපු අය මොකද කරන්නෙ නැවතත් ඒ නිවිති දණ්ඩ දුමේ දාල තියනවා. එතකොට නැවතත් ලෙඩේ හොඳ වෙනවා. ගෙදර ආවට පස්සෙ නැවතත් අර නිවිති දණ්ඩ දියේ බැන්දම ලෙඩේ නැවතත් හැදෙනවා. මේ විදියට දිගටම කළොත් අන්තිමට මුළු ශරීරයම දියවෙලා, කෘෂ වෙලා ගිහින් පුද්ගලයා මරණයට පත්වෙන්නත් පුළුවන්. එතකොට මෙහිදී රත් නිවිති දණ්ඩෙ තියෙන විශේෂ කිරණක්, රසායනයක් මුල් වෙලා තමයි අර අමනුස්සයො බැඳෙන්නේ.

මේ විදියට සමහර ශාකවල ආකර්ශණ බලයක් තියෙන බව ඔප්පු කරල පෙන්වන්න පුළුවන් අවස්ථාත් තියෙනවා. උදාහරණ විදියට යම් කිසි කෙනෙක් මෝල් ගස් දෙකක් තමන්ගෙ කිහිලි දෙක අතරින් අත් දෙකට අරගෙන සමාන්තරව සමබර කරගෙන සිටින අවස්ථාවක, ඒ මෝල් ගස් දෙක අතරින් දුටු සතුටු පැලයක් ඇල්ලුවොත්, බාහිර බලපෑමකින් තොරවම ඒ මෝල් ගස් දෙක ඇවිත් එකට සට්ඨනය වෙනවා. අවශ්‍ය නම් ඒක කරල බලන්නත් පුළුවන්. දුටු සතුටු ගහේ කිසි විසක් නෑ, හැබැයි ආකර්ශන බලයක් තියෙනවා. පවුල්වල සමගිය ඇති කරන්න, වසඟ කරන්න මේ ශාකය යොදා ගන්නවා. දුටු සතුටු කියන්නෙත් දැක්ක ගමන් සතුටු වෙනවා කියන එක. පද නිරුක්තියෙත් ඒ අර්ථය ගැබ්වෙලා තියෙනවා. කාම සමගියක් නෙවෙයි මේකෙන් පෙන්වන්නේ, හිතවත් කමක්. සර්වජන වශියටත් මේක යොදා ගන්නවා. ඒක නරක පැත්තක් නෙවෙයි.

ඊළඟට තවත් ප්‍රසිද්ධ ශාකයක් තමයි නගා මැරූ අල කියල කියන්නේ. එකම පවුලේ අයියයි නංගියි කැලේ ඇවිදින්න ගිය වෙලාවක, නංගි අයියගෙන් බුලත් විටක් කන්න හුණු ටිකක් ඉල්ලුවාම, බිම ඇනල තිබ්ච්ච කඩුව අරගෙන හුණු කිල්ලෝටයට දමල දුන්නු හුණු ටිකෙන් නංගි විටක් කාපු ගමන් මත්වෙලා, අයිය කියල දන්නෙ නැතිව තමන්ගේ සහෝදරයව වැළඳ ගත්තලු. මේකි මහ වෙසඟනක් වගේ කියල අයියට තරහ ගිහින් කඩුවෙන් කොටල නංගිව මැරුවලු. නමුත් පස්සෙ කාරණය හොයල බලද්දී නංගිගේ වරදක් තිබිල නෑ. අර කඩුව ඇනල තිබුනෙ මේ කියන අල වර්ගයට. ඒ අලේ ඉස්ම ටිකක් අර හුණුවලට මිශ්‍ර වෙලා තිබුණා. ඒකෙන් තමයි ඒ විදියට මානසිකත්වය විකෘති වුනේ. මේ අල වර්ගය ගත්තම, ස්ත්‍රී පුරුෂ කියල එකම අලයේ කොටස් දෙකක් තියෙනවා. ඒ දෙක කොච්චරවත් ළං වෙච්ච ගමන් එකට බැඳෙනවා. මේවායේ තියෙන ඖෂධ ශක්තියත්, මන්තර බලයක් නැතුවම ගන්න පුළුවන්. තාවකාලිකව හරි ඒකෙනුත් මනස වික්ෂිප්ත කරන්න පුළුවන්. මේ වගේ මන්තර බලයක් නැතිවමත් සමහර ශාකවලට ආකර්ශන ශක්තියක් තියෙන බව මෙයින් ඔප්පු වෙනවා.

**දැන් මේ වගේ කාරණා හෙළි කළේ, පුද්ගලයන් තමන්ට ඕන විදියට පාලනය කරන මේ වගේ නීච වැඩවලින් වෙන විනාශය පෙන්වා දෙන්නත්, ඒ සම්බන්ධයෙන් ජන සමාජය දැනුවත් වෙන්නත් ඕන නිසයි. ඒ වගේම මේවා කරන අයට ඉදිරියේදී විඳින්න සිද්ධ වෙන පාප විපාකයන් මහා බරපතල බවත් දැන ගන්න ඕන.** මේ වගේ අපරාදයන් සමාජයේ සැඟවිලයි තියෙන්නෙ. මේ නිසා ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙලා මෙලොව පරලොව අභිවෘද්ධිය සලසා ගන්න උත්සාහ කරන්න.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

**8 වන කොටස**

යම්කිසි සත්ත්වයෙක් කරපු පාපයන්ට විපාක විඳින කොට ඒකෙන් ලෝකෙට වන්දි ගෙවන්නෙ කොහොමද කියන කාරණය තමයි මේ ලිපියෙන් ඉදිරිපත් කරන්නේ. ලෝකයේ සත්තු විවිධාකාරයි. සමහරක් සතුන්ගෙ ශරීර බොහොම ලස්සනයි, ප්‍රියමනාපයි. තවත් සමහර සතුන්ගෙ කටහඬ බොහොම මිහිරියි, ප්‍රියයි. තවත් සමහර සතුන්ගෙ කය බොහොම සිනිඳුයි, ස්පර්ශය ප්‍රියයි. එතකොට යම්කිසි සතෙක් දැන් තිරිසන් වෙලා ඉපදිලා ඉන්නෙ පෙර කරපු පාප විපාකයක ප්‍රතිඵලයක් වශයෙන්. ඒ පාප කර්මයන් කරන්න උපයෝගී කරගත්තෙ ඇස, කන, නාසය, දිව, ශරීරය, මන කියන මේ ඉන්ද්‍රියන් හය මගින් ගෝචර කරගන්නා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම කියන මේවා තමයි. මේ ඉන්ද්‍රිය හය පාවිච්චි නොකර මේ ලෝකෙ කිසිම කෙනෙකුට පාප කර්මයක් කරන්න බෑ. එතකොට බුදු දහමේ පෙන්වා දෙන්නේ හේතුඵල දහම් රටාවක්. හේතුවට අනුකූලයි ඵලය. එහෙනම් කෙනෙක් මේ හය පාවිච්චි කරල ලෝකයට අවැඩක් අසාධාරණයක් කෙරුව නම් දැන් ඒ හයෙන්ම වන්දි ගෙවන්නත් ක්‍රමයක් යෙදෙනවා. දැන් මේ හයෙන් වන්දි ගෙවන ක්‍රමය එකින් එක සැකෙවින් විග්‍රහ කරල බලමු.

යම්කිසි සතෙක් වේදනාවෙන් කෑ ගහන කොට ඒ වේදනාව දැකල, අහල ලෝක සත්වයින්ට බොහෝ කොට අනුකම්පාවක් ඇති වෙනවා. සතෙක් අනාථවෙලා කෑ ගහන කොට ''අනේ අපොයි! අනේ පවු! අහිංසක සතා. .....'' මේ ආදී වශයෙන් අනුකම්පා සහගත හැඟීමක් එනවා. ලෞකික අනුකම්පාවක් නමුත් ඒක ලෝකයට යහපත්. ලෞකිකව බැලුවම ඒක කරුණාව මෛත්‍රියට අයිතියි. දුක් විඳින සත්තු දැකල මනුස්සයාගේ හිත තාවකාලිකව හරි මෘදු වෙනවා. උන්ගෙ විලාප සද්දය ඇහෙන කොට සිත්වල කරුණාවක් දයාවක් ඇති වෙනවා. ඒක ස්වභාවයෙන්ම ලෝකයට විහිදෙනවා. එහෙනම් සතෙකුගෙ හඬ අහල මනුස්සයින්ගෙ සිත්වල තාවකාලිකව හෝ යහපත් චේතනාවන් හට ගන්නවා කියන්නෙ, අර ශබ්දය පාවිච්චි කරල ලෝකයට කරපු විපාකයට වන්දි ගෙවීමක් එයින් සිද්ධ වෙනවා. හඬෙන් එදා කරපු විපාකයට දැන් වන්දි ගෙවනවා. මේ එක ක්‍රමයක්.

ඒ වගේම තවත් සමහර සත්තු ඉන්නවා මහා භයංකාර රෞද්‍ර ශබ්ද පිට කරන. උදාහරණ විදියට උළම කියන සතා



ගත්තොත් උගේ හඬට මිනිස්සු භයයි, බොහොම භයංකාර හඬක්. ඒකෙ ප්‍රියමනාපයකුත් නෑ, අනුකම්පාවකුත් නෑ. ඒකටත් හේතුවක් තියෙනවා. ඌ භයවෙලා ලෝකෙට පෙන්වන්නේ යම්කිසි කරදරයක ලකුණක්. උගේ විපාකයේ හැටියට භයානක දේ භයානක බව පෙන්වන්න වෙනවා. හැබැයි දැනගෙන කරනවා නෙවෙයි. විපාකය ගෙවන හැටි. එදා මිනිස්සු බොරුවට භය ගැන්නුවට අද ඇත්තටම බයගන්වන්න වෙනවා. එදා තොපි මරනව කියල අනුන්ගෙ ඇඟේ ලේ උණු කරල බොරුවට බය ගන්වල ගියත්, අද තොපි ඇත්තටම මැරෙනව කියල භයානකකම කියන්න ක්‍රමයක් සකස් වෙනවා. උගේ හඬින් නිකන්ම භය වෙනව නෙවෙයි. ලෝකයට මොනව හරි කරදරයක් වෙන බවත් දැනුම් දෙනවා. උගේ මාධ්‍යයෙන් ඒක කරනවා. ඉතින් මිනිස්සු ඒ වගේ වෙලාවට භයවෙලා හරි මොනව හෝ පින් දහම් කරනවා, ඊට ප්‍රතිකර්මයක් කරගන්නවා. සමහරු ඒ වගේ කාලවලට ගම්මඩු නටනවා, සාංඝික දානයක් හදල ඒක ගම වෙනුවෙන් දෙනවා. බලු කපුටු දාන දෙනවා. කපුටො, කැරලා වගේ සත්තු අඬන කොටත් එහෙමයි. අපි පෙර කරපු මොනව හරි කර්මවලට ප්‍රතිචාර ලැබෙනවා.

මේ වගේ සමහර සතුන්ගෙ භයංකාර අමිහිරි ශබ්ද නිසා මිනිස්සු තාවකාලිකව හරි යහපත කරන්න පෙළඹෙන නිසා ඒ සත්තු ශබ්දයෙන් විපාකයට වන්දි ගෙවනවා. සමහර වෙලාවට මොණර කෑ ගහනකොට එන ගොරහැඬි සද්දෙ හරි භයානකයි. සතා ලස්සන වුණාට සද්දෙ භයානකයි. ඒ සද්දෙට සර්ප බිත්තරත් පුපුරනවලු. ඒකෙන් සර්ප පැටව් විනාස වෙන්න හෝ සීමිතව වැඩීම වෙන්න පුළුවන්. ඒක සමහර විට මනුස්සයාගෙ හොඳට වෙන්නත් පුළුවන්. මොනවයින් හරි ඒ සතාගෙ හඬේ නරකක් කියල අපි හිතුවට ඒකෙ වාසිදායක පැත්තකුත් තියෙනවා. හැබැයි ඒක අපි හිතල කරන එකක්වත්, අපේ ප්‍රාර්ථනාවක්වත් නෙවෙයි. ස්වභාවයෙන්ම සිද්ධ වෙන දෙයක්. එතැනත් ඒ සත්තු කර්ම විපාකයක් තමයි ගෙවන්නේ.

මේ වගේ කාරණාවලදී දිට්ඨ මංගල, සුත මංගල ආදී වශයෙන් ධර්මයේ එන, දැනගන්න ඕන තවත් වැදගත් දෙයක් තියෙනවා. (දිට්ඨ - ඇසට පෙනෙන, සුත - කනට ඇහෙන, මුත - නාසයට, දිවට, ශරීරයට දැනෙන) බෞද්ධයෝ වශයෙන්, යමක් සිද්ධ වුනේ අහවල් සතා දැකපු නිසයි, කෑ ගහපු නිසයි ආදී වශයෙන් කියල දෘෂ්ටියට වැටෙන්නෙ නැති වෙන්න ඕන. නමුත් බෞද්ධයෝ දිට්ඨ මංගල, සුත මංගල කියන ඒවා ගණන් ගන්නෙ නෑ කියල, මේ කාරණය අද පටලවා ගෙන වරද්දගෙන තියෙනවා. ඒ කියන්නෙ යමක් දැකපු නිසයි, අහපු නිසයි ඒක වුණේ කියල ගණන් ගන්නෙ නැතිලු. (ඒක තමයි අද දිට්ඨ මංගල, සුත මංගල විදියට ☞

ගණන් ගැනෙන්නෙ) බෞද්ධයෝ **කර්ම ශක්තිය නම් ගණන් ගන්නවා. නමුත් ඒක තේරුම් ගන්න බැරි අය කියනවා අර සතා දැක්ක නිසයි, කෑ ගහපු නිසයි තමන්ට මේක වුණේ කියල.** ගමනක් යන්න පිටත් වෙන කොට හූනෙක් චුක් චුක් ගෑවොත්, කාලකණ්ණි හූන හින්ද තමයි මට මේක වුණේ කියනවා. ඒව සුත අවමංගල කියල මිනිස්සු හිතනවා. කුකුලෙක් හරියට වෙලාවට ඇඬලුවොත් රත්තරන් කුකුල, ඌ වෙලාවට ඇඬලුව නිසා තමයි මම දිනුවෙ කියනවා. ඒක සුත මංගලයක් විදියට අරගෙන මෝඩකමට, ඒ නිසා ඒක සිද්ධ වුනයි කියනවා. අද යනකොට ලස්සන තරුණ කාන්තාවක් තමයි මගේ ඉස්සරහට හම්බ වුණේ, හරි වාසනාවන්ත කෙල්ල නිසයි මම දිනුවෙ කියල ඒක දිට්ඨ මංගලයක් විදියට අරගෙන ඒ නිසා වුණයි කියනවා. නමුත් මේ දේවල් තමන් විසින් කරපු පිං පව්වල ප්‍රතිඵල දකින ලක්ෂණ ක්‍රමයක් විතරයි. එතකොට **බෞද්ධයො නම් දකිනවා, අද මේ ලක්ෂණය මෙහෙම පහළ වුණේ තමා විසින් කරන ලද යහපත් හෝ අයහපත් දෙයක ප්‍රතිඵලයක් නිසා කියල. එහෙම නැතිව ඒක දැකපු නිසා, අහපු නිසා ඒ දේ සිද්ධ වුණා නෙවෙයි.**

ඉතින් මේ කාරණය දකින්නෙ නැතිව, හුඟ දෙනෙක් දිට්ඨ මංගල, සුත මංගල ගණන් ගන්නෙ නෑ කියල වැරදි ආකල්ප ගන්නවා. නමුත් එහෙම ගන්න ගියාම ධර්මය කපන්න සිද්ධ වෙනවා. මොකද බුදුන් වහන්සේත් බුදු වෙන්න පෙර මේ වගේ දේවල් බැලුවා. මම බුදු වේ නම් මේ පාත්‍රය උඩු ගං බලා යාවයි කියල පාත්‍රය පා කළා. ඒ වගේම උන් වහන්සේ සිහින දැක්කා, සිහින තේරුවා. තෝරල හරියටම මෙන්න මේ විදියට දකින්නේ, මෙන්න මේ ආකාරයෙන් වෙන නිසයි කියල ප්‍රකාශ කළා. දණක් වට කරගෙන පණුවො ගොඩක් ඉන්න සිද්ධියක් හීනෙන් දැකල, උපාසක උපාසිකාවො ගිහි ශ්‍රාවක පිරිස් හැදිල තියෙනවයි කියන කාරණය උන් වහන්සේ තේරුවා. අසූචි නොගාගෙන අසූචි වලක එහා මෙහා සක්මන් කරනව දැකල, සම්පත් අසීමිතව හම්බ වුණත් ඒ එකක්වත් බදාගන්නෙ නැතිව උන් වහන්සේ ජීවත් වෙන බව තේරුවා. මේ ආදී වශයෙන් උන් වහන්සේ සිහින තේරුවා. දැන් හීන තේරුවාම දිට්ඨ මංගල වෙනවයි කිව්වොත් ඒක හරිද? එතකොට උන් වහන්සේ බුදු වෙන්න ඔන්න මෙන්න කියල තියෙද්දිත් මේව දැකල තෝරල තියෙනව නම් ඒක වැරදිද? ඒව නැහැයි කියල අපට කපල දාන්න පුළුවන්ද? ඒකෙ ප්‍රතිඵල තිබුණෙ නැද්ද?



බුදුන් වහන්සේ මේ වගේ දේවල් ගණන් ගන්න එපා කිව්වෙ නෑ. සමහරු මේක වරද්ද ගෙන තියෙනවා. ඒව ඇත්ත නමුත්, ඒ වගේ කාරණාවලට, සිද්ධ වෙන දේවල් භාර දෙන්න එපා කියලයි උන් වහන්සේ කිව්වෙ. ඒ නිසා උන්වහන්සේ හීන දැක්ක නිසා උපාසක උපාසිකාවන් උන් වහන්සේ වටා රොක් වුණා නෙවෙයි. හීන දැක්කෙ නැතත් ඒක වෙනවා. හීනෙන් කියන්නෙ ඒක දැනගන්න සංඥාවක්, සංකේතයක් විතරයි. අසූචි ගාගන්නෙ නැතිව අසූචි උඩ සක්මන් කරන හීනෙ දැක්ක නිසා නෙවෙයි උන් වහන්සේට සම්පත් ගලාගෙන ආවෙ. නමුත් කවුරු හරි හිතුවොත් ඒක නිසයි ඒක එහෙම වුණේ කියල ඒක වැරදි ආකල්පයක්. ඒක බාහිර හෝ අභ්‍යන්තර ලෝකයේ තියෙන යම්කිසි සංඥා ක්‍රමවේදයක් විතරයි.

ඒ වගේ ඇතැම් උදවිය දිට්ඨ, සුත, මුත..... ආදී වශයෙන් දැනෙන ඒවා මංගල කරුණු හැටියට ගණන් ගන්නෙ ඒ අය කර්ම ශක්තිය ගණන් ගන්නෙ නැති නිසා. ඒක තමයි වෙනස. කර්ම ශක්තිය ගණන් ගන්නෙ නැති නිසා මේකෙන් වුනයි කියල අර වගේ දේවල්වලට වෙච්ච සිද්ධීන් භාර කරනවා. ඒ නිසා තමයි **''කිං කරිස්සන්ති තාරකා''** කියල බුදුන් වහන්සේ දේශනා කළේ. **අපි කරගත්තු පිං පව් අපිට ඵල දෙනව මිසක් තාරකා මොනව කරන්නද කියල දේශනා කරපු කාරණය, තාරකාවලට කිසිම බලයක් නෑ කියල අද වැරදියට අර්ථ නිරූපනය කරනවා.** නමුත් කිව්වෙ ඒක නෙවෙයි. තාරකා නෙවෙයි, තමන් කරපු පිං පව් තමන්ට ඵල දෙනවයි කියන එක තමයි කිව්වෙ. එහෙම නැතිව තාරකාවලට බලයක් නෑ කියලවත්, ඒවායින් යමක් පෙන්නුම් නොකරන බවක්වත් කිව්වෙ නෑ. ඒ වගේ **සිද්ධිවලින් යමක් පෙන්නුම් කරන කොට, ප්‍රයෝග සම්පත්තිය ක්‍රියාත්මක කරල තමන් දැන ගන්න ඕන, කරදරවලින් ගොඩ ඇවිත් යහපත උදා කරගන්න.** මේ කාරණාවල තියෙන වැදගත්කම ඒකයි.

ඒ වගේම තවත් සමහර සත්තු කෑ ගහන කොට කනට හරිම මිහිරියි. කුරුල්ලො කෑ ගහන කොට අපි කියනවා උන් සිංදු කියනවා කියල. එහෙම සාහිත්‍ය රසයකුත් මතු කරනවා. නමුත් ඇත්ත වශයෙන්ම උන් සංතෝසෙට නෙවෙයි බොහෝ කොටම කෑ ගහන්නෙ. එක්කො බඩගින්නක් හැදිල, එහෙම නැත්නම් හයවෙලා මේ වගේ අසහනයකට තමයි උන් කෑ ගහන්නෙ. නමුත් උන් වේදනාවෙන් කෑ ගැහුවට ඒක මනුස්සයාගෙ කනට ප්‍රිය මනාපයක් ගෙනත් දෙනවා. උදාහරණ විදියට පැණි කුරුල්ලො අඬන කොට, ලේන්නු අඬන කොට, කොහා අඬන කොට, කුකුලා අඬලන කොට මිනිස්සුන්ට හරි ප්‍රියයි. මිනිස්සු බොහොම සන්තෝසෙන් ඒවා අහගෙන ඉන්නවා. ඒ වගේ නාද රටාවන් විවිධ විනෝදයන් සඳහා, මානසික ආතතිය අඩු කර ගැනීම සඳහා කියල විවිධ දේට යොදා ගන්නවා. එතකොටත් දූෂිත වෙලා, රෞද්‍ර වෙලා, ශෝකාකුල වෙලා තියෙන මනුස්ස හිත්වලට තාවකාලිකව හරි සතුටක් සුවයක් දැනෙනවා. ලෞකික වුණත් ඒක යහපතක්. මේ තමයි ශබ්දයෙන් වන්දි ගෙවන තවත් ක්‍රමයක්. මේ වගේ සත්තුන්ගෙ කෑ ගැසීම් සද්ධවලින් පවා උන් ණය ගෙවනවා.

අනෙක් කාරණය තමයි සමහර සත්තු කෑ ගහන කොට අපිට ඇහුනෙ නැති වුණාට, උන් මහා වේදනාවෙන් කෑ ගහන කොට නැගෙන ශබ්දය, උන් පෙර අත්බැව්වලදී රෞද්‍ර බවින් ලෝකයට සාප කරන්න කරපු රෞද්‍ර හඬට ප්‍රතිවිරුද්ධ හඬක්. ඒ ප්‍රතිවිරුද්ධ හඬ දෙන කොට ඒකෙ ස්වභාවය තමයි රෞද්‍රය කැපිල යාම. රෞද්‍ර හඬේ තිබුණු විපාකය කෑ ගැහීමෙන් කැපෙනවා. මේක අපිටත් දැනගන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා. අපිට මොනව හරි කැක්කුමක් හැදිල උණ ගැනිල කකියන කොට අපි කෙඳිරි ගානවා, කෑ ගහනවා. එතකොට ඒකෙන් පැහැදිලිවම අපිට තාවකාලික නමුත් සහනයක් එනවා. ඒ වෙලාවෙදි අපේ කට කවුරු හරි වැහුවොත් කැක්කුම තවත් වැඩි වෙනවා. වේදනාවෙන් අනේ අම්මෝ.... අයියෝ කියල කෑ ගහනකොට වේදනාව සමනය වීමක් වෙනවා. තමන් පෞද්ගලිකව වේදනාව විඳිනව වගේම ලෝකයාට කරපු රෞද්‍ර හඬේ විපාකය ශෝකාකුල නාදයෙන් ආපසු ගෙවනවා. ඒ නිසා රෞද්‍ර හඬින් ලෝකය විස කළා වගේම අර ශෝකාකුල නාදයෙන්, භයංකර නාදයෙන්, මිහිරි නාදයෙන් ලෝකයට

ආපසු වන්දි ගෙවනවා.

රෞද්‍ර විදියට කෙනෙක් දඟලන කොට බලන් ඉන්න අයගෙ හිත් සැඩ පරුෂ වෙනවා. දුක හිතෙනවා කියන්නෙ සැඩ පරුෂ එකේ ප්‍රතිවිරුද්ධ පැත්ත. රෞද්‍ර විදියට කතා කළාම, ඕක ගහල මරල දාන්න කියල මිනිස්සුන්ට හිතෙනවා. ඊට පස්සෙ ඒ කෙනාම දුක් විඳල අඬනව ඇහෙන කොට අනුකම්පාවක් ඇති වෙනවා. එතකොට රෞද්‍ර බවට පත්වෙලා කෑ ගහන කොට විස කිරණ ශක්තියක් විශ්වයට විහිදවපු එකේ විපාකය, ඒ සතාම දුක් විඳින තත්වයට පත්වෙලා අඳෝනා නගන හඬෙන් කැපෙනවා. තමන් නිසා ලෝකය රෞද්‍ර කරපු එකේ විපාකය දැන් තමන්ට දුක් වෙලා ගෙවන්න වෙනවා. සතෙක් බැගෑපත් වෙන කොට අනෙක් අය අනුකම්පා කරනවා. තමන් කරපු වැඩෙන් අන්‍යයන් කුපිත කරල නැගෙන දූෂ්‍යතාවය දසදහසක් සක්වලටත් විහිදෙනවා. ඊට පස්සෙ තමන් දුක්ඛිත තත්වයට පත්වෙලා බැගෑපත් වෙලා නගන අඳෝනා හඬින් ''අනේ අපොයි'' කියන හැඟීම මනුස්සයට ඇති වෙලා අනුකම්පාවක් එනවා. ඒ අනුකම්පාවෙන් නැගෙන ශක්තියත් දස දහසක් සක්වලට විහිදෙනවා. ඒකෙන් එන්නෙ යමෙකුට අනේ මෙහෙම වෙන්න එපා කියන හැඟීමක්. ඒක ලෞකික වුණත් මෛත්‍රී සහගතයි. සතෙක් වෙලා උපදින්නෙ හැම වෙලාවෙම අඬල වැළපිලා. සතෙක් එක්කො හයට කෑ ගහනවා. නැත්නම් දුකට කෑ ගහනවා. (සන්තෝසයට කෑ ගහන අවස්ථාත් සුළු වශයෙන් තියෙනවා. ඒකෙනුත් මනුස්සයාට චිත්ත ප්‍රසාදයක් ඇති වෙනවා) සතෙකුට බොහෝ කොටම තියෙන්නෙ මේ ක්‍රම දෙක තමයි. මේ ක්‍රමවලින් ශබ්දයෙන් වෙච්ච විපාකය ගෙවනවා. එක්කො චිත්ත ප්‍රසාදයක් ඇති වෙන්න, එහෙම නැත්නම් අනුකම්පාවක් ඇති වෙන්න එහෙමත් නැත්නම් භයානක කරදරයක් අනතුරක් හැඟවෙන්න කෑ ගහනවා. මේ විදියට විපාකයන්ට වන්දි ගෙවන විදියට සතුන්ගෙ නාදය හැදිල තියෙනවා.

මේ නිසා සමහර සත්තු කෑ ගහන කොට මිනිස්සුන්ට මිහිරි වුණාට උන් මිහිරියාවෙන් නෙවෙයි කෑ ගහන්නෙ. පස්විසි බයකින් දුක් ගෙනදෙනව කියලයි ධර්මයේ සඳහන් වෙන්නෙ. උන් මහා දුකක් විඳිනවා. උන්ගෙ කටහඬ හැදිල තියෙන්නෙ ඒ අනුව. නමුත් ඒ හඬ අපට දැනෙන්නෙ සුන්දර ලෝකයක් වගේ. මනුස්සයා රෞද්‍රකමට කෑ ගැහුවට සතෙක් ප්‍රධාන වශයෙන් කෑ ගහන්නේ භයට, වේදනාවට. බල්ලෙක් බුරන්නෙ රෞද්‍රකමට නෙවෙයි, බයට. බුරන බල්ලා සපා නොකයි කියල කියන්නෙත් බුරන්නෙ බයට කියන එකයි. නමුත් අපට පේන්නෙ රෞද්‍ර කමට බුරනව කියල. ලෝකයට රෞද්‍ර ශක්තිය පතුරුවන්නෙ ප්‍රධාන වශයෙන් සත්තු නෙවෙයි, ඒකට මූලික වෙන්නෙ මනුස්සයාමයි. සත්තු කරන්නෙ විපාකයක් ගෙවන එක. ඒ වගේම ලෝකය සාර්ථක කරන්නෙත් මනුස්සයාමයි. සංඛාර වශයෙන් ප්‍රධාන ශක්තියක් ගොඩ නගන්නෙත් මනුස්සයා. මනුස්සයාට මෙත් වඩන්න පුළුවන් වුණාට සතෙකුට ඒක කරන්න බෑ. මෙත් වැඩීමක් කරන්න බැරි වුණාට ඌ අඳෝනා නාදයෙන්, මිහිරි නාදයෙන්, බියෙන් කරපු විපාකයට වන්දි ගෙවනවා. අපි කියනවා සත්ව ලෝකය හරි සුන්දරයි, ලස්සනයි, කුරුල්ලො සින්දු කියනවා.... ආදී වශයෙන්. අපිට ඒක එහෙම පෙනුනට උන් කාලාන්තරයක් මේ විදියට සසරෙ කරපු පාප කර්මවල ණය ගෙවනවා.

තවත් සත්තු රූපයෙන් වන්දි ගෙවනවා. විවිධ හැඩතල තියෙන ලස්සන



මාළු, ලස්සන සමනළයො, ලස්සන කුරුල්ලො, ලස්සන තිත් මුවා, හරි ශාන්තයි..... මේ ආදී වශයෙන් මිනිස් ඇසට ප්‍රිය කරන සත්තු ඉන්නවා. උන් රූප ලස්සනෙන් වන්දි ගෙවනවා. ඒ ලස්සන දකින කොට මිනිස්සු සතුටු වෙනවා. හිත සන්තෝස වෙනවා. කවුරු හරි මල් උයනක් හදනවා. ලෞකික වුණත් ඒක හොඳයි. ඒකෙන් ඇහැ පිනවීම නරකක් නෙවෙයි. පංචකාමයට සම්බන්ධ පිනවීමක් වුණත් ඒක කාමයක් නෙවෙයි. ලෝකයේ විචිත්‍ර අරමුණක් පමණයි. ඒක හැදුණෙ කාම ලෝකයේ. කාම කියන්නෙ මෙබඳු අරමුණු කෙරෙහි සත්වයාට ඇති වන සංකල්පිත රාගයට. ලෝකයේ සම්බන්ධය හැටියට ඉෂ්ට ප්‍රිය අරමුණු ඇති කිරීම ලෞකික යහපතක්. ඒ යහපත් දේ ඊරිසියාවට කඩල දමල පැහැර ගෙන තමන් ලස්සන වෙන්න හැදුවොත්, ඒ පුද්ගලයාට ලස්සන කුරුල්ලෙක් වෙලා හරි ඇහැ පිනවීමෙන් වන්දි ගෙවන්න වෙනවා. ඌ මලක් වගේ ලස්සනයි. නමුත් ඌට ලස්සනින් වැඩක් නෑ. ඌ ලස්සන දේකට ඇදෙන්නෙත් නෑ. හැබැයි උගේ ලස්සන දැකල බාහිර ලෝකයේ ඉන්න මිනිස්සු හරි සන්තෝස වෙනවා. එතකොට ඌ ලස්සන වනසපු එකේ විපාකයට ලස්සන වෙලා වන්දි ගෙවනවා. හැබැයි මේ කියන්නෙ සත්ව ලෝකයේ සමහර සත්තු ගැන විතරයි. මනුස්සයට මේක අදාල නෑ. (මෙතනදී මේ සත්ව විෂය කියන එක අචින්ත්‍යයි කියන කාරණයත් දැන ගන්න ඕන. ඒ නිසා කරුණු තේරුම් ගන්න බොහොම කෙටි විග්‍රහයක් තමයි මේ ඉදිරිපත් කරන්නෙ.)

ඒ වගේම තවත් කොටසක් අනුන්ගෙ සම්පත්තිය ඩැහැගෙන තමන් ඇති අය විදියටත්, අනෙක් අය නැති අය විදියටත් බදාගෙන ඉන්නවා. ඊට පස්සෙ ඒකෙ විපාකයට අලි ඇත්තු වෙලා ඉපදිලා ගජමුතුත් එක්ක ටොන් ගණනක් බර දළ උස්සගෙන අන්තිමට මැරිල ගිහින් ගජමුතුවලින්, දළවලින් වන්දි ගෙවනවා. අවුරුදු සිය ගණනක් උස්සගෙන හිටියත් උගේ දළෙන් ඌට එච්චර වැඩක් නෑ. නමුත් මිනිස්සු ඒකෙන් බොහෝ ප්‍රයෝජනය ගන්නවා. දළ ඇතෙක් දැක්කත් මිනිස්සු ඒකෙනුත් සන්තෝස වෙනවා. හැබැයි දළ ඇතාට ''මට මෙහෙම දළ දෙකක් තියෙනවයි'' කියල එහෙම සන්තෝස හැඟීමක් නෑ. ඌ ඔය බර උස්සගෙන දුක් විඳිනවා. පොඩි බරක් නෙවෙයි. සම්පත්තියක් තියෙනවයි කියල එකක් ඌට නෑ. සමහර විට දළ දෙක දෙපැත්තෙන් පූට්ටු වුණොත් හොඬවැල උස් පහත් කරන්නත් අපහසු වෙනවා. ඒක විපාකයක්. හැබැයි ඌ සම්පත්තිය පොර කාලා ගත්ත එකේ විපාකයට අද මහ බරක් උස්සගෙන වන්දි ගෙවනවා. අන්තිමට මැරෙන කොට ඒ බර ලෝකයට දීල ඌ මැරිල යනවා. ලෝකෙන් අරගෙන කාපුව, ලෝභකමින් තියාගෙන ඉඳපුවා මැරෙන කොට අන්තිමට ගජමුතුත් එක්ක ලෝකයට දීල යනවා. මිනිස්සු ඒකෙන් හම්බ කරනවා.

දැන් කෙනෙකුට මෙතනදී තවත් ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන්, පසුගිය කලාපයෙන් විස්තර කළ බෝසත් ඇත්තුන්ගෙ මේ කියන ලකුණුත් එතකොට විපාක ගෙවීමක්ද කියල. මෙතනදී බෝසතුන් වුණත් අවස්ථානුකූලව තිරිසන් වෙලා තියෙන්නෙ කරගත්තු පාප විපාකයකින්. ඒ අයගෙ කර්ම ☞

විපාකයට ඒවා ලැබුණත්, තිරිසන් වෙන්නෙ පුණ්‍ය සෘද්ධියකින් නෙවෙයි. ලැබීම තියෙනවා. මිනිස්සුත් විශේෂයෙන් සලකනවා. නමුත් සතා තිරිසන් වෙලා විපාක දුකක් විඳිනවා. දළ, ගජමුතු වගේ දේවල් නිසා සමහරවිට මැරුම් කන්නත් වෙනවා. උදාහරණ විදියට පෙර පිනට කෙනෙක් රජ වෙනවා. නමුත් පිනට රජ වුණාට පස්සෙ සසරේ දෝෂයන් උඩ ලෝභකමින් හම්බකරල ගොඩ ගහගන්නවා. එතකොට ඒක මතු දුක් විපාකයන්ට හේතු වෙනවා. මේ වගේ පෙරුම් පුරන කොට බෝසතාණන් වහන්සේලාත් සියලු තැන්හිම අලෝභ නෑ. පෙරුම් පුරනව වුණත් සමහර වෙලාවට, සමහර දේවල් බලාපොරොත්තුවෙන් එක කුසේ උපන් සහෝදරයා ගලක් පල්ලට තල්ලු කරල මරල දාපු අවස්ථාත් සඳහන් වෙනවා. ඒ වගේ සම්පත් බලාපොරොත්තුවෙන් බඩ විරේක කරල, ඇස් අන්ධ කරපු අවස්ථාත් තියෙනවා. ඒ නිසා බෝසතාණන් වහන්සේලා වුණ පලියට, ලැබෙන ලැබෙන හැම මොහොතෙම සියලු ආකාරයෙන් අලෝභ, අද්වේෂ, අමෝහ වෙන්නෙ නෑ. ඒ නිසාම තමයි නියත විවරණ අර ගත්තට පස්සෙත් තිරිසන් වෙලා උපදින්නෙ. සත්තු වෙලා කරපු විපාකයන්ට වන්දි ගෙවනවා. සමහර කර්ම විපාකවල ශේෂයන් බුදු වුණාට පස්සෙත් ඵල දෙනවා.

ඊළඟට සමහර සත්තු ගන්ධයෙන් වන්දි ගෙවනවා. සත්ව ගඳ කියල එකක් තියෙනවා. ලස්සන වගේ නෙවෙයි ඒක බොහොම අඩුවෙන් තමයි දැනෙන්නෙ. ගඳක් ඇති වෙන සත්තු ඉන්නව නම්, ලෝකයට ගඳ ගහන වැඩ කරපු එකේ ඵල විපාකය තමයි ගෙවන්නෙ. හැබැයි ගඳ ගහන එකත් ගස්වලට පෝර වෙනවා. අපි ගඳ කියල කිව්වට උෟ විපාකයක් ගෙවනවා. ඒ වගේම කස්තුරි හරි සුවඳයි. ඒ සුවඳින් විපාකයට වන්දි ගෙවනවා. උරුලෑවා කියන සතා ගඳයි කියල කිව්වට උගෙන් සුවඳ හදන්නත් යමක් ගන්නවා. ගඳ කියන්නෙ උගේ ස්වභාවය. නමුත් ඒකෙන් විශේෂ වැඩ ගන්නවා. ඒ වගේම රාජාලියගෙ මළ අපද්‍රව්‍යවලින් ගන්න අම්බර කියන ද්‍රව්‍යය රත්තරං හදන්නත් ගන්නවා. සතුන්ගෙ ගඳ අපට ගඳ වුණාට සමහර විට ඒවා යම් යම් ප්‍රයෝජන උදෙසා ගන්නවා. මේවා අපට නොපෙනෙන පැති. එළුවගෙ ගඳ, පෙනහලුවල තියෙන සෙම ඉවත් කරන්න හේතු වෙනවයි කියලත් කියනවා. ඇදුම රෝගීන්ට එළු ගඳ හොඳයි කියනවා.

ඊළඟට සමහරක් සත්තු රසයෙන් වන්දි ගෙවනවා. ඒ කියන්නෙ මස් මාංශයෙන් වන්දි ගෙවනවා. සමහර සතුන්ගෙ මස් මාංශ රසවත් වෙනවා. ඒ වගේම ස්පර්ශයෙන් වන්දි ගෙවන සත්තු ඉන්නවා. ඒකෙන් ශරීරයට පහසක් ලබා දෙනවා. සමහර සතුන්ගෙ ලෝම ඇඳුම් මහන්න ගන්නවා. හම ගන්නවා බෑග්, සපත්තු, බෙර හදන්න. ඒවායේ ස්වභාවික පහසක් තියෙනවා. ඊළඟට ධර්ම ගත්තමත් එහෙමයි. ඒ කියන්නෙ සතුන්ගෙ ඉරියව් දිහා බලා ඉඳල, ඒවා නැවත නැවත සිහි කරල මිනිස්සු ආස්වාදයක් විඳිනවා. ඒ ශාන්ත පරිසරය මතක් වෙන දර්ශනය හිතට එන කොටත් මනුස්සයින්ට සතුටක් ඇති වෙනවා. මේ විදියට රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම කියන මේ හයෙන්ම හෝ කිහිපයකින් හෝ සත්තු ලෝකයට ණය ගෙවනවා. සතා වෙලා සමහරවිට අපිට උදව් කළේ නැතුවට, ණය ගෙවන්නෙ ඔන්න ඔය ක්‍රමයට තමයි. මේ තමයි තිරිසන් ලෝකයේ හැටි. පහළ අපායවල්වල සිටින සත්වයින් වුණත් අපට පේන්නෙ ඇහෙන්නෙ නැතුවට, උන් මර හඬ දීල ලතෝනි තියන හඬින් පෙර ලෝකයට සාප කරල නැගිච්ච විස කපා හරිනවා. හැබැයි අපිට පේන්නෙ නෑ ඒක වෙන හැටි.

උදාහරණ විදියට සූර්ය කිරණ, තාපය වගේ දේවල් අවසානයේ ඔක්කොම පොළව යටට යනවා. ඊට පස්සෙ ඒක පොළව මැද එකතු වෙනවා. මෙතනදී ක්‍රියාත්මක වෙන්නෙ ගති ආකර්ශන නියමය. ඒ කියන්නෙ මනුස්සයින්ගෙ ද්වේශයෙන් නැගෙන ශක්තිය පොළව මැදට යනවා. ඒක ගින්නක්. අලෝභ, අදේශ, අමෝහවලින් නැගෙන ශක්තිය උඩට යනවා. මේ ගති ආකර්ශනය අනුව සූර්ය තාපයත් අවසානයේ පොළව මධ්‍යයට එකතු වෙනවා. පොළව මධ්‍යයේ අධික උෂ්ණත්වයක් තියෙන්නෙත් මේ හේතු නිසයි. මේ කාරණය ඔප්පු කරන්න පුළුවන් අවස්ථාවක් තියෙනවා. වැවක් වගේ ජලාශයක් ගත්තොත් දිවා කාලයට මතුපිට ජලස්ථරය අධික රස්නෙයි. රාත්‍රිය වෙද්දි ජල ස්ථරයේ මැද ප්‍රදේශය රස්නෙයි. පාන්දර වෙද්දි ජලාශයේ පතුල අධික රස්නෙයි. මේ විදියට ක්‍රමයෙන් රස්නය පල්ලම් බහිනවා.

ඊළඟට මනුස්සයාගෙ කර්ම චිත්ත කියන රූපවලින් හටගත්තු තාපය නිවන්නත් අනෙක් අතට වේදනා විඳින්න ඕන. ඒ වේදනාවෙන් කෑ ගහනවයි කියන්නෙ ඒක නිවෙනවා. වේදනාව විඳින්න විඳින්න අර දාහයට ප්‍රතිචාර දක්වල ඒ ශක්තියෙන් චිත්ත රූප නැගෙනවා. නැගිල ඒවා නිවෙනවා. රාගයෙන්, ද්වේශයෙන් රත්වෙලා දැවි දැවී ඒ ශක්තියෙන් චිත්තජ රූප නැගෙනවා. නිරය වගේ අපායවල්වල ඉන්න සත්තු කරපු සංඛාරවල අධික බලවත්භාවය නිසා නැගෙන අධික සාපයෙන් අඬ අඬා ණය ගෙවනවා. උන්ට තලන්න තලන්න කෑ ගහනවා. කෑ ගහන කොට අර සාපය ගෙවෙනවා. කෙනෙක් ගහන්න ගහන්න අඬනවා, දුක් වෙනවා. ඒ අඬන කොට සහනයක් එනවා. මූ මෙච්චර දුක් වෙද්දි තවත් ගහන්න ඕන නෑ කියන හැඟීමක් එනවා. එතකොට නිවෙනවා. නමුත් ගහන මරණ කොට උෟ රෞද්‍ර වෙලා, තෝ කනව මරනව කිව්වොත් එහෙම මොනව වෙයිද ? එතකොට වධහිංසා දීම තවත් වැඩිවෙනවා. නමුත් අනේ ගහන්න එපා, අනේ මාව මරන්න එපා, මාව බේරගනියෝ කියල කෑ ගහන කොට හිත උණුවෙන්න පටන් ගන්නවා. ඒ නිසා අපායෙ ඉන්න නිරි සතෙකුට දඬුවම් දෙනකොට කෑ ගහනවයි කියන්නෙ ගිනි නසන විපාකය ගෙවෙනවා.

සූර්යාගෙන් පල්ලම් බැහැපු රස්නය කෑ ගහන කොට කැපෙනවා. නැත්නම් රස්නෙ එකතු වෙලා තියෙන්න බෑ, දරාගන්න බෑ. සත්වයෝ කෑ ගැහුවෙ නැත්නම් අර විදියට පල්ලම් බැහැල එකතු වෙච්ච අධික තාපයට මොකද වෙන්නෙ? සූර්යාගෙන් දවස ගානෙ එන තාපය කොච්චර නම්ද? අන්තිමට පොළව යටට තමයි ඒවා යන්නෙ. ඒවා ඔක්කොම පොළව යටට ගිහින් අපාගත සත්වයින්ගෙ අඳෝනාවලට ප්‍රතිචාර දක්වනවා. තාපයේ උෂ්ණත්වය ඒකෙන් කපනවා. මකර කට (වඩබා මුඛය) හෙවත් බර්මියුඩා ත්‍රිකෝණයෙන් එළියට දාන්නෙ වැඩි වෙන තාප කොටස තමයි. ඒ වගේම පොළව යට එක පාරටම එවන්න බැරි තවත් අධික උෂ්ණත්වයක් තියෙනවා. ඒවත් විවිධ මට්ටම්වලින් පාලනය කරල මකර කටින් පිට කරනවා. ලෝකයට දරන්න බැරි මට්ටමක තාපය පොළව යට තියෙනවා. අපි කතාවට කියනවා, අහස පොළව උහුලන්නෙ නැති අපරාධ කියල. ඒ කියන්නෙ ඒවා ඒ තරම් දරන්න බෑ. එහෙම ඒවා තමයි ගිහින් අර අපාගත සත්වයො දරාගෙන අඬන්නෙ. ඒක එතැනින් ආපසු කපනවා. අහස පොළවට උහුලන්න පුළුවන් ප්‍රමාණය වඩබා මුඛයෙන් පිටට එවනවා. බැරි හරිය උන් එහේ දවනවා. මේ විදියට රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ..... ආදියෙන් වන්දි ගෙවන ක්‍රම විවිධාකාරයෙන් වූ සංකීර්ණ ක්‍රියාවලියක් නිසා මෙහි සඳහන් කළේ පොදුවේ කෙටි විග්‍රහයක් පමණයි.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්.....)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# සියලු සර්ප විෂට බුලත් විටෙන් ප්‍රතිකර්මයක්...

සර්පයන් දෂ්ට කිරීමෙන් නියමිත ඖෂධ නියම කලට නොලබා මියයන හෝ රෝගී වන පිරිස් සිටින මෙවන් අවධියක, ඒ සඳහා මීට අවුරුදු දහසකට පමණ පෙර භාවිතා කළ, එහෙත් මේ වන විට සැඟව ගිය, වහරක අභයරතනාලංකාර හිමියන් විසින් සමාධියෙන් දුටු බොහෝ අත්දැකීම් සහිත ප්‍රතිකර්මයක් තමයි මේ ඉදිරිපත් කරන්නේ. පත්තෑයන්, ගෝනුස්සන් වගේ කුඩා සර්ප දෂ්ට කිරීම්වල සිට නයා, පොළඟා වැනි උග්‍ර සර්ප දෂ්ට කිරීම් සඳහාත් තමන්ටම ඉතා පහසුවෙන් යොදාගත හැකි ප්‍රතිකර්මයක් තමයි මේ.

මේ සඳහා භාවිතා කරන්නේ බුලත්, පුවක්, හුණු, දුම්කොළ යොදා සකස් කර ගන්නා බුලත් විටයි. අපේ රටේ උදවියට බුලත් විට කියන්නේ අමුතු දෙයක් නොවන නිසාත්, නිතර පාවිච්චියට ගන්න දෙයක් නිසාත් සර්ප දෂ්ට කිරීම්වලදී මේ ප්‍රතිකර්මය යොදා ගැනීම අපහසු කාරණයක් නෙවෙයි. නමුත් සමාජයේ මේ බුලත් විට හැපීම ගැන කරුණු කාරණා නොදන අපහාස උපහාස කරන, පිළිකුල් කරන ඇතැම් උදවිය සිටින නිසා ඒ සම්බන්ධයෙන් දැනුවත් වීම වැදගත්. මොකද මත්පැන් වීදුරුවක්, දුම්වැටියක් මහත් උජාරුවෙන් පානය කරන ඇතැම් උදවිය, අපේ පැරැන්නන් ආදියේ පටන් භාවිතා කළ, ගෞරවයට පවා පාත්‍ර වූ මේ බුලත් විටට ගරහන අවස්ථාත් තියෙනවා. ඒ නිසා ප්‍රතිකර්මය දැන ගැනීමට පෙර, මේ හතර වර්ගයේ ඇති විෂ නසන ඖෂධීය වටිනාකම පද නිරුක්ති සහිතව දැනගැනීම වැදගත්.

බුලත් කියන්නේ බුහුමන් ලත් කියන අදහසයි. අපේ පැරැන්නන් ආගන්තුකයන්ට බත බුලතින් සංග්‍රහ කළ බව සඳහන් වෙනවා. එදා විතරක් නෙවෙයි අදත් අපේ සමාජයේ පිරිතකට, මඟුලකට, මළ ගෙයකට හෝ වෙනත් ඕනෑම වැදගත් උත්සව අවස්ථාවකදී ගරු බුහුමන් කිරීමටත්, සංග්‍රහ කිරීමටත් බුලත් භාවිතා කරනවා. දෙමවුපිය, ගුරු දෙගුරුන්ට වඳින කොටත් බුලත් දීලයි වඳින්නෙ. විශේෂයෙන් අපේ පැරණි ගෙවල්වල එදා බුලත් තට්ටුව අනිවාර්ය අංගයක් වුණා. කෙනෙක් ගෙදරට ගොඩවුණාම ඉස්සෙල්ලාම බුලත් තට්ටුව අල්ලන සිරිතක් තිබුණා. අදත් අපේ සමහර ගැමි ජනතාව ඒ සම්ප්‍රදාය රැකගෙන එනවා.

ඒ විතරක් නෙවෙයි නාගවල්ලී දළූ පේතං චුන්න පූග සමායුතං... ආදී වශයෙන් දැහැත්විට පූජා කරන ගාථාවක් කියල බුද්ධ පූජාවටත් දැහැත් වට්ටිය තියනවා. (නාගවල්ලි - බුලත්, චුන්න - හුණු, පූග - පුවක්, සමායුතං - සමග එකතු කරනවා, තාම්බූලං- ඇඹුල තවනවා හෙවත් ආහාරය දිරවා හරිනවා කියන අර්ථය) මෙතනදී බුදු, දම්, සඟ කියන මේ ත්‍රිවිධ රත්නයෙන් විහිදෙන සුගන්ධය,





විශේෂයෙන් ලොව්තුරා බුදු පියාණන් වහන්සේලාගේ ශ්‍රී මුඛයෙන් විහිදෙන්නා වූ, අපමණ වූ දහම් සුගන්ධයට උපහාර පිණිසත් මේ දැහැත් විට තබා, ඒවායින් විහිදෙන්නා වූ සුවඳ උපමා කර වන්දනාමාන කරනවා. ඒ වගේම සුවඳ විටක් නොහපා රාජ සභාවට යෑම තහනම් කියල ඉස්සර රජ කාලයේ රාජ නීතියකුත් තිබිල තියෙනවා. ඒ කියන්නෙ මුඛයේ තියෙන විසබීජ විනාස කරල මුඛ දුර්ගන්ධය නැති කරගන්න, ඒ වගේම කයට ඇති වන කාන්සිය නිදිමත ගතිය දුරු කර ගන්න වගේ දේවල්වලට තමයි මේ බුලත් විට යොදා ගත්තෙ. එහෙනම් බුලත් විට හැපීමේ දී මුඛයෙන් සුගන්ධයක් විහිදෙන බවත්, ඒ සුගන්ධය උපමා කරගෙන ලෝකයට යහපත් දහම් සුගන්ධය පතුරවන බුදු පියාණන් වහන්සේලාට දැහැත් විට පූජා කරන බවත් ඉතා පැහැදිලි කරුණක්. අපේ භික්ෂූන් වහන්සේලාත් දානයකට, පිරිතකට වැඩියම මේ දැහැත්විට වැළඳීම එදා පටන් පැවත එන සාම්ප්‍රදායක්. උන්වහන්සේලාට ඉස්සෙ-ල්ලාම පිළිගන්වන්නෙත් දැහැත් වට්ටිය තමයි. ඉතින් ඒක නරක දෙයක් නම් මේ වගේ වැදගත් අවස්ථාවලට, විශේෂයෙන් බුද්ධ පූජාවට දැහැත් විට යොදා ගනීවිද?

ඊළඟට පුවක් ගත්තොත්, ''පූ'' කියන්නේ ආහාරය. (මේ බව මීට පෙර ලිපිවලින් ද පැහැදිලි කර ඇත.) ''පුවක්'' කියන්නේ වක කරල, ඇදල දානවයි කියන එක. ආහාරවල ඇති විෂ ගතිය වක කරල ඇද ගැනීමක් හෙවත් ඉවත් කිරීමක් පුවක්වලින් සිද්ධ කරනවා.

හුණුවලින් කියන්නේ යමක් සුනු විසුණු කරල දමනවා කියන අදහස. යම් දෙයක අඩංගු විස තමයි සුනු විසුණු කරල දාන්නේ. දුම්කොළ කිව්වම යම් දෙයක ඇති විස දුම් කර, අළු කරන අදහසක් හෙවත් ආම්ලිකත්වය දුරු කරන අදහසක් එනවා. (ධූ + අම් =දුම්) මෙතන දී දුම්කොළ අපේ රටට ආවේ පෘතුගීසි ලන්දේසි වගේ පිටරැටියන්ගෙන් බවත්, එහෙනම් ඊට පෙර ආදි පැරැන්නන් ඒක භාවිතා කළේ කොහොමද කියලත් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්. නමුත් ඒ අය අපේ රටට දුම්කොළ හඳුන්වා දෙන්න පෙරත්, අතීතයේ පටන් අපේ රටේ සිංහල දුම්කොල පැවති බව අමතක නොකළ යුතුයි. විදේශිකයන් හඳුන්වා දුන්නේ රට දුම්කොළ. සිංහල දුම්කොළ අපේ රටේ අදත් භාවිතා වෙනවා. මේ සර්ප විස ප්‍රතිකර්මයටත් සිංහල දුම්කොළ ගන්න පුළුවන් නම් ඒක විශේෂයි. මොකද රට දුම්කොළවල මේ ඖෂධ ශක්තිය ඒ තරම් ප්‍රබල නෑ. මේ නිසා සිංහල දුම්කොළ විස නසන්න බොහෝ හේතු වෙනවා. විශේෂයෙන් අපේ ආදි පැරැන්නන් එදා කැලයට හේනට යද්දි අර ගෙන ගියේ බුලත්, පුවක්, හුණු, දුම්කොළ කියන මේ හතර පංගුව තමයි. ඒක වැරැද්දුවෙ නෑ. සර්ප දෂ්ට කිරීම්වලදී යොදා ගන්න තමයි එහෙම ගෙනිච්චේ.

මේ අනුව මේ හතර පංගුව එකතු වුණාම විස නසාලීමේ විශේෂ ගුණයක් පිහිටන බව දැන් තේරුම් ගන්න පුළුවන්. දැන් මේක පාවිච්චි කරන ආකාරයත් දැනගන්න ඕන. මෙතනදී බුලත් කොළය ගන්න කොට අග මුල (නැට්ට හා වලිගය කොටස) කඩල දමල ඉතිරි සම්පූර්ණ බුලත් කොළයම ගන්න ඕන. මොකද බුලත් කොළය පුරාම ඖෂධ ශක්තිය විහිදිලා තියෙනවා. ඊළඟට ඒකත් එක්ක විටකට ප්‍රමාණවත් තරමට පුවක්, හුණු, දුම්කොළ අරගෙන සාමාන්‍යයෙන් විටක් කනව වගේ මුඛයෙන් හපනවා. බුලත් විට කන අයට නම් ඉතින් මේක ප්‍රශ්නයක් නෙවෙයි. අමුතුවෙන් පුරුදු වෙන්න දෙයක් නෑ. සුළැඟිල්ල හා වෙදැඟිල්ල අතරින් යන්න කන විටෙන්ම බුලත් කෙල පහරක් සර්පයා දෂ්ට කරපු තැනට ගහන එක තමයි කරන්න තියෙන්නේ. මෙහිදී සර්ප දෂ්ට කිරීමට ලක් වුණු පුද්ගලයාට තනිවම හෝ වෙනත් කෙනෙකු ලවා හෝ මේ බුලත් කෙලගැසීමේ ප්‍රතිකර්මය කරගන්න පුළුවන්. හැබැයි **වැදගත් කාරණය තමයි බුලත් කෙල ගහන කෙනා පිරිමි අයෙක් නම් ඒ සඳහා දකුණු අතේ සුළැඟිල්ල හා වෙදැඟිල්ලත්,**

**බුලත් කෙල ගහන කෙනා ස්ත්‍රියක් නම් වම් අතේ සුළැඟිල්ල හා වෙදැඟිල්ලත් තමයි පාවිච්චි කරන්න ඕන.** මොකද පිරිමි අයගේ දකුණු පැත්තට තමයි මානසිකත්වය හා බල පිහිටන්නෙ. ස්ත්‍රීන්ගේ බල පිහිටීම හා මානසිකත්වය ක්‍රියාත්මක වෙන්නේ වමට බරව. මොළේ වැඩීම බැලුවත් පිරිමි අයගේ දකුණු පැත්ත ක්‍රියාත්මක වීම වැඩියි. ස්ත්‍රීන්ගේ වම් පැත්ත ක්‍රියාත්මක වීම වැඩියි. මේ කාරණය පැරණි ඍෂි භාෂිතයෙත් පෙන්වා තියෙනවා.

ඊළඟට මෙතැන දී සුළැඟිල්ල පාවිච්චි කරන්නේ එහි සුනු කර දමන, විස පුච්චන ශක්තිය තියෙන නිසා. වෙදැඟිල්ලේ බෙහෙත් ඖෂධ ශක්තිය පිහිටනවා. දැන් බුලත් විට හොඳට හපල පදම ආවට පස්සෙ අර කියපු විදියට ස්ත්‍රී පුරුෂභාවය අනුව සුළැඟිල්ල හා වෙදැඟිල්ල අතරින් බුලත් කෙල පාරක් සර්පයා දෂ්ට කරපු ස්ථානයට විදිනවා. නිකම්ම නෙවෙයි. බුලත් කෙළ පාර වායුවත් සමග විහිදිලා යන්න (ස්ප්‍රේ කරන ආකාරයෙන්) ගහන්න ඕන. ඒ විදියට පිට පිට තුන් පාරක් පමණ බුලත් කෙළ තුවාලයට ගහනවා. මේ විදියට බුලත් කෙල ගහල විනාඩි 15 ක් පමණ යනකල් සෝදා ඉවත් නොකළ යුතුයි. ඒ කාල සීමාව ඇතුළත දැඩි දැවිල්ලක් සමගින් දෂ්ට කළ ස්ථානයේ සිට සියලු සර්ප විස ශරීරයෙන් පුච්චල බැහැර වෙලා යනවා. අර ඇඟිලි දෙක අතරින් බුලත් කෙල පාර වදින කොට ඖෂධ ශක්තියත් එකතු වෙලා තුවාල වූ ස්ථානයට වැදිල විෂ පුච්චා හරිනවා. ඉන්පසු ඒ ස්ථානය සෝදා හරින්න පුළුවන්.

යම් කෙනෙකුට මේ ප්‍රතිකර්මය ගැන සැකයක් තියේනම්, මේ ප්‍රතිකර්මයෙන් පසුව විස වෙදෙකු ලවා පරීක්ෂා කරව ගන්නත් පුළුවන්. මොකද මේ ප්‍රතිකර්මයට අමුතුවෙන් කාලය නාස්ති වීමක් කියල දෙයක් නෑ. ඕන නම් වෛද්‍යවරයකු වෙත රැගෙන යන අතර තුරත් මේක පහසුවෙන් කරන්න පුළුවන්.

බුලත් විට ගැන කතා කිරීමේ දී අද වෙන කොට සැඟවිලා තියෙන තවත් වැදගත් කාරණයක් තියෙනවා. මේ කාරණයත් විශේෂයෙන් අභයරතනාලංකාර හිමියන්ගේ සමාධියට හසු වී තියෙනවා. අපි යම් කිසි ආහාරයක් ගත්තම (විශේෂයෙන් තෙල් හා පුළුටු ආහාර) ඒ ආහාරත් සමග අරක්ගත් සමහර අමනුස්ස කොටස් අපේ ආහාර මාර්ග පද්ධතියට ඇතුලු වෙන්න පුළුවන්. ඒ වගේම ඕනෑම ආහාරයක් අරගෙන යම් කිසි වෙලාවක් යන කොට ඒ ආහාර කැබලි මුඛයේ පල් වෙනවා. ඒකෙන් දුර්ගන්ධයක් හමනවා. රාත්‍රියේ දී ආහාර අරගෙන නින්දට යන්න පෙර දත් නොමැද්දොත් මේ කාරණය ඉතා තදින් ක්‍රියාත්මක වෙනවා. මේ වගේ අවස්ථාවලදී ඒ පල් ආහාර ගඳට ප්‍රිය කරන සමහර අමනුස්සයෝ, මනුස්ස ශරීරයට පිටින් ඉඳගෙන උන්ගෙ දිව මනුස්සයාගේ මුඛයට ඇතුල් කර ඒ ආහාරවල මැලියම් ඇදගන්නවා. සමහර විට සම්පූර්ණ මුඛය ඇතුළටම උන්ගෙ දිව ඇතුල් කරල ලෙව කාල යනවා. හැබැයි මේ කාරණය මනුස්සයාට දැනෙන්නෙ තේරෙන්නෙ නෑ. මොකද උන්ට තියෙන්නේ අති සියුම් කිරණමය දිවක්. ඒක ඕන තරම් දික් කරන්න පුළුවන්. මේ නිසා මේ වගේ අවස්ථාවලින් බඩේ අජීර්ණ ආදිය හැදෙන්නත් පුළුවන්. හැබැයි යම් කෙනෙක් බුලත් විට හපනව නම් මේ කියන අමනුස්සයෝ පැත්ත පළාතෙ ඉන්නෙ නැතිව දුවනවා. මොකද උන්ට බුලත් විට විසයි. මේ නිසා මනුස්සයෙක් බුලත් විට හපනවට අමනුස්සයෝ බොහොම අකමැතියි. මොකද සුගන්ධයට නෙවෙයි අර පල් වූ දුර්ගන්ධයට තමයි උන් ප්‍රිය කරන්නේ. මේ නිසා බුලත්විට කන්න අකමැති නම් ඉඳල හිටල හරි අඩු ගානෙ බුලත් කොළයක් සමග පුවක් කෑල්ලක් හපන එකත් හොඳයි.

ඒ වගේම අපි මොන ආහාරයක් ගත්තත් ටික වෙලාවකින් මුඛය තුළ දුර්ගන්ධයක් සෑදීම සාමාන්‍ය දෙයක්. ඒක ක්‍රමයෙන් පල්වෙලා දුගඳ හමනවා මිසක් සුගන්ධයක් එන්නෙ නෑ. නමුත් ඒ මොන ආහාරය ගත්තත් බුලත් විටක් සැපීමෙන් ඒ දුර්ගන්ධය විතරක් නෙවෙයි, මුඛය තුළ තියෙන මැලියම් පවා සම්පූර්ණයෙන්ම සුද්ධ වෙලා යනවා. ඒක බුලත් විට හපන අය අත්දැකීමෙන් දන්නවා. මේ නිසා අදත් අපේ සමහර ගැමි ජනතාව ආහාර වේලකින් පස්සෙ දත් බුරුසු, දත් බෙහෙත් පාවිච්චි නොකර බුලත් විටක් හපල සමහර වෙලාවට බෝඹු ලීයෙන් දත මැදගන්න පුරුදු වෙලා තියෙනවා. නමුත් ඒ අය දත් බුරුසු, දත් බෙහෙත් පාවිච්චි නොකළයි කියල මුඛයෙන් දුර්ගන්ධයක් වහනය වෙන්නෙ නෑ. ඒ තමයි බුලත් විටක තියෙන අනෙක් විශේෂත්වය. (හැබැයි මේ කාරණය රෑ දවල් එක දිගට බුලත් හපේ ගහගෙන ඉන්න අයට රුකුලක් නෙවෙයි. මොකද ඒක නොගැලපෙන පරිහරණයක්)

දැන් කෙනෙකුට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්, බුලත් විට කෑවම මුඛ පිළිකා හැදෙනවයි කියල. මොකද බොහෝ කොටම වෛද්‍ය මතය දීල තියෙන්නෙ එහෙමයි. නමුත් මෙතනදී දැනගන්න ඕන, පිළිකාවක් කියන එක කර්මය මුල්වෙලා තමයි හට ගන්නේ. ඒ වගේම බුලත් විට විතරක් නෙවෙයි, මොනම දෙයක් වුණත් ඕනවට වැඩියෙන් ගත්තම ඒක අපත්‍ය වෙනවා. විශේෂයෙන් බුලත් හපය මුඛය තුළ තියා ගෙන රාත්‍රියේ නිදා ගන්නත් සමහරු දිගු කාලීනව පුරුදු වෙලා ඉන්නවා. ඉතින් එහෙම වෙලාවක කර්ම විපාකයක් තියේ නම් ඒක මුල් වෙලා, බුලත් හපය එක දිගට තියාගෙන සිටීමත් උපනිශ්‍රය වෙලා පිළිකාවක් හැදුණොත් මිසක්, මෙතනදී බුලත් විට හැපීම නෙවෙයි මුඛ පිළිකාවට මුල් වෙන්නේ. එහෙම නැත්නම් බුලත් විට හපන හැමෝටමත් මුඛ පිළිකා හැදෙන්න එපැයි. නමුත් කීයෙන් කී දෙනාට ද එහෙම වෙන්නේ. අනෙක බුලත් විට හපන්නෙ නැතිවත් මුඛ පිළිකා හැදෙන අවස්ථා නැද්ද? එතකොට අපේ මුතුන් මිත්තන් බුලත්විට හැපුවෙ නැද්ද? ඒ අයට බුලත් විට හැපුවයි කියල මුඛ පිළිකා හැදුනද? ඒ නිසා කවුරු කොහොම කිව්වත් මේ කාරණය ඥානවන්තව තෝරා ගත යුතුයි.

## සර්ප දෂ්ට කිරීම් වළකන විශේෂ මන්ත්‍රයක්.

ඒ වගේම අභයරතනාලංකාර හිමියන් ගිහි වතක සිටියදී පැරණි මන්ත්‍ර පොතකින් දැනගන්න ලැබුණු, බොහෝ අත්දැකීම් සහිත මන්ත්‍රයක් තමයි මේ. මේ මන්ත්‍රය දන්න අයට සර්පයන් නොකත් කියල එහි ලියවිලා තියෙනවා. යහපත් මන්ත්‍රයක් නිසා ඒක මේ විදියට අර්ථ සහිතව ඉදිරිපත් කරල තියෙනවා.

**අරහං මම රාජයා වික්‍රම නේෂ්වර මහේෂ්වර ලෝකේෂ්වර පච්චන යාමී හර හර හ්රිං - නමෝ ආසර්ප භගවතෝ වරෙං නමඃ**

මේ මන්ත්‍රය බුදු ගුණ මුල් කර ගෙන හදපු එකක්. අරහං මම රාජයා කියන්නේ, මම අරිහත් වූ බුද්ධ රාජයා කියන එකයි. වික්‍රම නේෂ්වර මහේෂ්වර ලෝකේෂ්වර ආදී වශයෙන් කියන්නේ සෑම අතින්ම ජයග්‍රහණය කරපු, මහ ඉසුරින් පරිපූර්ණ වූ, ලෝකයට ඊශ්වර වැනි කියන එකයි. පච්චන යාමී හර හර හ්රිං කියන එකෙන් අදහස් වෙන්නෙ, ලෝකය අවසාන වෙන කල්ම ඒ ගුණය සිහි කරල, ඒ ගුණයට නමස්කාර කරනවා කියන එකයි. නමෝ ආසර්ප භගවතෝ වරෙං නමඃ කියන්නේ සර්පයෝ නොකන, සර්ප ගති නැති භාග්‍යවතුන් වහන්සේගේ බලය ඇදිල එන්න කියන එකයි.

මේකෙ තියෙන විශේෂත්වය තමයි මන්ත්‍රය කියන්න ඕන නෑ, මතකයේ තිබුණම ප්‍රමාණවත්. මේ සම්බන්ධයෙන් අභය-රතනාලංකාර හිමියන්, තමන්ගේ අත්දැකීම් කිහිපයක් මේ විදිහට විස්තර කරනවා. ''දවසක් මම සැතපිලා ඉන්න කොට බොරු ඇහැ ගාවට උඩ හිටපු සර්පයෙක් වැටුණා. වැටුණු ගමන් ඌ ඇදිල ගියා. එච්චරයි. ඒ වගේම ගිහි කල සිටිය දී අපේ වත්තපිටිය සුද්ද කරන කොට ඕන තරම් සර්පයෝ කකුල් දෙක උඩින් ඇදිල ගියත් දෂ්ට කරල නෑ. ඒ දවස්වල වත්ත එළි කරන කොට හුගක් කුණුකටුවො ඉන්නවා. උන් කකුලෙ පැටලිලා ඉවතට විසි වෙනවා. මේ මන්ත්‍රය පැරණි මන්තර පොතක තිබිල කියවන කොට, හරි වැදගත් කියල හිතුණ නිසා දෙපාරක් කියන කොට ජීවිතේටම මතක හිටියා. මන්ත්‍රය දන්නව නම් දන්න අය සර්පයො කන්නෙ නැහැ කියලයි ඒකෙ තිබුණෙ. ඉතින් පොඩි කාලෙ ඉඳන්ම මතකයි. එදා පටන් අද දක්වාම සර්පයො දෂ්ට කරල නෑ. ඉන් පස්සෙ සර්පයෝ ළඟට ගිහින් උන් අවුස්සල ගන්න ගියත් වකුටු වෙලා හැකිලෙනවා. කුණුකටුවො වගේ සර්පයෝ 100 කට වැඩි ප්‍රමාණයක් වත්ත සුද්ද කරද්දි හමුවෙලා උදලු තලයට අරගෙන ඇල කණ්ඩියෙන් එහාට දාල තියෙනවා. උන් උණ්ඩි වෙලා ඔහේ ඉන්නවා මිසක් දෂ්ට කරන්න පනින්නෙ නෑ. පශ්චිම ජනතාවට වැදගත් වේවි කියල හිතල මේ විදියට මේ මන්තරය සටහන් කරනවා.''

**සටහන:**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# මනුස්සයින්ට හටගන්නා මානසික රෝගාබාධයන් කිහිපයක ස්වභාවය දහම් ඇසින්....

වර්තමාන වෛද්‍ය විද්‍යාවේදී මනුස්සයින්ට හටගන්නා රෝග, කායික රෝග හා මානසික රෝග වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වෙන් කරනවා. මේවායින් බොහොමයක් කායික රෝගවලට වෛද්‍ය විද්‍යාවේ (බටහිර හා දේශීය) ප්‍රතිකර්ම තිබුණත්, මානසික රෝගවලට කරන බොහෝ ප්‍රතිකර්මවලින් රෝගීතාවයන් පාලනය කිරීමක් හැරෙන්න නිට්ටාවට සුවපත් වීමක් සිද්ධ වෙනවා අඩුයි. මොකද **මනස කියන්නෙ කය වගේ බාහිරින් ඖෂධ යොදා යථා තත්වයට පත් කරගන්න පුළුවන් ඉන්ද්‍රියක් නෙවෙයි.** රසායන ඖෂධවලින් ඇතිවන ප්‍රතික්‍රියා නිසා යම් කිසි සුන්දර ලෝකයක් මානසිකව මවල දුන්නත් ඒක තාවකාලිකයි. හරියට හීනයක් වගේ. යම් යම් රසායන ඖෂධ මගින් තාවකාලිකව පාලනය වීමක් සිද්ධ වුණත්, ඒ රෝගීතාවයේ යථා ස්වභාවය හේතු ඵල ධර්මයට අනුව නොදකින තාක් මේ වගේ මානසික රෝගයන්ගෙන් අත්මිදෙන්න පුළුවන් කමක් නෑ. නමුත් අද සමාජයේ බොහෝ විට සිද්ධ වෙන්නෙ, මේ වගේ මානසික විකෘතිතාවයන්ට විවිධ මට්ටම්වල මානසික රෝහල්වල නතර කර පාලනය කර තැබීම වගේ දේවල්. බුදු දහම අනුව මේ මානසික රෝගයන්ට කර්ම විපාකවල බලපෑම් තිබුණත්, ලෝකයේ යථා ස්වභාවය වටහා ගන්න හේතු වාසනා තියේ නම් ඒවායින් අත්මිදීමත් තමන්ටම කර ගන්න පුළුවන්. ලෝකයේ යථා ස්වභාවය වටහා ගැනීමෙන් එන චිත්ත පාරිශුද්ධිය නිසා ඒක ගෙවිල යනවා. මේ වගේ මානසික ඌණතාවයන් කිහිපයක අර්ථ නිරූපණයන් පද නිරුක්ති සමගින් කෙරෙන කෙටි විග්‍රහයක් තමයි මේ ඉදිරිපත් කරන්නේ.









01. **පිස්සු** - ප්‍රිය දේවල් උස්සා ගැනීම නිසා වන විකෘතිය. (පිය + ඉස්සු =පිස්සු) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන මේවාට තමයි ලෝක සත්වයා ප්‍රිය කරන්නේ. මේවා උස්සා ගැනීම විවිධ පුද්ගලයන් විවිධ මට්ටම්වලින් කරන නිසා මේ පිස්සු ස්වභාවයත් පුද්ගලයා අනුව වෙනස් වෙන්න පුළුවන්.

02. **ඔල්මාද** - මදයෙන් මත්වීම නිසා ඇති වන සැලෙන බව. (හොල් - සෙලවෙනවා + මාද - මදයෙන් මත්වීම = ඔල්මාද) මෙහිදී මදය කිව්වේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, කියන පංචකාමයන්ට මත් වීමයි.

03. **විකල් (වි + කල්)** - කාලය නිසි තැන නොදැනීමෙන් නොගැලපෙන ලෙස විකෘති කටයුතු කිරීම, දෙඩවීම. එනම් කාලය විකෘති කර ගැනීම හෙවත් වරද්දා ගැනීමත්, විකෘති කටයුතු අල්ලා ගැනීමත් මීට අයත් වෙනවා. විකෘති කටයුතු කියන්නේ ලෝකාස්වාදයන් පසුපස හඹා යෑමට කරන කටයුතුයි.

04. **කුපිත වීම** - (පංච) කාම ආස්වාදය පානය කිරීමට හිත වීම නිසා ඇතිවන මානසික විකෘතිය. ආස්වාදය තමන් කැමති විදිහට නොලැබෙන කොට මේක සිද්ධ වෙනවා. (කු+පා+ හිත =කුපිත = පහත් දේ පානයට හිතවීම)

05. **උරණ වීම** - තමන්ට පක්ෂ පිරිස් නැතිවීම නිසා ඇතිවන මානසික විකෘතිය. (උර - උර දෙනවා, ආධාර කරනවා. ණ - නසනවා, නැතිවෙනවා. එනම් තමන්ට උර දෙන පිරිස් නැතිවීම.)

06. **වික්ෂිප්ත බව** - තමන්ට නොගැලපෙන අයගෙන් හෝ නොගැලපෙන දේවල්වලින් වෙන්වීමට නොහැකි වීමෙන් ☞

එහෙමත් නැත්නම් ගැලපෙන අයගෙන් හෝ ගැලපෙන දේවල්වලින් වෙන්වීමට සිදුවීමෙන් ඇතිවන මානසික විකෘතිය.

07. **තැවුල්** - ඇනුම් පද කියමින් සිත තැවීමට පත් කිරීම නිසා ඇතිවන මානසික විකෘතිය. (තැවු - තැවීම + උල් - ඇනෙන ස්වභාවය) තැවීම නිසා ඇතිවන ඇනෙන ස්වභාවය.

08. **මීමැස් මොරය** (ෆිට් එක) - ලෝකාස්වාදයන්ට ඇති දැඩි බලාපොරොත්තු ඉටු කරගත නොහැකි වීමෙන් ඇතිවන මානසික තදවීම.

09. **දාහය** - තමන් කැමති දේ නොලැබෙන විටත්, එවිට පලිගන්න බැරිවූ විටත් ඇතිවන මානසික දැවීම, තැවීම.

10. **වෛරය** - තමන් ප්‍රිය නොකරන දෙයක් සිද්ධ කළ විට ඒ කරුණට අදාල දේවල් හෝ පුද්ගලයින් වනසන අදහසින් සිතේ තදට කා වැදීම නිසා ඇතිවන මානසික විකෘතිය.

11. **අප්‍රසාදය** - බලාපොරොත්තු කඩවීම නිසා ප්‍රිය කරන දේ පවා නොපිලිගෙන මානසිකව තැවි තැවී පසුවීම.

12. **රෞද්‍ර බව** - තමන් අකමැති දෙයක් සිද්ධ කළ විට ඊට අදාල අය ගැන යළි යළි රොස් වෙමින් දූෂ්‍ය මානසිකත්වයක් ගොඩනගා ගැනීම.

13. **පලිගැනීම** - තම කටයුතුවලට විරුද්ධ අය මෙල්ල කර ගැනීම සඳහා දස අකුසල් වැනි පහත් දේ ආයුධ කර ගැනීම.

14. **උදහස් බව** - නිලතල, තත්ව තානාන්තර ආදියෙන් විවිධ කැපී පෙනෙන ස්වභාවයන් පිළිබඳව උසස් වීමට ඇති ආසාව නිසා, මුලා වූ අධිමානයකින් එබඳු අය ලෙස කරන විකෘති රඟපෑම.

15. **පීඩනය** - විවිධ ආස්වාද පානය හෙවත් ඇසුර මදිවීම නිසා වැඩිපුර බලාපොරොත්තුවෙන් ඇතිවන මානසික තෙරපීම.

16. **අසහනය** - සහායට තමන් කැමති පිරිස සහ දේවල් නැතිකමින් වන මානසික තෙරපුම.

17. **උන්මත්තකභාවය** - හේතුඵල න්‍යායට, විද්‍යාවට නොගැලපෙන ලෙස ඔවුනොවුන්ට ආවේණික මත දරාගෙන මුලා වී සිටීම.

18. **වියරුව** - සියලු බලාපොරොත්තු සුන් වූ පසු පහත් ක්‍රියාවන්ගේ අන්තයට බැස, ජීවිතයත් නොතකා කටයුතු වික්ෂිප්තව කරන භයානක මානසිකත්වය.

මෙතනදී එන්නේ ව්‍ය + ඉරු හෙවත් ඉරු වැයවීම කියන අදහස. එනම් තමන්ගේ අහස් මාලිගා පොතේ අන්තිම පිටුවත් පෙරලා ඉවර වූ පසු ඇතිවන විපරීත මානසික දාහයයි. මෙය මරාගෙන මැරෙන භයානක රෝගයක්.

තත්ත්ව තානාන්තර, නිලතල ආදී විවිධ කැපී පෙනෙන ස්වභාවයන් පිළිබඳ මුලා වූ අධිමානයකින් මත්ව, මමත්වය ගොඩනැගීමේ මනෝ රාජ්‍ය මවමින්, නිෂ්ඵල උත්සාහයක යෙදී බලාපොරොත්තු කඩවන විට අසහනකාරීව තැවෙමින්, යලි යලිත් එබඳු තැනක් ගොඩනගා ගන්න නිරර්ථක උත්සාහයක යෙදී සිටින පිරිස් අදත් සමාජයේ ඕනෑ තරම් ඉන්නවා. ඒ වගේම ඒ සියල්ල කඩවී බලාපොරොත්තු සුන් වී ගොස්, පීඩිත බවේ අන්තයට පැමිණ, මනස විකෘති කරගෙන එකී බලාපොරොත්තු සුන්වී අනාථ වීමට හේතුව, තම මවුපිය සහෝදර සහෝදරියන් ඥාතින් ඇතුලු හිතවත්ව කටයුතු කළ සියල්ලන්ම තම හිතවතුන් නොව හතුරන් යැයි බැසගත් මුලා තීරණයෙන්, ඒ සියල්ලන්ගෙන්ම පලිගන්න, මරා දමන්න තරම් විකෘති මානසික තත්වයක සිටින උදවියත් අද සමාජයේ ඕනෑ තරම් ඉන්න බව දිනපතා අහන්න දකින්න ලැබෙන සාහසික (සහායට අසි ගත් හෙවත් කඩු කිණිසි ආදිය යොදාගත්) අපරාධවලින් හෙළිදරව් වෙනවා.

අනිච්ච වූ, දුක්ඛ වූ, අනත්ත වූ ලෝකයේ යථා ස්වභාවය තේරුම් නොගෙන පංචකාම ආස්වාදයන් පසුපස පන්න පන්නා හඹා යෑමෙන් ඇතිවන මෙවැනි විකෘතිතාවයන්ට පූර්ණ වූ නිසි ප්‍රතිකර්ම බුදු දහමෙන් හැර වෙනත් ක්‍රමෝපායන්ගෙන් ලබාගත නොහැකි බව තේරුම් ගන්න තාක් සමාජය මෙවැනි මානසික රෝගීන්ගෙන් අඩු වෙන්නෙ නෑ. වෙනත් ප්‍රතිකර්මයන්ගෙන් ලබා ගන්න පුළුවන් වෙන්නෙ තාවකාලික විසඳුම් පමණයි. මොකද මේ ලෝකයේ අනිච්ච, දුක්ඛ, අනත්ත ස්වභාවයන් විග්‍රහ වෙන්නේ බුදු දහමේ පමණයි. වෙනත් ලෝකායතන විද්‍යාවන්ගෙන් ලෝකයේ යථා ස්වභාවය විද්‍යමාන වීමක් වෙන්නෙ නෑ.

අද ලෝකයේ බොහෝ තැන්වල මානසික රෝගීන් පුනරුත්තාපනය කිරීමෙන්, ලෝකයේ ස්වභාවය යම් පමණකට හෝ ලෞකික වශයෙන් වටහා දෙන්න උත්සාහ කළත් ඒක එතරම් සාර්ථක වෙන්නෙ නෑ. මොකද ලෝකයේ යථා ස්වභාවය ඇති හැටියෙන්ම වටහා දෙන සුද්ධ වූ ධර්මයක් පැවතුනොත් තමයි ඒ ධර්මය අහනකොට හේතු වාසනා ඇති අයට ලෝකයේ යථා ස්වභාවය වටහාගෙන, මේ වගේ මානසික ඌනතාවයන්ගෙන් මිදෙන්න පුළුවන් වෙන්නෙ.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

## රක්තවාත තෙල සම්බන්ධයෙන් .....

පසුගිය කලාප දෙකෙන් විස්තර කළ රක්තවාත තෙල හිදීමේදී එහි ශුද්ධ තෙල හිඳින අවසාන අවස්ථාවේදී පදම ගැනීම සඳහා ලුණු කැට 6 ක් ද කුඩු කර දැමීම වැදගත්. දැනටමත් තෙල හිඳ ගෙන ඇත්නම් එහි පළමු ශුද්ධ තෙලට කුඩු කළ ලුණු කැට 4 ක්ද, දෙවන තෙලත් හිඳගෙන ඇත්නම් එයට කුඩු කළ ලුණු කැට 2 ක් ද දමන්න.

## දස දිසා බන්ධන පිරිත සම්බන්ධව වැඩිදුර පැහැදිලි කිරීම් ........

පසුගිය කලාපයේ පළවූ දස දිසා බන්ධන පිරිතේ යම් යම් කොටස්, පිරිත් පොත්වල තියෙන භාෂා රීතීන්ටත් ගැලපෙන අයුරින් පහත ආකාරයටත් භාවිතා වෙනවා. ඒ අනුව,

දේවතා හීච - දේවතාහි ච ලෙසත්, පච්ඡිමේව - පච්ඡිමේ ච ලෙසත්, ජාතා සබ්බේ විනස්සන්තු උපද්දව අසේසතෝ - ජාතා උපද්දවා සබ්බේ විනස්සන්තු අසේසතෝ ලෙසත් භාවිතා කරන්න පුළුවන්.

# විවිධ සත්ත්ව කොට්ඨාශවලට විවිධ මට්ටම්වලින් පිහිටන දිවැස් දිව කන් ......

දිවැස්, දිව කන් පිළිබඳව දැන ගත යුතු කාරණා කිහිපයක් තියෙනවා. මේක අමුතු විශේෂ දෙයක් ලෙස පෙනුනත් ඒ ඒ ශරීර ස්වභාවයන්ගෙන් අති සියුම් ශරීර ස්වභාව ගත්තම, ඒ ශරීර ස්වභාවයට යමක් ඇහෙන, පෙනෙන ක්‍රමවේදයක් තියෙනවා. මනුස්ස වර්ගයාට පිහිටන ඝනීභවනය වූ මස් ලේ කයක් සහිත, ඇහෙන පෙනෙන ක්‍රමවේදය එකක්. ඒකෙන් බලන්න බාහිර ආලෝකය මාධ්‍ය කරගන්නවා. මස් ලේ ඇහැට බාහිර ආලෝකය මාධ්‍ය වෙනවා. ඒ වගේම මස් ලේ කනට බාහිර වායුව මාධ්‍ය කර ගෙන, බාහිර වායු කම්පනය අනුව යමෙක් කියන දෙයක් ඇහෙනවා. ඒ තමයි මස් ලේ කයින් ඇස, කන දෙක ක්‍රියාත්මක වන මාධ්‍ය දෙක.







දිව, නාසය, ශරීරය ආදී ඉන්ද්‍රියන් ක්‍රියාත්මක වෙන්නෙත් මේ ආකාර-යෙන්මයි. හැබැයි සූක්ෂම කායික සත්වයින්ට ඊට වඩා හැකියාවක් තියෙනවා. ඒ කයෙන් ලබන මාධ්‍යය වෙනම ක්‍රමවේදයක්. ඒ කියන්නෙ කතා කරන මාධ්‍යය එකක්, බලන මාධ්‍යය තව එකක්. මනුස්සයා බලන, කතා කරන මාධ්‍යයන්ට වඩා ඒක වෙනස්. අදහස් පතුරුවන කොට ඒ අදහස වැටහෙනවා. ඒකට විශේෂ භාෂාවක් ඕන වෙන්නෙ නෑ. **මොන යම් හෝ භාෂාවක් කතා කරන කෙනෙක් යම් අදහසක් හිතට අරගන්න කොට ඒ අදහස චිත්ත කිරණ විදියට සංඥාවක් වශයෙන් විහිදෙනවා. ඒ අදහස යොමු කරන කෙනාටත් වැටහෙනවා.** ඒ විදියට කතා කරන මාධ්‍යයට නවීන විද්‍යාවේ කියන්නෙ ටෙලිපති කියල. ගුප්ත ලෝකයේ කතාවලට මෙන්න මේ ආකාරයේ ක්‍රමවේදයක් තමයි තියෙන්නේ.

පෙනීමටත් මේ ආකාරයෙන්ම, අපි දකින ක්‍රමයට වඩා වෙනස් වූ ක්‍රමයක් තියෙනවා. මේ පෙනෙන ක්‍රමවේදය හැමෝටම සමාන වූ දෙයක් නෙවෙයි. දිවැස් ඇති, ධ්‍යාන ඇති, සෘද්ධි බල ඇති, අභිඥා බල ඇති අය ඒ ධ්‍යාන අභිඥා බලයෙන්, ධ්‍යාන සෘද්ධි කියල දෙයක් ලබනවා. (මනුස්සයො වශයෙන් ඉන්න අයත් ධ්‍යාන අභිඥා ලබනවා) ඒ විදියට ඒ ධ්‍යාන සෘද්ධි ලබපු අයට මස් ලේ කය පැත්තක තියෙද්දි, අති සූක්ෂම කයක් නිර්මාණය කර ගෙන පවතින කයෙන් පිටවෙලා යන්නත් හැකියාව ලැබෙනවා. පවතින කය තියෙද්දිම ඒකට සම්බන්ධ නොවී ඒ අතර කර්මජ රැහැනක (Silver Code) සම්බන්ධය ඇතිව රැඳීමටත් හැකියාවක් ලැබෙනවා. එතකොට බලන්න, අහන්න ආදී කටයුතුවලට සූක්ෂම කායික මාධ්‍යය ඒ අයට ලැබෙනවා. එතකොටත් දිවැස, දිව කන පහල වෙනවා වගේම සූක්ෂම ධ්‍යාන ලාභී බලයෙන් සූක්ෂම කායිකත්වය මහා බලවත්ව පහළ වෙනවා. ඒ නිසා මේ පෙනීමේ බලය බල සම්පන්නයි. බොහෝ ඈත තියෙන අති සූක්ෂම දේවල් බැලීමට පවා හැකියාව ලැබෙනවා. අතීත සිදුවීම් සිහි කරනකොට, මේ මොහොතේ වෙනවා වගේ දැකීමේ හැකියා-වක් ලැබෙනවා. පූර්වේනිවාසා-නුස්සති ඥානය, චුතූපපාතී ඥානය ආදී ඥාන පහළ වෙන්නෙත්, චතුර්ථත් ධ්‍යානය පාදක කරගත් අභිඥාපාදක දැහැන කියල කියන අභිඥා තත්ත්වයට පත්වෙන්නෙත් ඒ ධ්‍යානයේ ඉඳලා. මේකට ධ්‍යාන සෘද්ධි කියල කියනවා. මේක දෙවියන්ටත් නොපවතින මහා දිවැස් බලයක්. සමහර විට ධ්‍යාන ලබාගෙන උපදින රූපාවචර අරූපාවචර බ්‍රහ්මයි-න්ටත් තියෙන්න පුළුවන්.

ඒ වගේම ආර්ය සෘද්ධි කියල තවත් සෘද්ධි විශේෂයක් තියෙනවා. මේ ආර්ය සෘද්ධිවලටත් ධ්‍යාන ලබන කොට විශේෂ ශක්තියක් පහළ වෙනවා. ආර්ය උත්තමයන්ට පහළ වන ශක්තිය ප්‍රමාණයක් සීමාවක් නෑ. සමහර විට ධ්‍යාන ලාභියෙක් ධ්‍යාන සෘද්ධි බලයෙන් පෙර වූ අතීතය බලන කොට අන්තඃකල්ප 40 කියන සීමිත කාලයකට එහා බලන්න හැකියාවක් නෑ. නමුත් ආර්ය උත්තමයෙක් ඒ ධ්‍යාන ලැබුවොත් මහා කල්ප දහස් ගණන් වූ අති විශාල කාලයක් ඈතට බලන්න පුළුවන් හැකියාවක් ලැබෙනවා. ඒ නිසා ආර්ය සෘද්ධි ලෞකික සෘද්ධිවලට සම කරන්න බෑ.

මේ ආර්ය සෘද්ධි, ධ්‍යාන සෘද්ධි වගේම දෙවියන්ට පවතින්නා වූ පුණ්‍ය සෘද්ධි නම් වූ සෘද්ධි විශේෂයක් තියෙනවා. කාම ලෝකයේ කාමාවචර දෙවියන්ට තමන් කරන ලද පුණ්‍ය බලය අනුව අහන්න, දකින්න පුළුවන් ක්‍රමවේදයක් සැකසෙනවා. විවිධ පුණ්‍ය ශක්තීන් මත නොයෙක් දේ මැවීමේ හැකියාවන්, නොයෙක් දේ කිරීමේ හැකියාවන් ☞

ලැබෙනවා. සමහර විට කලාතුරකින් මේ පුණ්‍ය සෘද්ධි මනුස්සයින්ටත් පහළ වීමේ හැකියාවක් තියෙනවා. ඒ කියන්නෙ සසරේ කරපු පිනක් මතුවෙලා ඵල දීමක් වශයෙන් එහෙමත් නැත්නම් සසර කරපු පුණ්‍ය විපාකයක් ප්‍රගුණ කරල ලැබෙන්නත් පුළුවන්. මේ පුණ්‍ය සෘද්ධි නිසා ධ්‍යාන නැතුවම යම් යම් දේවල් කියන්න කරන්න හැකියාව ලැබෙනවා. පුණ්‍ය සෘද්ධි මනුස්සයන්ට ලැබුණම සමහර උදවිය ඒකෙන් මානයක් ඇති කරගන්නවා. නමුත් භූතාවේශයක් ඇඟට ආවට පස්සෙත් ඔය විදියට කියන්න පුළුවන් හැකියාවක් ලැබෙනවා. එතකොට ඒක පුණ්‍ය සෘද්ධි කියල රැවටෙන්නත් පුළුවන්.

සතර අපාගත සත්වයින්ට තියෙන්නේ කර්ම විපාකජ සෘද්ධි (කර්ම විපාකයෙන් ජනිත වන) කියල කියන සෘද්ධි විශේෂයක්. කර්ම විපාකයක් විඳින කොට, තමන් කරපු දේකට තමයි මේ අපරාධය සිද්ධ වුනේ කියන කාරණය ඒ මිනිස්සුන්ට අමතක වෙනවා. නමුත් කර්ම විපාකයක් වශයෙන් සමහර අයට ඒ බව දැනෙන්න, පෙනෙන්න පටන් ගන්නවා. තමන් කරන ලද මෙන්න මේ පාපය නිසා තමයි මෙහෙම වෙන්නෙ කියන කාරණය දැනෙන තේරෙන, කර්ම විපාකයෙන් හටගන්නා සෘද්ධියක් (සමහර සතර අපාගත සත්ත්වයින්ට) තියෙනවා. ඒක දැක දැක විඳවන, දැන දැන විඳවන, පෙනි පෙනී විඳවන ස්වභාවයක් තියෙනවා. ඒ වගේම ජාති ස්මරණ ඥාණය ලැබුණත් මේ විදියට පෙනෙන දැනෙන ස්වභාවයක් තියෙනවා.

අනුන්ට කරදර කරපු අය විවිධ ප්‍රේත අත්බැව් ලබල ඒ කර්ම විපාකයෙන් විවිධාකාර කරදරවලට ගෝචර වෙලා මේ විදියට පෙනෙන්න පටන් ගන්නවා. ''අහවල් උත්තමයට මම මෙන්න මේ ආකාරයේ කරදර උපද්‍රව සිද්ධ කළා. ඒ නිසා අද මම කන්න නැතුව, බොන්න නැතුව, අඳින්න වස්ත්‍ර නැතුව ...... ආදී නානාප්‍රකාර දුක් ගැහැට විඳවනවා. අද මට ඒ දේවල් පෙනි පෙනී ඵල දෙනවා.'' මේ විදියට දැන දැන, පෙනි පෙනී කල්ප ගණන් දුක් විපාක විඳවන්න වෙන අවස්ථාත් තියෙනවා. භූතයින්ට, ප්‍රේතයින්ට මේ වගේ දේවල් දැනෙන්න හැඟෙන්න ශක්තිය තියෙන්නෙත් මේ කර්ම විපාක සෘද්ධිය නිසා. සමහර විට යමෙකු කරන ලද අවැඩක්, අසාධාරණයක් මුල් කර ගෙන තමන්ට කරපු දේට තවත් යමක් කරන්න හිතිල පළිගැනීමේ චේතනාවන් පවා පහළ වෙන්න පුළුවන්. නමුත් හේතු සාධක සහිත සම්මතයක් මේ ලෝකයේ තියෙනවා.

උදාහරණ විදියට දෙමාපියන් දහඩිය මහන්සියෙන් හරි හම්බ කරල, දුක් විඳල ළමයින්ව පෝෂණය කරල, උස් මහත් කරල, අවශ්‍ය දැනුම ලබා දීල, දේපොළ බෙදල දීල ....... ආදී හැම දේම කළාට පස්සෙත්, ඒ දෙමාපියන් දුන්න දේවල් කිසිම අගයක් නැතිව නාස්ති කරල, දෙමාපියන්ට ලෙඩක් දුකක් හැදුනට පස්සෙවත් හොයන්නෙ බලන්නෙ නැතිව, දෙමාපියන්ට කරදර කරන අය ඉන්නවා. දෙමාපියන්ට කරදරයක් දුකක් වෙච්ච වෙලාවකත් ඒ විදියට කරදර කරන දරුවො ඉන්නවා. මෙහෙම අවස්ථාවක අර දෙමාපියනුත් පෘතජ්ජන නිසා ''අපි මුන්ට මෙච්චර කළා, මෙහෙම සැලකුවා, නොකා නොබී ඉඳල කන්න දුන්නා, මෙහෙම කරලත් අපිට අද කරදර කරනවා. මුන් මහා අසාධාරණයක් අපිට කරන්නේ....'' මේ ආදී වශයෙන් මරණාසන්න මොහොතේ හිතුවොත් එයින් දූෂ්‍ය හිතක් පහළ වෙන්න පුළුවන්. ඉන් පසු කර්ම විපාක වශයෙන් බල ලැබිල යක්‍ෂ, ප්‍රේත ආදී අත්බැව්වල ඉපදිලා නොයෙක් කරදර කිරීම් සිද්ධ කරන්නත් හැකියාවක් ලැබෙනවා. ''මගෙන්ම කාල බීල උස මහත් වෙලා අන්තිමට තොපි මට මෙහෙම කළා. කරදර දුන්නා, වස්තුව නාස්ති කළා. ඒ නිසා තොපිට දෙන්නම් වැඩේ ........'' මේ ආදී වශයෙන් හිතල කියල ඒ අයට ලෙඩ රෝග හදවනවා, මහා බලවත් වූ කරදර කරනවා. ඒ වගේම සමහර අමනුස්සයෝ කර්ම ශක්තියෙන්ම මහා බලවත් වෙනවා. ''මට වරම් ලැබුණා, වෙසමුණි වරම ලැබුණා, උඹලට පුළුවන් දෙයක් කරපියව්, මම යන්නෙ නෑ ........'' මේ ආදී වශයෙන් කියන අමනුස්සයොත් ඉන්නවා.''

මේ විදියට විවිධාකාර වූ සෘද්ධි බල හටගන්නා ක්‍රමවේදයන් තියෙනවා. එක් එක් සත්වයාගේ කර්ම ශක්තිය අනුව, ඊට අනුරූපීව තමයි මේ සෘද්ධි විශේෂ පිහිටන්නේ. දෙවියන්ටත්, බ්‍රහ්මයින්ටත්, මනුස්සයින්ටත්, සතර අපාගත සත්වයින්ටත් මේ විදියට විවිධ වූ සෘද්ධි බල පහළ වෙන්න පුළුවන්.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ප්‍රසාද් ද සිල්වා**
**පරිපාලන නිලධාරි**
**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 19 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** ♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ ඩී.සී.ආර්. ඇක්සස් මුද්‍රණාලයේ චන්ද්‍රිම පෙරේරා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ඩබ්.ඒ. තිළිණවතී මහත්මිය - කඩවත ♦ ෆික්රි ස්මයිල් මහතා - ගොතටුව ♦ ප්‍රසන්න ද සිල්වා මහතා - දෙල්ගොඩ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** ♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 16,000/- ♦ ධම්මික නාවින්න මහතා - මාකොළ - රු. 15,000/- ♦ කරුණා ධර්මසේන මහත්මිය - හෝමාගම - රු. 10,000/- ♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - - රු. 10,000/- ♦ පී. සංජය රණවීර මහතා ඇතුළු පවුලේ සැම - මහරගම - රු. 8,000/- ♦ බිනග සමාධිත් සිල්වත්ගේ පුතා ඇතුළු පවුලේ සැම - බත්තරමුල්ල - රු. 6,000/- ♦ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු. 5,000/- ♦ චරිත් ඉන්දික මහතා - ඉතාලිය - රු. 5,000/- ♦ නෙල්කා දාබරේ මහතා - කොල්ලුපිටිය - රු. 5,000/- ♦ තුසිත නාකන්දල මහතා - ගල්කිස්ස - රු. 5,000/- ♦ ඔස්ටින් ප්‍රනාන්දු මහතා සහ සිසිර සිරිවර්ධන මහතා -පොල්ගහවෙල - රු. 3,000/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය - රු.2,500/- ♦ බිනාදි යොහංසා දියණිය ඇතුළු පවුලේ සැම - පානදුර - රු.2,500/- ♦ කේ. උපාලි මහතා සහ ආර්. ස්වර්ණලතා මහත්මිය - දික්වැල්ල - රු.2,000/- ♦ ජී.පී ගර්ලි මහත්මිය - වලස්මුල්ල - රු. 2,000/- ♦ එන්. වී.එස් බණ්ඩාර මහතා - වීරකැටිය - රු. 2,000/- ♦ කෝෂලා සිරිවර්ධන මෙනෙවිය - ගාල්ල - රු. 2,000/- ♦ විජිතා ජයසුන්දර මෙනෙවිය - කුරුණෑගල - රු.2,000/- ♦ රේණුකා ගුණරත්න මහත්මිය සහ චතුරිකා ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 2,000/-

♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු.1,500/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ♦ ප්‍රසන්න සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ අසංක ප්‍රේමතිලක මහතා - මරඳගහමුල්ල - රු. 1,000/- ♦ අනුරුද්ධ පෙරේරා මහතා - කිරුලපන - රු. 1,000/- ♦ අසංක බුද්ධික මහතා - අළුබෝමුල්ල - රු. 1,000/-♦ අසේල පද්මකුමාර මහතා - කටාර් - රු. 1,000/-♦ ඩබ්. ප්‍රේමචන්ද්‍ර මහතා ඇතුළු පවුලේ සැම - හෝමාගම - රු. 1,000/- ♦ තිලකා ජයවික්‍රම මහත්මිය ඇතුළු පවුලේ සැම - කඩවත - රු. 1,000/- ♦ කේ. රත්නා චාන්දනී මහත්මිය - ඉතාලිය - රු. 1,000/- ♦ ඉන්ද්‍රානි විශාඛා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ♦ චින්තක කරුණාරත්න මහතා - පනාගොඩ - රු. 1,000/- ♦ දර්ශි දිසානායක මෙනෙවිය - බිබිල - රු. 1,000/-♦ අනුර ශාන්ත මහතා - මූණගම - රු. 1,000/- ♦ රොෂාන් මාලක මහතා හා තිලකසිරි ජයරත්න මහතා - පස්යාල - රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු. 1,000/- ♦ ශමීන් බණ්ඩාර මහතා - උඩුබැද්දාව - රු. 1,000/- ♦ නිවන්ති වීරතුංග මහත්මිය හා දැඩිමුනි නිසල් කුමාර මහතා - අම්බලන්ගොඩ - රු. 1,000/- ♦ එස්. ජී. ඒ. සිසිලිනා හාමිනේ උපාසිකා මාතාව - මත්තේගොඩ - රු. 1,000/- ♦ රමලි රණසිංහ මහත්මිය - පන්නිපිටිය - රු. 1,000/- ♦ ඩබ්.ඒ.එල්.කේ. සමරසිංහ මහතා - දෙහිඅත්තකණ්ඩිය - රු. 1,000/- ♦ ජේ.කේ.එස්. සෝමරත්න මහත්මිය - දඹටුව - රු. 1,000/- ♦ නීෂා ඇන්ඩෘ මහත්මිය - රු. 1,000/- ♦ ප්‍රණීෂා නයෝමි චන්ද්‍රසිරි මහත්මිය - රු. 1,000/- ♦ රංජිත් වික්‍රමසිංහ මහතා - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා - මහරගම, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, සුජාතා දසනායක මහත්මිය - දෙහිවල, චන්දිම ගුණදාස මහතා - මොරටුව, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල, යමුනා උඩුමලගල මහත්මිය - පිලියන්දල, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැලණිය, ඉසුරු සම්පත් මහතා - කළුතර, රු. 6,900/- ♦ වෙනත් පින්වතුන්ගෙන් ලද මුදල් පරිත්‍යාග - 2763/- ♦ එකතු වූ සියළු මුදල් පරිත්‍යාග රු. 139,163/- ♦ පළමු පිටපත් 7000 සඳහා මුද්‍රණ වියදම රු. 154,000/- ♦ අනෙකුත් වියදම් රු.12,575/- ♦ සම්පූර්ණ වියදම රු. 166,710/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිග මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදි.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වර්ගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා!**

**එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුත්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.




**සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා පැවැත්වෙන සදහම් වැඩසටහන් මාලාව සජීවීව විකාශනය කෙරෙන අන්තර්ජාල ගුවන් විදුලි සේවාවට සවන්දීම සඳහා www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ ''දම් සභා ගුවන් හඬ''ට පිවිසෙන්න.**

# සංසාරේ හැටි තමයි...

කොහේ ඉපදුණත් සසරේ විඳින දුක
ඉහේ සිට පතුල දක්වා ගෙනෙති නෙක
වැහේ සිත් ලොවේ මායා සැපත දැක
නැහේ කප් ගණන් මේ සැපකටය ටික

පනහක හැටක ආයුස ගෙන දිවි ගෙවන
අණසක පතුරවා හිඳිනට කැස කවන
දිනයක මැරෙන බව නොදකින සත දවන
හෙණයක විලස එයි දුක් ගිනි නිම නොවන

කයේ සවිය නැති වන විට එන දාහේ
තියේ මියෙන කල් නිති ඕජස වැහේ
ළයේ තියෙන දුක කිසිවෙකුටත් නෑහේ
නොයේ නිදහසක් තිබෙනා තෙක් මෝහේ

අට ලෝ දහම එන විට ලෝ සත වෙතට
වට කර හඬයි සැප පමණක් හිමි ලෙසට
බැට කෑ තරම දැනුනොත් නැණසින් සිතට
හෙට නොව අදද ලද හැක නිවනක් සතට

තැනකින් චුතව තව තැනකට පැන දුවන
සටනින් නොලැබ ජය යන තැන දුක දෙවන
අතරින් පහර සැප ලෙස පෙනුනත් මවන
එතෙකින් ගමන නොනිමෙයි එන තෙක් නිවන

ගත සවි බලය නැති වන තෙක් තව නො ඉඳ
සිතකට ගතොත් තතු තමනට වෙයි එ සොඳ
සෙත සලසවන බණ පදයක රසය විඳ
දත යුතු සසර බියකරු බව දහමෙ ඉඳ

පබැඳුම - නිශංග චන්දන සිරිවර්ධන











# ඇරුත් බර වෙසඟක්...



තුන් ලොව එළිය කළ මුනිඳුන් ලොවට දෙසූ
සුන් කළ කෙලෙස් මළ දම් සවනතට ඇසූ
උන් නෙක සතට සුව දුන් මොක් දහම ඔසූ
පින් බර වෙසඟ රැව් දෙයි සිහ නදය මුසූ

බැති ගී තොරණ දන් සැල් මැද නැගෙන පින
නිති ලෙස ඇදේ මතු නිවනට සහය දෙන
ඇති නැති බේද නොමැතිව සිත් පැහැද ගෙන
සිහිවිලි නැගේවා අහනට මුනිඳු බණ

වීදි දිගේ දැල්වෙන සුපහන් එළිය
සැදී ඝන අඳුර දුරු කරමින් බැලිය
පැදී වෙසක් සඳ ගෙන එන සිලි සිලිය
බෝධි වඩන්නට හිත දෙයි නැත මැලිය

පුරවා බැති මලින් පුද දෙන මුනිඳු ගුණේ
හරවා යවයි කෙලෙසුන් මළ එසැන කිනේ
කරවා හැඩතලින් විසිතුරු සියලු තැණේ
මරුවා පැරදූ මුනි දිවමන් ලෙසට පෙණේ

තෙමඟුල මහා මුනිඳුගෙ ලොව කරන ගරු
සමරන බැතින් සත මොහඳුර කරන දුරු
නමදින ගුණ සිතින් භව දුක නිවෙන තුරු
නොමවනු එ පින් බලයෙන් වසඟයට මරු

කරන මෙ පින්කම් බුදු ගුණයෙන් නාවා
සරන තෙක් සසර යළි යළි සිහි වේවා
මරණයෙන් මිදෙන්නට බුදු හිමි ගාවා
පුරන මෙ පින් මතු නිවනම ගෙන දේවා

පබැඳුම - නිහිඳ චන්දන සිරිවර්ධන

නිහිඳ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී